# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# Annual Report
# 2016







ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
**NATIONAL LOTTERIES BOARD**

www.nlb.lk

# පටුන


## 01 දළ විශ්ලේෂණය

- සංස්ථාමය තොරතුරු හා නියාමන ප්‍රතිපත්තීන් 04
- නිෂ්පාදන විෂය ධාරාව 13

## 02 විධායක වාර්තා

- සභාපතිනියගේ පණිවිඩය 19
- ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ වාර්තාව 23
- විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 25

## 03 මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු

- විගණකාධිපති වාර්තාව 28
- ආදායම් ප්‍රකාශය 56
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 56
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 57
- අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය 58
- ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය 59
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 60

## 04 මෙහෙයුම් හා මූල්‍ය විශ්ලේෂණය

- මූල්‍යමය ප්‍රමුඛතාවයන් 88
- සමස්ත කාර්යසාධනය 89
- නිෂ්පාදන කාර්යසාධනය 90
- දස වසරක මෙහෙයුම් සමාලෝචනය 93

# 01 . දළ විශ්ලේෂණය





## සංස්ථාමය තොරතුරු

### ආයතනයේ නම

ජාතික ලොතරැයි මණ්ඩලය

### නෛතික තත්ත්වය

ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී. 1997 වසරේදි ඉහත පනත යටතේ ඇති සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත සහ 1998 වසරේදි 1998 අංක 22 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

### පිහිටුවන ලද වර්ෂය

1963

### ගිණුම් වර්ෂය අවසන් වනුයේ

දෙසැම්බර් 31

### ලියාපදිංචි කාර්යාලය

**ලිපිනය** : අංක 234/ 2, ගාලුපාර, කොළඹ 03.

**දුරකථන** : 2470662, 2470663, 4607000,

**ෆැක්ස්** : 2329576, 2421897, 2326528, 2433631, 2470661,

**විද්‍යුත් තැපෑල** : nlbgen@sltnet.lk

**වෙබ් අඩවිය** : www.nlb.lk

### විගණක

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල් දූව පාර,
බත්තරමුල්ල.

### බැංකුකරු

මහජන බැංකුව

# නියාමන ප්‍රතිපත්තින්



## දර්ශනය

සමස්ත දිවයිනේ සමාජ , ආර්ථික , සංවර්ධනය උදෙසා සෑම ජන කොටසකගේම දායකත්වය තුලින් රාජ්‍ය ආයෝජන නිර්මාණය කිරීමේ ප්‍රමුඛයා

## මෙහෙවර

සමාජ වගකීම පෙරදැරිව , පාරිභෝගික විශ්වාසය දිනා ගනිමින් , ඔවුන්ගේ ජයග්‍රහණයන් තහවුරු කිරීම උදෙසා නවීන තාක්ෂණය භාවිතා කරගනිමින් , නවතාවයෙන් යුතු ලොතරැයි හදුන්වාදෙමින් , ආශ්චර්යමත් දේශයක් උදෙසා දක්ෂ කැපවු කාර්ය මණ්ඩලයක් සමඟ ගමන් කරන්නාවු අභිමානවත් ආයතනයක්.

## සංවිධාන පරමාර්ථ

✱ රජයේ සංවර්ධන අවශ්‍යතා සදහා අරමුදල් ඉපයීම

★ රජයට ආදායම් උත්පාදනය කරන ආයතන අතරින් ප්‍රධානතම ආයතනය බවට පත්වීම

★ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම

★ රටේ සේවා නියුක්තියට දායකත්වය සැපයීම

## මණ්ඩලීය අරමුණු

★ පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුළින් රජයට කරන දායකත්වය වැඩි කිරීම

★ වෙළඳපල නායකත්ව තත්ත්වය පවත්වාගෙන යාම

★ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම

★ ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

★ සේවක මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම

★ පාරිභෝගික සංතුෂ්ඨිය වැඩි කිරීම

- ★ වගකියන සහ වගකිවයුතු ආයතනයක්
- ★ අවංක සහ විනිවිදභාවයෙන් යුතු ආයතනයක්
- ★ කණ්ඩායම් පරිශ්‍රමය හා නිපුණත්වය පිළිබඳ විශ්වාසය
- ★ නවීන තාක්ෂණය හා වෙනස්වීමට ඇති අභිරුචිය
- ★ ඉහළම පාරිභෝගික සේවාවක් පිළිබඳ විශ්වාසය



# සභාපතිනිය සහ අධ්‍යක්ෂ මණ්ඩලය



නිරීක්ෂක/
භාණ්ඩාගාර නියෝජිත
ඒ.එම්.පී. එම්. බී.
අතපත්තු මහතා

ක්‍රියාකාරී අධ්‍යක්ෂ
මොහමඩ් කමිල් හසන්
මහතා

සභාපතිනිය
ශ්‍යාමිලා පෙරේරා
මහත්මිය

අධ්‍යක්ෂ
ගාමිණී සපරමාදු
මහතා

අධ්‍යක්ෂ
චාමින්ද්‍ර ද සිල්වා
මහතා



**ඒ.එච්. සුනිල් ගුණවර්ධන මහතා**
B.A.Econ. (Colombo)
PG Dip. Econ. Dev(Colombo)
MA Econ. (Colombo)
S.L. A. S. (Class I)
සාමාන්‍යාධිකාරි



**ප්‍රභාත් සන්ධ්‍ය තේජ මහතා**
B.Sc. (Peradeniya)
අතිරේක සාමාන්‍යාධිකාරි



**හර්ෂ බණ්ඩාර මහතා**
FCMA (UK), FCCA (UK),
MBA (USA), AMSLIM,
FCMA (SL), FCPM,
FCAA, CGMA.
ප්‍රධාන මූල්‍ය නිලධාරි



**වී. සුන්දරේශ්වරන් මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(ආදායම් මූල්‍ය)
(අප්‍රේල් මස දක්වා)



**ගීතා පෙරේරා මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(මෙහෙයුම් මූල්‍ය)



**රෝහණ විජේවික්‍රම මහතා (FCA)**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(සාමූහික ව්‍යාපෘති මූල්‍ය)



**රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැපයුම්)
(සැප්තැම්බර් මස දක්වා)



**අසන්ත කල්‍යානන්ද මහතා**
B.Sc. (Peradeniya)
ප්‍රධාන අලෙවි නිලධාරි



**ශ්‍යාමිණි බාලසූරිය මිය**
Attorney-at- law,
Notary public &
commissioner- for oaths,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති) / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

## ගමනෙහි ඉතිහාසය

රටේ සෞඛ්‍ය සේවාවන් වඩාත් පුළුල් කිරීමට අවශ්‍ය මුදල් උපයා ගැනීමේ අරමුණින් රජය විසින් ශ්‍රී ලංකාව තුළ ලොතරැයි ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. 1949 වසරේදී එවකට පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් ලොතරැයි පැවැත්වීම පිළිබඳ අදහස රජයට ඉදිරිපත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1955 අංක 4 දරණ පනත යටතේ ආරෝග්‍යශාලා ලොතරැයි මණ්ඩලය ඇරඹිනි.

1960 ගණන්වලදී රජයට ශ්‍රී ලංකාව තුළ ලොතරැයි ආරම්භ කිරීමේ අභිප්‍රායයන් තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවය පැන නැගුනි. අරමුදල් සෞඛ්‍ය සේවාවන්වලට අමතරව විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කරමින් 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ රටේ සංවර්ධන කටයුතු සඳහා අරමුදල් උපයා ගැනීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී.

# ප්‍රධාන පියවරයන්

**පළමු දශකය (1963 - 1972)**

1963 - අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කිරීම.

1964 - ජාතික ලොතරැයි මණ්ඩලයේ පළමු දිනුම් ඇදීම.
- ටොරින්ටන් චතුරශ්‍රය (1964/02/20)

1965 - පළමුවරට බෙන්ස් මෝටර් රථයක් පිරිනැමීම.

1967 - පළමු ශාඛා කාර්යාලය රත්නපුරයෙහි ආරම්භ කිරීම.

1968 - ජාතික සම්පත ලොතරැයිය හඳුන්වා දීම.

1970 - ජාතික සම්පත ලොතරැයිය මහජන සම්පත ලෙසට පරිවර්තනය කිරීම. (1970/07/28)

**දෙවන දශකය (1973 - 1982)**

1975 - සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත අංක 111/1 දරණ ස්ථානයට ප්‍රධාන කාර්යාලය රැගෙන යාම.

1977 - ජාතික ලොතරැයියේ මිල ශත 50 - සිට රු. 1/- දක්වා වැඩි කිරීම.

**තුන්වන දශකය (1983 - 1992)**

1987 - සුපිරි ජාතික ලොතරැයිය හඳුන්වා දීම (1987/04/11)

1988 - මහජන සම්පත ලොතරැයියේ මිල රු. 1/- සිට රු. 8/- දක්වා වැඩි කිරීම.
- ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම (1988 සැප්තැම්බර්)
- මහජන සම්පත ලොතරැයියේ ප්‍රථම රූපවාහිනී දිනුම් ඇදීම (1988/05/10)

1989 - මහජන සම්පත ලොතරැයියේ මිල රු. 8/- සිට රු. 10/- දක්වා වැඩි කිරීම.

1992 - එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය ආරම්භ කිරීම.

**හතරවන දශකය (1993 - 2002 )**

1994 - වාසනා සම්පත ලොතරැයිය ආරම්භ කිරීම.

1995 - ගොවිසෙත ලොතරැයිය ආරම්භ කිරීම.

1996 - සමෘද්ධි ලොතරැයිය ආරම්භ කිරීම.

1997 - ශ්‍රම වාසනා ලොතරැයිය ආරම්භ කිරීම.
- සෙවණ ලොතරැයිය ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධ කිරීම.

1999 - සුපිරි වාසනා ලොතරැයිය ආරම්භ කිරීම.

2000 - ජයවිරු ලොතරැයිය ආරම්භ කිරීම.

## පස්වන දශකය (2003- 2012)

2004 - සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූවන්ට මූල්‍ය පහසුකම් සලසා දීම සඳහා සරණ ලොතරැයිය ආරම්භ කිරීම.

- ස්වේක සුභසාධනය සඳහා සුභසාධන හා සකසුරුවම් අරමුදල ආරම්භ කිරීම.

2005 - ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයෙන් (SLIM) සිදුකරන ලද ත්‍යාග ප්‍රදානෝත්සවයේ බැංකු හා මූල්‍ය සේවා අංශය යටතේ වඩාත් ජනප්‍රිය වෙළඳනාමය සඳහා වන සම්මානය මහජන සම්පත ලොතරැයිය සඳහා හිමිවීම.

2006 - ලොටෝ ලොතරැයිය අහෝසි කොට සුවසෙත ලොතරැයිය ආරම්භ කිරීම.

- ලොතරැයියක් සඳහා මෙතෙක් ගෙවන ලද ඉහලම සුපිරි ත්‍යාගය.
- මහජන සම්පතෙන් පිරිනැමීම (රු.මිලියන 61.3)

2007 - නව ගුවන් තොටුපල ලොතරැයිය ආරම්භ කිරීම.

- එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ මිල ඩොලර් 25 සිට 50 දක්වා වැඩිකිරීම.

2008 - දිනුම් අදින ලොතරැයිවල මිල රු. 10/- සිට රු.20 /-දක්වා වැඩි කිරීම. (2008/09/02)

2010 - ශ්‍රම වාසනා හා සුවසෙත ලොතරැයි දෙකම අහෝසි කර ජාතික සම්පත ලොතරැයිය ආරම්භ කිරීම.

- මහජන සම්පත ලොතරැයිය ඉරිදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.

2011 - ඉතිහාසයේ ප්‍රථම වතාවට රු. බිලියන 10 ක අලෙවි ඉලක්කය පසු කිරීම.

- බදාදා දිනුම් අදින ලද ජයවිරු ලොතරැයිය අහෝසි කර එදිනටත් සුපිරිවාසනා සම්පත ලොතරැයිය දිනුම් ඇදීම හඳුන්වාදීම.
- නව ගුවන්තොටුපල ලොතරැයිය පැවැත්වීම.
- සති තුනක් ඇතුලත රු. මිලියන 10 ට වඩා වැඩි සුපිරි ත්‍යාග 5 ක් පිරිනමන ලද අතර මින් 4ක් එක දිගට දින 4 කදී සිදුවීම.

2012 - සම්පත් රේඛා නමින් නව ලොතරැයියක් හඳුන්වා දීම.

- ගොවිසෙත ලොතරැයිය බ්‍රහස්පතින්දා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.
- වාසනා සම්පත ලොතරැයිය සදුදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.

## වර්තමාන දශකය (2013 -2022)

2013 - ගොවිසෙත ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු.මිලියන 10 සිට රු. මිලියන 40 දක්වා වැඩිකිරීම.

- සම්පත් රේඛා ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු.මිලියන 5 සිට රු.මිලියන 10 දක්වා වැඩිකිරීම.
- ජාතික ලොතරැයි මණ්ඩලයේ 50 වන සංවත්සරය වෙනුවෙන් මෙගා 50 නැමති ලොතරැයිය ආරම්භ කිරීම.

2014 - පවර් ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම.

2015 - අලෙවි සහායකයින් සඳහා දිවිසරණ රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

- නීරෝගා ලොතරැයිය ආරම්භ කිරීම (2015/07/25)
- එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ 31 වෙනි දිනුම් ඇදීම (2015/08/31 )
- එක් දිනක් තුලදී දිනුම් අදින ලොතරැයි 3ක් පැවැත්වීම ආරම්භ කිරීම (2015/09/01 සිට)
- ප්‍රථම වරට මහත්මා අලෙවි නියෝජිත සම්මාන උළෙල පැවැත්වීම (2015 දෙසැම්බර්)

2016 - බිලියන 20 අලෙවි ඉලක්කය සපුරාලීම.

- ඩොලර් ෆෝචූන් ලොතරැයිය ආරම්භ කිරීම (2016/03/30)
- පවර් ලොටෝ ලොතරැයිය අවලංගු කර මෙගා පවර් ලොතරැයිය හඳුන්වා දීම. (2016/05/11)
- සුපිරි දෙලක්ෂපති ලොතරැයිය ආරම්භ කිරීම (2016/05/27)
- ජංගම දුරකථන කෙටි පණිවිඩ(එස්. එම්. එස්.) මගින් ලොතරැයි අලෙවිය ආරම්භ කිරීම.
- ගංවතුරෙන් විපතට පත් ජනතාව සඳහා මනුසත් මෙහෙවර නමින් ලොතරැයියක් ආරම්භ කිරීම (2016/08/04)
- ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වොක්ෂෝල් වීදියෙහි පිහිටි ඉඩමෙහි මුල්ගල තැබීම. (2016/12/01)
- ජාතික ව්‍යාපාරය විශිෂ්ඨතා හා සම්මාන ප්‍රධානයේදී රාජ්‍ය ආයතන අංශය යටතේ දෙවන ස්ථානය (රිදී සම්මානය)හිමිකරගන්නා ලදි.

# දිනුම් අදින ලොතරැයි

## මහජන සම්පත



විස්තරය

ලොතරැයි වෙළඳපලෙහි පැරණිතම ලොතරැයිය වේ. ටිකට්පතෙහි මිල රු. 20/කි.

දිනුම් අදින දින

අඟහරුවාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, ඉරිදා

ත්‍යාග

රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්

රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්න්නා සුළු ත්‍යාග

දායකත්වය

පිරිවැටුමෙන් 16.5 % ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

## වාසනා සම්පත



විස්තරය

1994 වසරේ වෙළඳපළට හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු. 20/ කි.

දිනුම් අදින දින

සදුදා , බ්‍රහස්පතින්දා

ත්‍යාග

රු මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග මෙම ලොතරැයියේ අලෙවිය දුර්වල වීම නිසා 2016 ඔක්තෝම්බර් මස දී ත්‍යාග රටාවේ වෙනසක් සිදු කරන ලදි. මෙහිදී පහත සඳහන් පරිදි සුපිරි ත්‍යාග 03 ක්, රු. මිලියනයක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග හඳුන්වා දෙන ලදි.

ස්ටාර් සුපිරි ත්‍යාගය - රු. මිලියන 20 හෝ ඊට වැඩි

කලර් සුපිරි ත්‍යාගය - රු. මිලියන 2.5 හෝ ඊට වැඩි

ලග්න සුපිරි ත්‍යාගය - රු. මිලියන 2.5 හෝ ඊට වැඩි

දායකත්වය

අලෙවි පිරිවැටුමෙන් 16.5 % ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

## ගොවිසෙත



විස්තරය

කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් ගොවි භාරකාර අරමුදලට අරමුදල් උත්පාදනය සඳහා මණ්ඩලය විසින් මෙම ලොතරැයිය 1995 වසරේදි වෙළඳපළට හඳුන්වා දෙන ලදි. මෙම ලොතරැයියෙහි අලෙවිය වැඩිකර ගැනීමේ පරමාර්ථයෙන් 2013 නොවැම්බර් මස සුපිරි ත්‍යාගය රු.මිලියන 10 සිට රු. මිලියන 40 දක්වා වැඩිකරන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/ කි.

දිනුම් අදින දින

සදුදා, බදාදා, බ්‍රහස්පතින්දා, සෙනසුරාදා

ත්‍යාග

රු. මිලියන 40 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

දායකත්වය

පිරිවැටුමෙන් 10 % කෘෂිකර්ම අමාත්‍යාංශයට ගෙවනු ලැබේ.

## සුපිරි වාසනා




විස්තරය

මෙම ලොතරැයිය 1999 වසරේදී හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු. 20/කි.

දිනුම් අදින දින

බදාදා , සෙනසුරාදා

ත්‍යාග

රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

දායකත්වය

බදාදා දින දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10 % රණවිරු සේවා අධිකාරියට දෙනු ලබන අතර සෙනසුරාදා දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10 % ක්‍රීඩා හා සමාජ සේවා අමාත්‍යාංශවලට සමානව බෙදා දෙනු ලැබේ.

## ජාතික සම්පත




විස්තරය

සුවසෙත හා ශ්‍රම වාසනා ලොතරැයි දෙකම වෙනුවට 2010 වසරේදී මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු.20/ කි.

දිනුම් අදින දින

බදාදා , සෙනසුරාදා

ත්‍යාග

රු. මිලියන 5 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

දායකත්වය

බදාදා දින දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10 % සෞඛ්‍ය අමාත්‍යාංශයටද සෙනසුරාදා දින දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% කම්කරු අමාත්‍යාංශයටද බෙදා දෙනු ලැබේ.

## සම්පත් රේඛා




විස්තරය

2012 මාර්තු මස මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු.20/කි.

දිනුම් අදින දින

අඟහරුවාදා , සිකුරාදා, ඉරිදා

ත්‍යාග

රු මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

දායකත්වය

අලෙවි පිරිවැටුමෙන් 10 % ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

## නීරෝගා




විස්තරය

වකුගඩු රෝගයෙන් පීඩා විඳින ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් සහ උදෙසා 2015 ජූලි මස 25 දින මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු.20/ කි.

දිනුම් අදින දින

අඟහරුවාදා , සිකුරාදා , ඉරිදා

ත්‍යාග

රු. මිලියන 2.5 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

දායකත්වය

අලෙවි පිරිවැටුමෙන් 10 % ජාතික වකුගඩු අරමුදලට බැර කරනු ලැබේ.

## මෙගා පවර්




විස්තරය

මෙම ලොතරැයිය 2016 මැයි මස 11 වන දින ආරම්භ කරනලදි.ටිකට්පතක මිල රු. 20/= කි.

දිනුම් අදින දින

සඳුදා , බදාදා

ත්‍යාග

ප්‍රධාන ත්‍යාග තුනකින් සහ රු මිලියනයක ප්‍රථම ත්‍යාගයක් සහ සිත්ගන්නාසුළු ත්‍යාග.

මෙගා සුපිරි ත්‍යාගය - මිලියන 50 හෝ ඊට වැඩි
පවර් සුපිරි ත්‍යාගය - මිලියන 10 හෝ ඊට වැඩි
ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය - මිලියන 10 හෝ ඊට වැඩි

දායකත්වය

අලෙවි පිරිවැටුමෙන් 10%ක් ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.

## සුපිරි දෙලක්ෂපති




විස්තරය

මෙම ලොතරැයිය 2016 මැයි මස 27 වන දින ආරම්භ කරන ලදි. ටිකට්පතක මිල රු. 20/= කි.

දිනුම් අදින දින

සිකුරාදා

ත්‍යාග

රු. 200,000 ත්‍යාග

දායකත්වය

අලෙවි පිරිවැටුමෙන් 10%ක් ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.

## කලම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ




විස්තරය

සිවිල් ගුවන්සේවා අධිකාරියට අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩල විසින් 1992 වසරේ එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය හඳුන්වාදෙන ලදී. වර්තමානයේ එම ටිකට්පත ඇමෙරිකානු ඩොලර් 30කට හෝ ඊට සමාන පරිවර්තිත මුදල්වලට අලෙවි කරනු ලැබේ. දිනුම් ඇදීමට අදාල නියමිත ටිකට්පත් ප්‍රමාණය(වර්තමානයේදි ටිකට්පත් 15000) විකිණි අවසන් විමෙන් පසු දිනුම් ඇදීම සිදුකරනු ලැබේ.

ත්‍යාග

සුපිරි අති සුඛෝපභෝගි (Mercedes Benz)මෝටර්රථයක් පිරිනමනු ලැබේ.

දායකත්වය

ශුද්ධ ආදායම සිවිල් ගුවන්සේවා අධිකාරියට යොමු කරනු ලැබේ.

## ඩොලර් ෆෝචූන්




විස්තරය

මෙම ලොතරැයිය 2016/03/30 දින හඳුන්වාදෙන ලදි. සෑම ටිකට්පතක්ම දැනට පවතින ඇමෙරිකානු ඩොලර් 10ට හෝ ඊට සමාන පරිවර්තනය කළ හැකි ව්‍යවහාර මුදලට විකුණනු ලැබේ.

ත්‍යාග

ඇමෙරිකානු ඩොලර් 100,000

දායකත්වය

ශුද්ධ ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

## ක්ෂණික ලොතරැයි

### සෙවණ ලොතරැයි




විස්තරය

නිවාස ඉදිකිරීම සඳහා අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් 1985 වසරේදී ආරම්භ කරන ලදි. ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගත් ජනප්‍රිය ක්ෂණික ලොතරැයියකි. සෙවණ ලොතරැයිය වෙනම ආයතනයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදුකරන ලද අතර පසුව 1990 වසර අවසානයේදී ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධ කරන ලදි.

දායකත්වය

අලෙවි පිරිවැටුමෙන් 10 % නිවාස අමාත්‍යාංශයට යොමු කරනු ලැබේ.

## සමෘද්ධි

විස්තරය





සමෘද්ධි අධිකාරියට අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් 1996 වසරේදී මෙම ලොතරැයිය ආරම්භ කරන ලදී. මෙය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපලට හඳුන්වා දුන් පළමු ක්ෂණික ලොතරැයිය වේ. දිනුම් ලාභීන් නිශ්චය කිරීම සඳහා ජාත්‍යන්තරව පිලිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගෙන ඇත.

දායකත්වය

අලෙවි පිරිවැටුමෙන් 10 % සමෘද්ධි හා තරුණ කටයුතු අමාත්‍යාංශයට යොමු කරනු ලැබේ.



# 02 විධායක වාර්තා





2016 වසරට අදාළව ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාවට පණිවිඩයක් ලබාදෙන්නේ ඉමහත් සතුටිනි. එය ඉතිහාසයේ සිට එන ගමන්මගෙහි අලුත් මංපෙත් විවර කළ ජයග්‍රහනයන් සහ අති සාර්ථක ප්‍රතිඵලයන් අත්කරගත් වසරකි.

## සමස්ත කාර්යසාධනය

2016 වසර ආරම්භ වූයේ බලාපොරොත්තු රාශියක් පෙරදැරි කරගෙනයි.ව්‍යාපාර ක්ෂේත්‍රයේදී කාර්යසාධනය මැනීමේ මාපකය ලෙස සලකනු ලබන්නේ උපයාගත් ලාභයේ ප්‍රමාණයයි. අපි එය සඵල කරගැනීම සඳහා ගමන් කළෙමු. සමස්ත සාර්ථකත්වය අතුරින් ප්‍රධානතම සාර්ථකත්වය වූයේ අලෙවි පිරිවැටුම රු. බිලියන 20 ඉක්මවා යාමයි.

ජාතික ලොතරැයි මණ්ඩලය විසින් රු. මිලියන 20,170ක අලෙවි ආදායමක් ලබාගත් අතර එය පෙර වසරේ ළඟාකරගත් රු. බිලියන 17,394 සමඟ සසඳන විට රු. මිලියන 2,776 කින් එනම් පසුගිය වසරට වඩා 16% කින් අලෙවි පිරිවැටුම වැඩි වී ඇත. මේ හා සමානව වැඩිවීමක් 2015 වසරේදීත් ළඟාකරගන්නා ලදි.

2014 වසරේ සිට බලන විට රු. මිලියන 5,017 කින් (රු. බිලියන 5කින්) එනම් 2016 වසරේ අලෙවි පිරිවැටුමෙන් 1/4 ප්‍රමාණයකින් වැඩිකර ගැනීමට මණ්ඩලය සමත් වී ඇති අතර එය පසුගිය වසර දෙකක කාලය තුළ අලෙවි පිරිවැටුමේ සමස්ත වැඩිවීම 33% කි. මෙය ජාතික ලොතරැයි මණ්ඩල ඉතිහාසයේ ළඟාකරගත් ඉහළ ම අලෙවි ඉලක්කය වේ.

පසුගිය වසරේ වෙන් කරන ලද රු. මිලියන 8,367 ට සාපේක්ෂව 2016 වසරේ රු. මිලියන 9,723 ක් ත්‍යාග ලෙස වෙන්කර ඇති අතර එය රු. මිලියන 1,356 එනම් 16.2% ක වැඩිවීමකි. අලෙවි බෙදාහරින්නන්, අලෙවි නියෝජිතයින් සඳහා ලබාදෙන ලද නියෝජිත කොමිස් රු. මිලියන 527 ක වැඩිවීමක් පෙන්වන අතර එය 2015 වසරේ රු. මිලියන 3,244 ට සාපේක්ෂව 2016 වසරේ 3,771කි.

සමාලෝචිත වසරේ ඒකාබද්ධ අරමුදලට සෘජු දායකත්වය රු.මිලියන 3,360 ක් වන අතර 2015 වසරේ රු. මිලියන 2,437 ට සාපේක්ෂව එය රු. මිලියන 923 ක වැඩිවීමක් වන අතර පසුගිය වසරට වඩා 38% ක වැඩිවීමකි, බදු ද සහිතව රජයට ගෙවන මුළු දායකත්වය 2016 වසරේ රු. මිලියන 4,835 වූ අතර 2015 වසරේ ගෙවූ රු. මිලියන 3,935 සමඟ සසඳන විට රු. මිලියන 900 ක වැඩිවීමකි.

පසුගිය වසරේ ළඟාකරගත් රු. මිලියන 2,330ක දළ ලාභයට සාපේක්ෂව මෙම වසරේ දළ ලාභය රු. මිලියන 2,627 වූ අතර එය පසුගිය වසරට වඩා රු. මිලියන 297 ක වැඩිවීමකි.

වෙනත් ආදායම්වල ප්‍රධානතම සංරචකය වන පොළී ආදායම 2015 වසරේ රු. මිලියන 92 ක් වූ අතර එය 2016 වසරේ දී රු. මිලියන 249 එනම් රු. මිලියන 157කින් වැඩිවී ඇත. (170% ක වැඩිවීමකි.) වෙළඳපොළේ පොළී අනුපාතය ඉහළ යාම සහ ප්‍රඥාන්විත ආකාරයෙන් අරමුදල් කළමණාකරණ උපක්‍රම භාවිතා කිරීම මෙයට හේතු වූ අතර එය ඉතා ඉහළින් අගය කළ යුතු කරුණකි.

2015 වසරේ රු. මිලියන 1,511 වූ මෙහෙයුම් වියදම් 2016 වසරේදී රු. මිලියන 1,979 වූ අතර එය එනම් රු. මිලියන 468ක වැඩිවීමකි. අලෙවි වර්ධනය කිරීමේ වෑයමේ දී නිෂ්පාදනවලට අදාළව නව ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා වූ වියදම් රු. මිලියන 170කින් පසුගිය වසරට වඩා ඉහළ ගිය අතර සමස්ත අලෙවි වැඩිවීම එහි ප්‍රතිඵලයක් වූ අතර අලෙවි හා බෙදාහැරීම් වියදම් රු. මිලියන 774කින් වැඩිවී 2016 වසරේදී එය රු. මිලියන 1,246ක් විය.

තවද පරිපාලන වියදම් රු. මිලියන 91කින් වැඩිවූ අතර එයට ප්‍රධානතම හේතුව වූයේ සේවක වියදම්, වැටුප් වැඩිවීම් ආදිය වන අතර මෙය මෙහෙයුම් වියදම් ඉහළ යාමට හේතු විය.

සමාලෝචිත වසරේදී බදු පසු ලාභ රු. මිලියන 414ක් වූ අතර සැලකිය යුතු පසුගිය වසරේ වාර්තා කරන ලද රු. මිලියන 241 වූ බදු පසු ලාභයට සාපේක්ෂව (Bottom Line) යට මායිමේ ඉතා අගය කළ යුතු රු. මිලියන 173ක වර්ධනයක් සිදුවී ඇත.

මණ්ඩලය විසින් 2016 වසරේ සුපිරි ත්‍යාගලාභීන් 39 දෙනෙකු බිහිකළ අතර එහි මූල්‍යමය වටිනාකම වූ රු. මිලියන 1,047ට සාපේක්ෂව පෙර වසරේ සුපිරි ත්‍යාගලාභීන් 34 දෙනෙකු අතර රු. මිලියන 860ක් බෙදා දෙන ලදි.

## ක්‍රියාකාරකම් සාරාංශය

රාජ්‍ය ආයතනයක අනන්‍යතාවය පවත්වාගෙන යන අතරතුරදී වාණිජමය ආයතනයක් ලෙස අනන්‍යතාවයක් ලබාදීම සඳහා 2016 ජනවාරි 27 දින නව ආයතනික ලාංඡනයක් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වාදෙන ලදි.

අලෙවිකරුවන් සඳහා සහන සැලසීමේ අරමුණින් ආරම්භ කරන ලද දිවිසරණ රක්ෂණ ආවරණය එහි වැඩි ප්‍රතිලාභ සමඟින් එනම් රෝහල්ගතවීම සඳහා වූ ආවරණය දින 14 සිට දින 21 දක්වා වැඩිකර රු. 1000 බැගින් ලබාදීම ආදිය සමග අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර මෙහි අලෙවිකරුවෙකු හදිසි අනතුරකින් මරණයට පත්වුවහොත් රු. 250,000 ක් ද සාමාන්‍ය මරණයක දී රු. 75,000 ක් ලෙස රක්ෂණ ආවරණ ලබාදෙයි.

දමිළ ප්‍රජාව ලොතරැයි පිළිබඳ දැනුවත් කිරීමේ පරමාර්ථයෙන් 2016 මාර්තු මස සංගීත ප්‍රසංගයක් සමග විශේෂ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් උතුරු ප්‍රදේශයේ කිලිනොච්චි නගරයේ පවත්වන ලදි. එම කාල වකවානුවේ ම උතුරු ප්‍රදේශය සඳහා ලොතරැයිපත් දමිළ භාෂාවෙන් මුද්‍රණය කිරීම ආරම්භ කරන ලද අතර මුලින් ම ගොවිසෙත ලොතරැයියෙන් ආරම්භ කර පසුව මහජන සම්පත ලොතරැයිය ද මෙලෙස මුද්‍රණය කරන ලදී.

තදබදය අඩු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ පැවති සමහර අංශ කිපයක් 2016 මාර්තු මස ගාලුමුවදොර ප්‍රදේශයේ කුලියට ලබාගත් ගොඩනැගිල්ලකට ගෙනයන ලදි.

විදේශ විනිමය උපයාගැනීමේ පරමාර්ථයෙන් ලොතරැයි දෙකක් 2016 මාර්තු මස 30 දින නෙලුම් පොකුණ පරිශ්‍රයේදී දියත් කරන ලදි. එනම් කලම්බෝ එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ මිල ඩොලර් 30 දක්වා අඩුකර දිනුම් වාරයකට ටිකට්පත් 15,000ක් කළ අතර ඩොලර් ෆෝචූන් නැමති නවතම ලොතරැයිය ඩොලර් 10කට හඳුන්වා දුන් අතර එහි ටිකට්පත් ගණන 30,000 කි. සුපිරි ත්‍යාගය පිළිවෙලින් සුපිරි බෙන්ස් රථයක් හා ඩොලර් 100,000 කි.සියලුම ටිකට්පත් විකිණී අවසන් වූ පසු දිනුම් ඇදීම පවත්වයි.

පවර් ලොටෝ ලොතරැයිය 2016 මාර්තු මසදී මෙගා පවර් නමින් නම්කර රු. මිලියන 50ක මෙගා සුපිරි ත්‍යාගය, රු. මිලියන 10ක පවර් සුපිරි ත්‍යාගය,රු. මිලියන 10ක ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය ලෙස වර්ධනය වන සුපිරි ත්‍යාග 3කින් සමන්විත ත්‍යාග රටාවක් සමග නැවත වෙළඳපොළට හඳුන්වා දෙන ලදි. මෙය ලොතරැයි ව්‍යාපාරය තුළ එක් ලොතරැයියකට සුපිරි ත්‍යාග 3ක් ලබාදුන් පළමු සහ එකම ලොතරැයිය ලෙස ඉතිහාසයට එක්වේ.

2016 මැයි 27 දින වෙනස්ම වූ අලෙවි කොටසක් ඉලක්ක කර ගනිමින් ප්‍රථම ත්‍යාගය ලෙස රු. 200,000 ත්‍යාග ලබාදෙමින් සුපිරි දෙලක්ෂපති ලොතරැයිය වෙළඳපොළට හඳුන්වා දෙන ලදි.මෙහි ප්‍රථම දිනුම් ඇදීමේ දී දෙලක්ෂපතියන් 113 දෙනෙකු බිහිවිය.

2016 මැයි මස ඇති වූ ගංවතුර නිසා විපතට පත්වූවන්ට සහන සැලසීමේ අරමුණින් රු. 500,000 ප්‍රථම ත්‍යාගවලින් සමන්විත වූ මනුසත් මෙහෙවර නමින් ලොතරැයියක් 2016 අගෝස්තු මස 04 දින පවත්වන ලදි.

වාසනා සම්පත ලොතරැයිය යටතේ උප ලොතරැයියක් ලෙස රු. 50,000 ප්‍රථම ත්‍යාග රාශියක් සමග වාසනා සම්පත සුපර් ෆිෆ්ටි නැමති ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වා දුන් අතර එහි ප්‍රථම දිනුම් ඇදීම 2016 ජූලි 25 දින පවත්වන ලද අතර එහිදී රු. 50,000 ත්‍යාගලාභීන් 155 දෙනෙකු බිහිවිය.

2016 ඔක්තෝම්බර් මස හඳුන්වා දුන් ජංගම දුරකථන හරහා කෙටි පණිවිඩ සේවාව තුළින් ලොතරැයි මිලදී ගැනීමේ පහසුකම ජනතාවට හඳුන්වා දීම මගින් වෙනස් ම වූ අලෙවි කොටසක් කරා යාමට ජාතික ලොතරැයි මණ්ඩලයට හැකි විය.වසර අවසාන වන විට මෙහි ජනප්‍රියතාව තවත් ඉහළ යන බව පෙනී යයි.

තවද ජාතික ලොතරැයි මණ්ඩලය එක් ලොතරැයියක් තුළින් දිනුම් අවස්ථා 3ක් හඳුන්වා දෙමින් මහජන සම්පත ලොතරැයිය යටතේ රජ දිනුම නමින් ලොතරැයියක් කළ අතර එහිදී රු. 1,000,000 ප්‍රථම ත්‍යාගලාභීන් 32 ක් සමග විවිධ වෙනත් ත්‍යාග සහ විශේෂිත අංකය සඳහා ත්‍යාග එනම් හොන්ඩා ග්‍රේස් මෝටර් රථයක්, KDH ටොයෝටා වෑන් රථයක්, සුසුකි ඇල්ටෝ මෝටර් රථයක්, මෝටර් ස්කූටර් රථ, මෝටර් බයිසිකල් ආදිය ලබාදෙන ලදි.

2016 වසරේ දී ජනතාවට ගෙන එන දිනුම් අවස්ථා වැඩිකිරීමේ බලාපොරොත්තුවෙන් බදාදා සහ සිකුරාදා දිනවල දිනුම් අදිනු ලබන ලොතරැයි දිනකට හතර බැගින් දිනුම් ඇදීම ආරම්භ කරන ලදි. අනෙකුත් සියලු දිනවල ලොතරැයි 03 බැගින් දිනුම් අදිනු ලබයි. 2016 වසරේ දෙසැම්බර් මස දිනුම් වාර 103 ක් පැවැත්වූ අතර එක් මසක් තුළ දිනුම් වාර වැඩිම ප්‍රමාණයක් පැවැත්වූ මාසය මෙය වේ. ඒ අනුව 2015 වසරේ දෙසැම්බර් මස අලෙවි පිරිවැටුම වූ රු. මිලියන 2015 අභිබවා යමින් 2016 වසරේ දෙසැම්බර් මස රු. මිලියන 2,220 ක අලෙවි පිරිවැටුමක් ලබාගැනීමට මණ්ඩලය සමත් විය.

අධික ගංවතුර සහ නායයෑම් විශේෂයෙන්ම 2016 මැයි මස ඇතිවූ රෝනු නැමති නිවර්තන කුණාටුවෙන් සියයකට අධික මිනිසුන්ට මරු කැඳවමින් 3000 ක් පමණ ජනතාව විවිධ දුෂ්කරතාවන්ට මැදිකරමින් ඇති වූ තත්වයන් තිබියදීත් ඉහත ඉලක්ක සපුරා ගැනීමට හැකිවිය. තවද, කොස්ගම සාලාව යුධ හමුදා කඳවුරේ 2016 ජූනි මස ඇති වූ මහා ගින්නෙන් පවුල් 1,700 ක් පමණ අනාථ වූ අතර එහි බලපෑම ද අලෙවියට ඇති විය.

2016 දෙසැම්බර් මස 07 දින ජාතික ලොතරැයි මණ්ඩලයට අයත් වොක්ෂෝල් වීදියේ ඇති ඉඩමෙහි ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තබන ලදි. නුදුරු අනාගතයේදී ම එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට මණ්ඩලය අපේක්ෂා කරයි.

2015 වසරේ දී අලෙවි නියෝජිතයින් අතරින් ඉහළ කාර්යසාධනයක් ඇති අලෙවි නියෝජිතයින් දිරිමත් කිරීම සඳහා පැවැත්වූ සම්මාන උළෙල තවදුරටත් පුළුල් කරමින් සේවකයින් දිරිමත් කිරීමේ අරමුණින් ඔවුන් සඳහා ද පැවැත්වීමට කටයුතු යොදන ලදි.සම්මාන උළෙල 2017 ජනවාරි මස රත්මලාන ඊගල්ස් ලේක් සයිඩ් හෝටලයේ දී පවත්වන ලදි.

සාමාන්‍ය පරිදි 2016 වසරේ අලෙවි නියෝජිත රැස්වීම් පවත්වන ලදි. තවද ප්‍රමාණවත් තරම් විගණන හා කළමණාකරණ රැස්වීම් විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන චාමින්ද්‍ර ද සිල්වා මහතා ප්‍රධානත්වයෙන් පවත්වන මූල්‍යමය ප්‍රතිඵල ක්‍රියාකාරී අධ්‍යක්ෂ වාර්තාවේ දක්වා ඇත. නිෂ්පාදන විෂයධාරාව, සන්සන්දනාත්මක තොරතුරු ඇතුළත් ග්‍රාපිත සමාලෝචන පසුගිය ප්‍රතිඵල සමඟ අවශ්‍ය තැන්හිදී වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

## ජාතික පිළිගැනීම

2015 වසරේ කාර්යසාධනය පදනම් කර ගනිමින් ජාතික වාණිජ මණ්ඩලය විසින් 2016 වසරේදී පවත්වනු ලැබූ ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා හා සම්මාන ප්‍රදානයේදී රාජ්‍ය ආයතන අංශය යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය දෙවන ස්ථානය (රිදී සම්මානය) හිමිකර ගන්නා ලදි.

## ඉදිරි වසර

යෝධ රු. බිලියන 20 ක අලෙවි පිරිවැටුමක් උපයාගත් සේම එම ඉලක්කය දිගින් දිගටම පවත්වාගෙන යාම අපගේ මුඛ්‍ය පරමාර්ථයයි. අභියෝගාත්මක ව්‍යාපාරික පරිසරයේ තිරසාර පැවැත්ම කෙරේ ඉදිරි වසරේ දී අපගේ අවධානය යොමු කරනු ලැබේ.

දැඩි සුළඟ සහ පවතින තද ශීතල නිසා එවරස්ට් කන්ද නැගීම අසීරු වන අතර එහි රැඳී සිටීම ඊටත් වඩා අසීරු කරුණකි. අපගේ පාරිභෝගික ජනතාවට වඩාත් හොඳ සේවාවක් සැපයීමේ අරමුණින් අවම වශයෙන් ප්‍රාදේශීය කාර්යාල 5ක්වත් ඉදිරි වසරේ දී විවෘත කිරීමට අපේක්ෂිතය.

අපගේ විශ්වාසනීය පාරිභෝගික ජනතාවගේ බලාපොරොත්තු සහ නව පාරිභෝගික ජනතාව ගේ ආකර්ෂණය ලබාගැනීම සඳහා අතිරේක ත්‍යාග සහිත විශේෂ ලොතරැයි දිනුම් වාර පැවැත්වීම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය අපේක්ෂා කරයි.

නව අලෙවි කොටසක් අත්පත් කර ගැනීමේ අරමුණින් SMS (කෙටි පණිවිඩ) සේවාව මගින් ලොතරැයි අලෙවි කිරීම 2016 වසරේදී ආරම්භ කරන ලදි.

මන්නාරම,මුලතිව්, කිලිනොච්චි යන ප්‍රදේශවලට මුල් තැන දෙමින් උතුරු නැගෙනහිර ජනතාව දැනුවත් කිරීම සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමට නියමිතය. අපගේ නිෂ්පාදනවල අනන්‍යතාව වැඩිකිරීම සඳහා පළමු වරට දුම්රියක් චිත්‍රනය කර ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

අපගේ නිෂ්පාදනවල ස්වභාවය අනුව කාලීන අවශ්‍යතා හා ඉල්ලීම පරිදි අපගේ නිෂ්පාදන නැවත දියත් කිරීමට පසුබට නොවන අතර අපගේ නිෂ්පාදන වෙළඳපලේ ඉතා ඉහළ මට්ටමකට පැමිණ ඇති බැවින් තවදුරටත් විකාශනය කළ නොහැකි වනු ඇති අතර එය මන්දගාමී වන තත්වයක් උද්ගත විය හැකි අතර එම නිසා අනිකුත් රටවල්වල පවතින ලොතරැයි හා සංකල්ප පිළිබඳ අවධානය යොමුකළ යුතු කාලය එළඹ තිබේ.

ලොතරැයි බෙදාහරින්නන් සහ සේවකයින් අභිප්‍රේරක වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කර ඔවුනගේ උත්සාහය තහවුරු කරනු ලැබේ. අපගේ අලෙවි නියෝජිත ජාලයේ අවසන් පුරුක වන අලෙවි සහායකයින් සඳහා විශ්‍රාම ක්‍රමයක් හඳුන්වා දීම අපේක්ෂිතය. අලෙවි සහයකයින් ජාතික ලොතරැයි මණ්ඩලය හා සෘජුවම බැඳී නොසිටින බැවින් අපගේ සෘජු අවධානයෙන් මෑත් ව පවතින බැවින් අපගේ අවම පහසුකම් ලබන කොටස වේ. බෙදාහරින්නන් සහ අලෙවි නියෝජිතයින් සඳහා ක්‍රියාත්මක වන දිරිදීමනා ක්‍රම, රක්ෂණ ක්‍රම සහ වෙනත් සුභසාධක ක්‍රමවේද මගින් ඔවුන් ප්‍රතිලාභ උපයාගනී. මුහුණ දෙන ගැටලු, අලෙවි ඉලක්ක සපුරා ගැනීම්, සමාලෝචනය ආදිය සහ අවශ්‍ය අවස්ථාවල වේගවත් පියවරයන් ගතයුතු අවස්ථාවල එම කටයුතු සාකච්ඡා කිරීමට අලෙවි නියෝජිත රැස්වීම් පැවැත්වීම අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

## ප්‍රණාමය

අවසානයේ 2016 වසර අවසන් වූයේ බලාපොරොත්තු මල්ඵල ගන්වමිනි.ඉතා ඉහළ තරගකාරී ව්‍යාපාරික පරිසරයක් තුළ නිවැරදි මඟ පෙන්වීම, කණ්ඩායම් හැඟීම සහ කැපවීම නොමැති වූයේ නම් එවන් ඉහළ ඉලක්ක කරා යාම පහසු නොවනු ඇත.

මණ්ඩලය විසින් ලබාදුන් අපේක්ෂිත අලෙවි ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා මහත් කැපවීමෙන් කටයුතු කරන 15,000 ක් පමණ වූ බෙදාහරින්නන්, අලෙවි නියෝජිතයන් සහ අලෙවිකරුවන් සහිත අපගේ සමස්ත බෙදාහැරීම් ජාලයට ස්තූති කරමි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් විසින් දෙන ලද වටිනා මඟපෙන්වීම නොවන්නට ඓතිහාසික ප්‍රතිඵල අත්පත් කරගැනීමට හැකි නොවනු ඇත.කළමණාකාරිත්වයේ සියලුම සාමාජිකයින්, සියලුම තලවල සිටින සියලුම සේවකයින් මහන්සියෙන් වැඩ කළ අතර මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා කරන ලද දායකත්වයට ස්තූතිය පුදකර සිටිමි.

අපගේ ප්‍රධාන බැංකුකරු වූ මහජන බැංකුව විසින් ලබාදුන් සේවාව, ලොතරැයි මුද්‍රණකරුවන්, ප්‍රචාරක ආයතන, රජයේ විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, අනිකුත් විගණන සමාගම්, ඉහළ ත්‍යාග නිශ්කාෂණය කර ගැනීම සඳහා රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ආදීන්ට මාගේ ස්තූතිය හිමිවේ.

එමෙන් ම අපගේ නිෂ්පාදන කෙරෙහි විශ්වාසනීයත්වය තබමින් වාර්තාගත ඉහළ ම අලෙවි පිරිවැටුම අත්පත් කර ගැනීමට මඟ සලසමින් ලොතරැයි මිලදී ගත් අපගේ වටිනා පාරිභෝගික ජනතාවට බෙහෙවින් ම ස්තූතිවන්ත වෙමි.

ඔවුනගේ දිගුකාලීන සිහින සැබෑ කරගැනීම උදෙසා මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ආකර්ෂණීය ත්‍යාග රටා ඉවහල් වූ බව මම සිතමි.

## සාරාංශය

සියල්ල නොවුනත් බොහෝ බලාපොරොත්තු අත්පත් කරගැනීම සඳහා අප සමඟ එක්වූ සියලුම ව්‍යාපාරික පාර්ශවයන්ට ස්තූතිය පුදකරමි.

2017 ගමනට පා තබමින් සිටින අප යාවත්කාලීන හා නවෝත්පාදන බලාපොරොත්තු මගින් ජයග්‍රාහී මනසක් ඇතිකර ගනිමින් සියලු දෙනාගේ උත්සාහය හා වෑයම තුළින් ඉදිරියට යාමට බලාපොරොත්තු තබාගනිමු.

ශ්‍යාමිලා පෙරේරා,
සභාපතිනිය,
ජාතික ලොතරැයි මණ්ඩලය,
2017 පෙබරවාරි 27,
කොළඹ.



2016 වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඔබ වෙත ඉදිරිපත් කරමු.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සමස්ත දිවයින පුරා ලොතරැයි අලෙවි කටයුතුවල යෙදෙන අතර ලොතරැයි කර්මාන්තය තුළ ශක්තිමත් නිෂ්පාදන විෂයධාරාවක් ජාතික ලොතරැයි මණ්ඩලය සතුව පවතී.

ජාතික ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ දිනුම් අදින හා ක්ෂණික ලොතරැයි පවත්වාගෙන යාමයි. සමාලෝචිත වසරේදී මෙම ක්‍රියාකාරකම් ස්වභාවයේ කිසිදු වෙනසක් සිදු නොවිණි.

## අඛණ්ඩ පැවැත්ම

ජාතික ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු ඉදිරියටත් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් පැවතීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වන අතර මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ පැවැත්මේ පදනම" මත පිළියෙළ කර ඇත.

## මෙහෙයුම් සමාලෝචනය

සමාලෝචිත වසර තුල මණ්ඩලීය කටයුතු සහ එහි කාර්යසාධනය සමග මූල්‍ය ප්‍රතිඵල සභාපතිතුමියගේ පණිවිඩයේ අඩංගු අතර එක් එක් ලොතරැයිවල කාර්යසාධනය මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනයෙහි අඩංගු වේ.

ව්‍යාපාරික කටයුතු සම්බන්ධ උපායමාර්ගයන් තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය බලාපොරොත්තු වේ. මෙය ඉටු කර ගැනීම සඳහා පවතින ලොතරැයි වෙළඳපළෙහි කාර්යසාධනය තවදුරටත් වැඩිකර ගැනීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය පිලිබඳ සැලකිල්ල යොමු කරමින් වෙබ් සහ ඊ ලොතරැයි වෙළඳපළට හඳුන්වාදීම සඳහා පවතින ඉඩප්‍රස්ථා පිළිබඳ අවධානය යොමු කිරීමට අපේක්ෂිතය.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට මණ්ඩලය විසින් ගෙවිය යුතු සියලු බදු හා අයබදු ශේෂ පත්‍ර දිනට අදාළ වන සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවීම් කර හෝ අදාළ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සලසා ඇති බවට මණ්ඩලය සෑහීමකට පත් වේ.

## පාරිභෝගික සංතෘප්තිය

හැකි සෑම අවස්ථාවකම කාලය හා ශ්‍රමය වැය කර පාරිභෝගික අවශ්‍යතාවය හදුනාගෙන ඉන්පසු ඔවුනට හොඳ මිලකට ඉල්ලුමට සරිලන පරිදි ලොතරැයි ලබාදෙමින් සම්බන්ධතාවය හා විශ්වාසවන්ත බව ගොඩනගාගැනීම වටිනා බව මණ්ඩලය තරයේ විශ්වාස කරයි.

මෙම කරුණ පිලිබඳ සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන විෂ්‍යධාරාව තුළ පාරිභෝගික ආකල්ප සම්පූර්ණ වන පරිදි සංශෝධන සිදු කරන ලදී.

## මානව සම්පත් සංවර්ධනය

ඉහළ කළමණාකාරිත්වය විසින් නියම කරන ලද ඉලක්ක කරා ළඟාවීම සඳහා ධනාත්මකව තම දායකත්වය ලබාදීමට අභිප්‍රේරණය කිරීම සහ අභිමානවත් සේවක මඬුල්ලක් නිර්මාණය කිරීම උදෙසා මණ්ඩලය විසින් සේවක මඬුල්ලට විවිධ ප්‍රතිලාභ ලබාදීම් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

අලෙවි පිරිවැටුම මත ලබාදෙන දිරිදීමනා ක්‍රමය, වෛද්‍ය පහසුකම්, නිලඇඳුම් දීමනාව සහ ගමන් වියදම් දීමනාව එසේ සේවකයින්ට ලබාදුන් ප්‍රතිලාභ අතර වේ.

කලින් කලට විවිධ පුහුණු වැඩසටහන් පවත්වමින් දැනුම දියුණු කිරීමට කටයුතු කළ අතර සේවක පුහුණු කිරීම් ක්‍රමය යටතේ විවිධ පුහුණු පාඨමාලා සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසන ලදී.

## රජයට කරන ලද දායකත්වය

2015 වසරේදී ගෙවන ලද රු. මිලියන 3,934.9 ට සාපේක්ෂව ඒකාබද්ධ අරමුදලට කළ සෘජු ප්‍රතිපාදන හා බදු මගින් කරන ලද වක්‍ර ප්‍රතිපාදන ලෙස 2016 වසරේ රු. මිලියන 4,835.4 ක් මණ්ඩලය විසින් රජයට ලබාදෙන ලද අතර එය පසුගිය වසරට සාපේක්ෂව 22.8% ක වැඩිවීමකි.

## දේපල යන්ත්‍ර හා උපකරණ

2015 වසරේ වැය කරන ලද රු. මිලියන 163.5 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය රු. මිලියන 59.6 ක මුදලක් දේපල යන්ත්‍ර හා උපකරණවල ආයෝජනය කරන ලදි.

## මෙහෙයුම් වියදම්

සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 1,979.8 ක් වූ මුළු මෙහෙයුම් වියදම් පෙර වර්ෂයේ රු. මිලියන 1.511.2 සමග සසඳන විට 31% වැඩිවීමක් පෙන්වන අතර එය මුළු පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස ගත් විට පසුගිය වසරේ 8.6% ක් වූ අතර මෙම වසරේ 9.8% කි.

## සමාප්තිය

ඉතා ඉහළ ප්‍රතිඵල අත්පත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකාරිත්වය හා සියළුම සේවක මඬුල්ල ලබාදුන් කැපවීමෙන් යුතු සේවයට සහ ඵලදායි කාර්යසාධනය වෙනුවෙන් 2016 වසර සඳහා වූ මෙම සමාලෝචනය තුළින් සියළු දෙනාටම ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්, සාමාන්‍ය අලෙවි නියෝජිතයින්, බැංකු කරුවන්, සැපයුම් කරුවන්, මුද්‍රණකරුවන්, විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලය, සහ ලොතරැයි විගණකවරු ආදි අප හා බැඳුනු සියළුම පාර්ශවකරුවන්ට ඔවුනගේ විශ්වසනීය සේවයට හා කැපවීමට ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.



එම් කේ හසන්,
ක්‍රියාකාරී අධ්‍යක්ෂ,
ජාතික ලොතරැයි මණ්ඩලය,
2017 පෙබරවාරි 27 දින,
කොළඹ.

මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණත්වය. අවදානම් කළමණාකරනය, අභ්‍යන්තර පාලනය, නීති රීති හා නියාමන අවශ්‍යතාවලට අනුකූලවීම, බාහිර විගණකවරුන්ගේ කාර්යසාධනය, සුදුසුකම්, ස්වාධිනත්වය හා අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යසාධනය යනාදිය සම්බන්ධ කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දැක්වීම විගණන හා කළමණාකරන කමිටුවේ කාර්යභාරය නිර්දේශය හා නියාමය වේ.

අදාල අධිකාරීන් විසින් අනුමත කරන ලද නිර්දේශ හා නියමයන්ට අනුකූලව කමිටුව ක්‍රියාත්මක කරන අතර පහත සදහන් සාමාජිකයින්ගෙන් කමිටුව සමන්විත වේ.

| | | |
|---|---|---|
| චාමින්ද්‍ර ද සිල්වා මහතා | - | සභාපති ((විධායක නොවන අධ්‍යක්ෂ) |
| ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා | - | නිරීක්ෂක/භාණ්ඩාගාර නියෝජිත |
| ගාමිණී සපරමාදු මහතා | - | සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ) |
| සුනිල් ගුණවර්ධන මහතා | - | සාමාන්‍යාධිකාරී |
| හර්ෂ බණ්ඩාර මහතා | - | ප්‍රධාන මූල්‍ය නිලධාරී |
| එස්. බාලසූරිය මිය | - | ලේකම් (නි. සාමාන්‍යාධිකාරී නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) |

**නිරීක්ෂකයින්**

අභ්‍යන්තර විගණක - තනුජා සම්මානි මිය
නියෝජිත - විගණකාධිපති දෙපාර්තමේන්තුව

කළමණාකරනයේ අනිකුත් සාමාජිකයින් පැහැදිලි කිරීම් අවශ්‍යවන අවස්ථාවලදී රැස්වීම්වලට කැදවයි. 2016 වසර තුළ රැස්වීම් වාර 4 ක් පවත්වා ඇත.

විගණන හා කළමණාකරණ කමිටුව මණ්ඩලයේ කාර්යසාධනය හා අනුකූලතාවය සමතුලිතව පවත්වා ගැනීම සඳහා උපකාරී වෙයි. මණ්ඩලයේ වගකීම් විසර්ජනය, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කිරීම. පාලන පරිසරයේ කාර්යසාධකත්වය තක්සේරු කිරීම සහ අභ්‍යන්තර හා බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය හා විෂය මූලිකත්වය සුරක්ෂිත කිරීම කමිටුවේ අභිමතාර්ථය වේ.

මූල්‍ය ප්‍රකාශන හා අනිකුත් වාර්තා කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය නිර්දේශයන් ලබාදෙයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී උපයෝගී කරගන්නා විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිළිබඳ හා ඉදිරිපත් කිරීම පිළිබඳ කමිටුවේ විශේෂ අවධානය යොමු කෙරේ. තවද කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන වාර්තා හා දිගු කලක් තිස්සේ නොවිසඳී ඇති ගැටළු ආදිය පිළිබඳවද සමාලෝචනය කරන අතර අවශ්‍ය නිර්දේශයන් ලබාදෙයි. සෑම කමිටු රැස්වීමකම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අතර එය තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සමාලෝචනය කෙරේ.


ඵලදායී අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කිරීම හා සමස්ත පාලන ක්‍රමවේදයන් හා පරිසරය දියුණු කිරීම සහතික කරනු වස් අභ්‍යන්තර විගණන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ කමිටුව විසින් පසු විපරම් කරනු ලැබේ.

වැඩි ස්වාධීනත්වය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු පිළිගත් බාහිර ආයතනයක් විසින් සිදුකරනු ලැබේ. ක්‍රියාත්මක වෙමින් පවතින විගණන නිර්දේශයන් නිර්ණය කිරීම සඳහා පසු විපරම් කටයුතු උපලේඛන ගත කොට ඇත.

සමාලෝචිත වසර තුළ කමිටුවේ රාජකාරී හා වගකීම් ඵලදායී ලෙස කරගෙන යාම සඳහා ශක්තියක් වන තොරතුරු සහ අවශ්‍ය සහයෝගය කළමණාකාරීත්වයෙන් කමිටුවට ලැබිණි.

**අනුකූලතාවය**

පිළිගත් ප්‍රතිපත්තීන්වලට අනුකූලව මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු මෙහෙය වූ බවට මණ්ඩලයේ මෙහෙයුම් පාලනයන් හා ගිණුම්කරන ප්‍රතිපත්තීන් සාධාරණ සහතිකයන් සපයන බව විගණන කමිටුව පිළිගන්නා අතර කමිටුව ඒ පිළිබඳ සෑහීමකට පත් වේ.



චාමින්ද්‍ර ද සිල්වා
සභාපති ,
විගණන හා කළමණාකරන කමිටුව,
ජාතික ලොතරැයි මණ්ඩලය,
2017 පෙබරවාරි 27 දින.
කොළඹ.



# 03 මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } පියුආර්/ජී/එන්එල්බී/1/16/4 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ඔක්තෝබර් 31 දින

සභාපති,
ජාතික ලොතරැයි මණ්ඩලය

**ජාතික ලොතරැයි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1963 අංක 11 දරන මුදල් පනතේ අංක 11 (ආ) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 සැප්තැම්බර් 29 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

ප්‍රමිතයේ 79 (ආ) ඡේදය ප්‍රකාරව ස්කන්ධය තුළ ඇති එක් එක් සංචිතයේ ස්වභාවය හා අරමුණු පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07**

(i) ප්‍රමිතයේ 18 (ආ)(ඇ) ඡේද ප්‍රකාරව, මණ්ඩලය විසින් විදේශීය ව්‍යවහාර මුදල් දේශීය ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කිරීමෙන් ඇති වී තිබුණු රු.1,522,862 ක අලාභය ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයට ගලපා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ වල ආරම්භක ශේෂයට ගැලපීම වෙනුවට මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 20 වන වගන්තිය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පෙර ලාභයට ගැලපීම් නොකළ යුතු පහත සඳහන් විෂයයන් බදු පෙර ලාභයට ගලපා තිබුණි.

| විස්තරය | වටිනාකම |
|---|---|
| | රු. |
| ප්‍රයෝජනයට ගත නොහැකි තොගයට මාරු කිරීම් | 81,000 |
| ත්‍යාග සංචිතයේ වෙනස් වීම් | 99,346,909 |
| නිවාස ණය ශේෂයේ අඩු වීම | 272,963 |

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08**

ඉකුත් වර්ෂවලදී උපචිත වියදම් ලෙස ඇස්තමේන්තු කර තිබුණු එකතුව රු.64,766,800 ක් සඳහා අදාළ වියදම් පැන නොනැගී තිබූ අතර, එම මුදල ඇස්තමේන්තු වෙනස්වීමක් ලෙස ප්‍රවර්තන වර්ෂයේ ලාභයට ගැලපිය යුතු විය. එහෙත් එම වටිනාකම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ රඳවාගත් ලාභයට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදුකරණ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12**

ප්‍රමිතයේ 81 (ඇ) ඡේදය ප්‍රකාරව, බදු වියදම (ආදායම) සහ ගිණුම්කරණ ලාභය අතර පහත සඳහන් දෙයාකාරයට හෝ එක් ආකාරයකට අනුව කරන පැහැදිලි කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(i) බදු වියදම (ආදායම) සහ ගිණුම්කරණ ලාභයට අදාළ වන බදු අනුපාතිකයෙන් ගුණ කිරීමෙන් ලැබෙන වටිනාකම සමග අදාළ බදු අනුපාතිකය ගණනය කළ පදනමද හෙළිදරව් කරමින් සංඛ්‍යාත්මක සැසඳීමක්.

(ii) සාමාන්‍ය සඵල බදු අනුපාතිකය සහ අදාළ වන බදු අනුපාතිකය අතර වෙනසට අදාළ වන බදු අනුපාතිකය ගණනය කළ පදනමද හෙළිදරව් කරමින් සංඛ්‍යාත්මකව සැසඳීමක්.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

සේවක පාරිතෝෂික සඳහා අනාගත බැඳියාව වෙනුවෙන් රු.29,270,262 ක ප්‍රතිපාදන සලසා තිබුණද ඒ සඳහා සුදුසු ආයෝජන සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

(i) ප්‍රමිතයෙහි 25 ඡේදය ප්‍රකාරව රජයේ ප්‍රදාන ලෙස ලැබෙන දෑ ගිණුම්ගත කිරීමේදී හඳුන්වාදී ඇති විකල්ප ක්‍රම අනුගමනය කර තිබූ බව නිරීක්ෂණය නොවීය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.5,795,000 ක් වටිනා මෝටර් රථයේ පිරිවැය ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණද ඊට අදාළ ක්‍රමක්ෂය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 39 (අ) ඡේදය ප්‍රකාරව පහත සඳහන් අනාවරණය කිරීම්ද සිදු කර නොතිබුණි.

- රජයේ ප්‍රදාන සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම සඳහා යොදාගත් පදනම ඇතුළු රාජ්‍ය ප්‍රදාන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය,
- එම රාජ්‍ය ප්‍රදානයෙහි ස්වභාවය හා ප්‍රමාණය

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21

සමාලෝචිත වර්ෂයට අදාල විදේශ විනිමය පරිවර්තන ලාභය රු.5,046,090 ක් වුවද මණ්ඩලය සතු විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ ශේෂය දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී හුවමාරු අනුපාතිකය නිවැරදි ලෙස යොදා නොගැනීම හේතුවෙන් එය මූල්‍ය ප්‍රකාශනවල රු.1,522,862 ක අලාභයක් ලෙස දක්වා තිබුණි. තවද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එම අලාභයද ඉහත දෝෂය හේතුවෙන් රු.547,132 කින් අධි තක්සේරු වී තිබූ අතර ප්‍රමිතයේ 28 ඡේදය ප්‍රකාරව එම අලාභ සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම්ගත නොකර රඳවාගත් ලාභයට ගැලපීම් කිරීම් හේතුවෙන් බදුකරණ ලාභයද නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

ප්‍රමිතියේ 17 වන ඡේදය ප්‍රකාරව, පහත සඳහන් සේවක ප්‍රතිලාභ වර්ගවල එකතුන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

(i) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ
(ii) පශ්චාත් සේවා ප්‍රතිලාභ
(iii) වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ
(iii) සමාප්ති ප්‍රතිලාභ

(ඌ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36**

ප්‍රමිතයෙහි 59 හා 60 වන ඡේද ප්‍රකාරව, ශුද්ධ අගය රු.558,310 ක් වූ භාවිතයෙන් ඉවත්කර ඇති වත්කම් දෙකක් සම්බන්ධයෙන් ඇතිවිය හැකි හානිකරණ අලාභය හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ අරමුදලට දායකවීම් රු.2,445,594,544 ක් ස්කන්ධ වෙනස්වීමක් ලෙස හඳුනා ගැනීම වෙනුවට විකුණුම් පිරිවැයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.99,354 ක වියදමක් පෙර ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම වත්කම් සහ සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ලොතරැයි බෙදාහැරීමේ නියෝජිතයන් විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ ලොතරැයිපත් 52,158 ක් වෙනුවෙන් අයවිය යුතු රු.1,043,160 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඈ) උසාවි නියෝගයක් මත අලෙවි නියෝජිතයෙකුගෙන් ලැබී තිබුණු රු.1,000,000 ක මුදල අදාළ ණයගැති ගිණුමට බැර කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලොතරැයි ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් නිකුත් කර ඇති නමුත් මාස 06 ක කාලයක් තුළ ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ එකතුව රු.4,382,409 ක් වටිනා චෙක්පත් සඳහා මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව විධිමත් විමර්ශණයක් සිදුකර අවශ්‍ය ගැලපීම් සිදු කිරීම වෙනුවට වර්ෂයේ වියදම්වලින් එම ප්‍රමාණය අඩුකර දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ජංගම නොවන වත්කම් 03 ක් සඳහා වූ ක්ෂය වටිනාකම රු.21,153 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) මාස 06 ඉක්මවූ ලොතරැයිපත් ජාතික කඩදාසි සංස්ථාවට විකිණීමෙන් මණ්ඩලයට ලැබිය යුතු රු.982,320 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඟ) මණ්ඩලයේ බැංකු ජංගම ගිණුමක වර්ෂ 01 කට අධික කාලයක සිට හඳුනා නොගත් ලැබීම් රු.3,142,147 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුළදී දිනුම් වාරයන් සඳහා වෙන්කර තිබූ එහෙත් හිමිකම් නොපෑ ජයග්‍රාහකයින්ට අදාළ රු.99,346,909 ක ත්‍යාග මුදල නැවත ලාභයට ගැලපීම වෙනුවට රඳවාගත් ලාභයට ගලපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) මණ්ඩලය විසින් පෞද්ගලික බැංකුවක ආයෝජනය කර තිබූ රු.5,000,000 ක් 2008 අප්‍රේල් 23 දිනැති අංක 1546/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් රජයට පවරා ගෙන තිබුණද, ඒ සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු නොකර එම මුදල ආයෝජන යටතේ තවදුරටත් දක්වා තිබුණි.

## 2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ලොතරැයි දිනුම් ඇදීමේ වාර සඳහා සහභාගී වන මණ්ඩලයේ නිලධාරීන්ට එක් දිනුම්වාරයක් සඳහා රු.1,200 සිට රු.4,500 දක්වා වූ පරාසයක ගෙවීම් සිදුකරනු ලැබුවද ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පමණක් එසේ ගෙවා තිබූ මුදල රු.39,990,200 ක් විය.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ණය පදනම මත නිකුත් කර තිබූ ලොතරැයි අලෙවි කුවිට් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව පැවති රු.7,716,731 ක වටිනාකම තුළ ඇතුළත් 2013 වර්ෂයට අදාළ රු.1,866,015 ක මුදල නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් එහි අලෙවි නියෝජිතයින්ට ලබාදී තිබූ යතුරු පැදි සහ පාපැදි වෙනුවෙන් 2014 වර්ෂයට හා ඊට පෙර සිට අයවිය යුතු වූ එකතුව රු.1,011,338 ක වාරික මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු.523,965,797 ක් වූ වෙළෙඳ ණයගැති ශේෂය තුළ එකතුව රු.8,549,003 ක් වූ ශේෂ ලොතරැයි අලෙවි නියෝජිතයින්ගෙන් වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා වූ කාලයක සිට අයවිය යුතුව පැවතුණු අතර කාර්යය මණ්ඩලයේ

සාමාජිකයින් වෙත නිකුත් කර තිබූ ලොතරැයිපත් වෙනුවෙන් ලැබිය යුතුව පැවති රු.560,000 ක ශේෂයන්ද අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් යොදා නොතිබුණි.

(ඇ) ඉහත ණයගැතියන් තුළ ඇතුළත් 2014 වර්ෂයේදී මියගිය අලෙවි නියෝජිතයෙකුගෙන් ලැබිය යුතුව පැවති රු.467,600 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2017 මාර්තු 31 දිනවන විට දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් තිදෙනෙකුට අදාළ වර්ෂ 05 ඉක්මවූ ණය ශේෂවල එකතුව රු.975,774 ක්ද, නියෝජිතයින් 04 දෙනෙකුට අදාළ වර්ෂ 02 ඉක්මවූ ණය ශේෂවල එකතුව රු.559,966 ක්ද වශයෙන් එකතුව රු.1,535,740 ක් අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඊ) වර්ෂ 06 කට වැඩි කාලයක සිට ණයහිමියන් 06 දෙනෙකුට ගෙවිය යුතු රු.21,462,363 ක් නිරවුල් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් ලෙස කටයුතු කර තිබූ එහෙත් වර්ෂ 06 කට වැඩි කාලයක් අක්‍රියව සිටින අලෙවි නියෝජිතයින් 117 දෙනෙකු වෙත ගෙවිය යුතුව පැවති රු.255,017 ක මුදල පිළිබඳව විධිමත් පරිදි සොයා බලා එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) මණ්ඩලයේ සේවය කර සිටියදී 2003 වර්ෂයේදී මියගොස් ඇති සහ එම වසරේම වැඩ තහනමට ලක්වූ නිළධාරීන් දෙදෙනෙකුට ගෙවිය යුතු රු.240,983 ක් වූ දිරි දීමනා මුදල් නිරවුල් කිරීමකින් තොරව ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(එ) වර්ෂ ගණනාවක සිට දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් සඳහා ගෙවිය යුතුව පැවති රු.149,000 ක් විධිමත් පරිදි නිරවුල් කිරීමකින් තොරව වැඩිපුර අයකරගත් පරිගණක වාරික ලෙස ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතිණි.

(ඒ) මණ්ඩලය සඳහා ලී බඩු හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් 2013 වර්ෂයේදී බාහිර පාර්ශවයන්ට ලබාදී තිබුණු අත්තිකාරම් මුදලින් රු.168,560 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල් කිරීමකින් තොරව ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඔ) මණ්ඩලයට ජලය සහ ඉන්ධන සැපයීම වෙනුවෙන් බාහිර ආයතන 02 ක තැන්පත් කර තිබූ රු.202,500 ක් වර්ෂ 12 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණු අතර අදාළ ආයතන මේ වන විට මණ්ඩලය වෙනුවෙන් සේවා සැපයීමක්ද සිදු නොකරන බව නිරීක්ෂණය විය.

(ඕ) මණ්ඩලයේ නිලධාරියකු වෙත 2012 අප්‍රේල් මාසයේදී ලබාදී තිබූ රු.15,000 ක අත්තිකාරම් 2017 ජුනි වන විටත් පියවා නොතිබුණි.

**2.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනත | |
| (i) 14(2) හා 17(1) අ වගන්තිය | පනතේ විධිවිධානවලට පටහැනිව සුපිරි වාසනා සම්පත හා ජාතික සම්පත යන ලොතරැයිවලට අදාළ ත්‍යාග සංචිත ගිණුම්වලින් රු.30,000,000 ක්, මණ්ඩලයේ වෙනත් ලොතරැයි ත්‍යාග ගෙවීම් සඳහා යොදාගෙන තිබුණි. |
| (ii) 14 (2) හා 16 (1) හා 16 (4) වගන්ති | මණ්ඩලය විසින් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අධිකාර වෙනුවෙන් ලොතරැයි පැවැත්වීමේදී අදාළ ආයතන සමග ගිවිසුමකට එළඹිය යුතුය. එහෙත්, ගොවිසෙත, සුපිරි වාසනා සම්පත, ජාතික සම්පත හා නිරෝගා ලොතරැයි වෙනුවෙන් අදාළ ආයතන සමග ගිවිසුම්ගත වීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.4,792,887,453 ක් ත්‍යාග ලෙස පිරිනමා තිබුණි. තවද, ත්‍යාග ලබා ගැනීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ රු.365,393,530 ක ත්‍යාග මුදල ඒකාබද්ධ අරමුදලට මාරුකර තිබුණි. |
| (iii) 17 (2) වගන්තිය | ලොතරැයි ආදායමින් අදාළ වියදම් අඩුකළ පසු ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් ඉකුත් වර්ෂවලට අදාළව එසේ බැර කිරීමෙන් තොරව රු.522,548,543 ක් රඳවා තිබුණි. |

(iv) 20(2)(1) වගන්තිය

මණ්ඩලය විසින් ලොතරැයි පැවැත්වීම සම්බන්ධයෙන් රීති සකස් කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවද 2012 වර්ෂයේ සිට හඳුන්වාදී තිබූ නව ලොතරැයිපත්වන සම්පත් රේඛා, පවර් ලොටෝ, මෙගා පවර්, නිරෝගා, සුපිරි දෙලක්ෂපති, මනුසත් මෙහෙවර හා සුපර් ෆිෆ්ටි යනාදිය සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඉන් රු.4,692,245,550 ක අලෙවි ආදායමක් උපයා තිබූ අතර එම ආදායමින් රු.2,309,431,338 ක් ත්‍යාග සඳහා වෙන් කර තිබූ අතර අලෙවි නියෝජිත කොමිස් ලෙස රු.848,111,451 ක් ගෙවා තිබුණි.

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත 114 වන වගන්තිය

2002 වර්ෂයේදී නිලධාරියකුගෙන් අයකර තිබූ රු.5,270 ක උපයන විට ගෙවීමේ බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

---

(i) VI වැනි පරිච්ඡේදය 2.10 ඡේදය

සෑම පත්වීමක්, උසස් කිරීමක්, වැටුප් වර්ධක ගෙවීමක්, සේවය අත්හිටුවීමක්, විශ්‍රාම ගැන්වීමක් යනාදී කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් විගණකාධිපතිවරයා වෙත වාර්තා කළ යුතු වුවද එසේදී කටයුතු කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (ii) | VIII වන පරිච්ඡේදයේ 10.1 ඡේදය | සතිඅන්ත හෝ රජයේ නිවාඩු දිනවල රාජකාරිවල නිරත වීම වෙනුවෙන් පැය 08 කට නොඅඩු එක් දිනක් සඳහා වැටුපෙන් 1/20 ක දීමනාවක් ලබාදිය හැකි වුවද එම විධිවිධාන නොසලකා මණ්ඩලය විසින් පැය 12 ඉක්මවා රාජකාරි ඉටුකරන සෑම එක් දිනක්ම දින දෙකක් රාජකාරි කළ සේ සලකා ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එසේ දින දෙකක් සේ සැලකූ අවස්ථා 86 ක් වෙනුවෙන් ගෙවා තිබූ මුදල රු.206,889 ක් විය. තවද, සතියේ වැඩකරන දිනයන්ද රජයේ නිවාඩු දිනයන් සේ සලකා නිවාඩු දින වැටුප් ගෙවා තිබූ අවස්ථා 04 ක් නිරීක්ෂණය වූ අතර එසේ ගෙවා තිබූ මුදල රු.18,038 ක් විය. |
| (iii) | XXIV පරිච්ඡේදයේ 11 වන වගන්තිය | 2005 ජනවාරි 01 දින සිට දේපල ණය ලබාදීම බැංකු මගින් සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් වෙත රු.8,333,758 ක දේපල ණය මණ්ඩලයේ මුදල් උපයෝගී කරගෙන ලබාදී තිබුණි. එසේම දේපල ණය සඳහා විධිවිධාන ප්‍රකාරව නිලධාරියාගෙන්, අය කරගත යුතු පොළිය නොසලකා සෑම නිලධාරියෙකුටම සියයට 4 ක අවම පොළී අනුපාතය යටතේ ණය ලබා දී තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 396 (ඇ) | ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ එකතුව රු.388,509 ක චෙක්පත් 65 ක් සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 702 (3) | කොන්ත්‍රාත් ගිවිසුම් පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2011 පෙබරවාරි 9 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිල වාහන සඳහා හිමිකම ඇති නිලධාරීන් 09 දෙනෙකු වෙනුවෙන් මාසිකව ලබාදිය හැකි ඉන්ධන දීමනා සීමාව ඉක්මවා රු.2,783,900 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඊ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014, 2016 අගෝස්තු 26 දිනැති අංක 07/2014 කළමනාකරණ සේවා චක්‍රලේඛ හා 2010 අගෝස්තු 26 දිනැති අංක ඩීඑම්එස්/ඊ1/04/4/06 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව තනතුරු 04 ක් සඳහා නිලධාරීන් 09 දෙනෙකු බඳවා ගෙන තිබුණි. |
| (උ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br>--------------------------- | |
| | (i) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය | |
| | • 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමග විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | • 9.12 ඡේදය | මණ්ඩලයේ සභාපතිනිගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුළදී කාර්ය මණ්ඩලය සඳහා රු.12,855,777 ක සුභසාධක දීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා ලෙස එසේ ගෙවා ඇති මුදල රු.99,864,317 ක් විය.<br>රජයේ අනුමත සංයුක්ත දීමනාව වෙනුවට එක් දිනකට උපරිම ලෙස රු.2,500 දක්වා වූ විශේෂ ප්‍රවර්ධන දීමනාවක් කාර්ය මණ්ඩලයට ලබාගත හැකි වන පරිදි විධිවිධාන සලසා තිබුණද ඒ සඳහා නිශ්චිත අනුමැතියක් ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එසේ ගෙවා ඇති මුදල රු.3,096,500 ක් විය. |
| (iii) | 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015 දරන චක්‍රලේඛයේ 2.5 ඡේදය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.315,294 ක දිරිදීමනාවක් ගෙවා තිබුණි. |
| (iv) | 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන චක්‍රලේඛය | මණ්ඩලය විසින් වාර්ෂික ප්‍රචාරණ සැලැස්මක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු. 1,013,545,562 ක් ගෙවා තිබූ අතර ඉකුත් වර්ෂයේදී රු.753,535,738 ක් දරා තිබුණි. |

(ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

---

| | | |
|---|---|---|
| (i) | 1.3.2 මාර්ගෝපදේශය | මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ මෙහෙයවා තිබුණු ලොතරැයි 14 කින් ලොතරැයි 10 ක් සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව මුද්‍රණකරුවන් තෝරාගෙන තිබුණි. |
| (ii) | 7.8.6 හා 7.8.7 මාර්ගෝපදේශය | ලොතරැයි වර්ග 5 ක් සඳහා කැඳවන ලද මිල ගණන් ඇගයීමේදී සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති බවට වාර්තා වී තිබුණු මුද්‍රණ සමාගම් 02 ක මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් කටයුතුවලින් ඉවත් කර තිබුණි. එසේම සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති බවට |

තහවුරු නොවූ මුද්‍රණ සමාගමක් වෙත ලොතරැයි 02 ක මුද්‍රණ කටයුතු පවරා තිබුණි.

(iii) 7.12.4 මාර්ගෝපදේශය

ඉහත ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසුකරු සමග සම්මුති සාකච්ඡා කිරීම තුළින් එකඟ වූ කරුණු පිළිබඳ වාර්තා පවත්වාගෙන ගොස් නොතිබූ අතර ලංසුකරු සමග අවබෝධතා ගිවිසුම්ද අත්සන් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.414,761,431 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.241,016,039 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.173,745,392 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වෙනත් ආදායම් රු.157,348,155 කින් වැඩිවීම හා ආදායම් බදු රු.187,656,992 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ 2013 හා 2014 වර්ෂවලදී හැර අනෙකුත් වර්ෂවල ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර 2015 වර්ෂයේදී රු.241,016,039 ක් වූ ලාභය සමාලෝචිත වර්ෂයේ රු.414,761,431 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික ජංගම නොවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දායකත්වය හිතකර අගයක් ගෙන තිබුණි. 2012 වර්ෂයේදී රු.3,014,201,011 ක්වූ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,830,885,902 ක් දක්වා වර්ධනය වී තිබුණද එය වාර්ෂිකව උච්චාවචනයන්ට ලක් වී තිබුණි.

## 3.3 විග්‍රහාත්මක සමාලෝචනය

### 3.3.1 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායිත්ව හා කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | අනුපාතය | වර්ෂය | |
|---|---|---|---|
| | | 2016 | 2015 |
| (i) | දළ ලාභ (ප්‍රතිශතය) | 13.02 | 13.39 |
| (ii) | ශුද්ධ ලාභ/(අලාභ) (ප්‍රතිශතය) | 2.05 | 1.38 |
| (iii) | ජංගම වත්කම් අනුපාතය | 1.34 : 1 | 1.26:1 |
| (iv) | ක්ෂණික වත්කම් අනුපාතය | 1.31 : 1 | 1.24:1 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු.2,775,954,070 කින් එනම් සියයට 15.95 කින් වැඩිවී තිබුණද දළලාභ අනුපාතය 0.37 කින් පහළ ගොස් තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය ඉහල යාම මෙන්ම වැට් **(VAT)** බදු අනුපාතය ඉහල යාමද ඒ සඳහා හේතු වී තිබුණි.

(ආ) මණ්ඩලයේ ජංගම හා ක්ෂණික අනුපාත ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම සඳහා කාරක ප්‍රාග්ධන කළමනාකරණය කෙරෙහි මණ්ඩලයේ අවධානය තවදුරටත් යොමුවිය යුතු වේ.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1963 අංක 11 දරන මුදල් පනත මගින් ස්ථාපනය කර තිබුණු ජාතික ලොතරැයි මණ්ඩලයේ අරමුණු හා කාර්යයන් පහතින් දැක්වේ.

(අ) පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුළින් රජයට කරන දායකත්වය වැඩි කිරීම.

(ආ) වෙළඳපල නායකත්ව තත්ත්වය පවත්වාගෙන යාම.

(ඇ) මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.

(ඇ) ආයතනයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

(ඉ) සේවක මණ්ඩලයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය වැඩිදියුණු කිරීම.

(ඊ) පාරිභෝගික සංතුෂ්ටිය වැඩි කිරීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය ආරම්භ කර වසර ගණනාවක් ගතවී තිබුණද ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කර ගැනීමට අදාළව කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ 2015 හා 2016 වර්ෂයන්ට අදාළ ලොතරැයිපත් ආදායම හා ප්‍රචාරණ පිරිවැය පහත දැක්වේ.

| ලොතරැයියේ නම | විකුණුම් ආදායම | | | | ප්‍රචාරණ පිරිවැය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2015 | විචලනය | ප්‍රතිශතය | 2016 | 2015 | විචලනය | ප්‍රතිශතය |
| | රු.මි. | රු.මි. | රු.මි. | % | රු.මි. | රු.මි. | රු.මි. | % |
| මහජන සම්පත | 5,342 | 4,734 | 608 | 12.8 | 132 | 107 | 25 | 23 |
| වාසනා සම්පත | 1,143 | 1,350 | (207) | (15.3) | 93 | 61 | 32 | 52 |
| ගොවිසෙත | 4,011 | 4,511 | (500) | (11.1) | 121 | 81 | 40 | 49 |
| සුපිරි වාසනා | 1,683 | 1,747 | (64) | (3.66) | 83 | 70 | 13 | 19 |
| ජාතික සම්පත | 1,355 | 1,319 | 36 | 2.73 | 83 | 67 | 16 | 24 |
| සම්පත් රේඛා | 1,632 | 1,629 | 3 | 0.18 | 102 | 80 | 22 | 28 |
| වාසනා සම්පත සුපර් හිට්ට් | 154 | - | 154 | 0 | - | - | - | - |
| මෙගා පවර් | 1,135 | - | 1,135 | 0 | 79 | 12 | 67 | 558 |
| පවර් ලොටෝ | 72 | 305 | (233) | (76.4) | - | 41 | (41) | (100) |
| නිරෝගා | 1,308 | 432 | 8.76 | 203 | 90 | 81 | 9 | 11 |
| මනුසත් මෙහෙවර | 30 | - | 30 | 0 | - | - | - | - |
| සුපිරි දෙලක්ෂපති | 517 | - | 517 | 0 | 66 | - | 66 | - |
| රජ දිනුම | 140 | - | 140 | 0 | - | - | - | - |
| සමෘද්ධි | 176 | 206 | (30) | (14.6) | 3 | 03 | - | - |
| සෙවණ | 1,475 | 944 | 531 | 56.3 | 4 | 02 | 2 | 100 |

(i) ඉකුත් වර්ෂයේ අලෙවි කර තිබුණු ලොතරැයි වර්ග 10 ට අමතරව සමාලෝචිත වර්ෂයේදී ලොතරැයි වර්ග පහක් හඳුන්වා දී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ලොතරැයි වර්ග 05 ක ආදායම ඉහළ ගොස් තිබුණද, වාසනා සම්පත, ගොවිසෙත, සුපිරි වාසනා සම්පත, පවර් ලොටෝ හා සමෘද්ධි යන ලොතරැයිවල ආදායම පහළ ගොස් තිබුණි. ලොතරැයිපත් අලෙවි කිරීම සඳහා දරන ලද ප්‍රචාරණ වියදම සැලකීමේදී සියළුම ලොතරැයිවලට අදාළ ප්‍රචාරණ වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉහළ ගොස් තිබුණි.

(ii) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ලොතරැයි 4 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රචාරණ වියදම් දරා නොතිබූ අතර ගොවිසෙත ලොතරැයියේ ආදායම රු.මිලියන 500 කින් හෙවත් සියයට 11 කින් අඩුවී තිබුණු නමුත් එහි ප්‍රචාරණ වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 49 කින් ඉහළ ගොස් තිබුණි.

(iii) ඉහත දත්ත අනුව රු.මිලියන 5,342 ක ඉහලම ආදායමක් උපයා ඇති මහජන සම්පත ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 2.5 ක් ලෙස පහලම අගයක් ගෙන තිබුණද රු.මිලියන 1,143 ක ආදායමක් උපයා ඇති වාසනා සම්පත ලොතරැයියේ ප්‍රචාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 8.14 ට ආසන්න අගයක් ගෙන තිබුණි.

(iv) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය විසින් පවත්වා ඇති ලොතරැයි දිනුම් වාර සංඛ්‍යාව 247 කින් වැඩිවී තිබුණි. නව ලොතරැයි 04 ක් හඳුන්වාදීම ඒ සඳහා මූලික වශයෙන් හේතුවී තිබූ අතර පවත්වා ඇති ලොතරැයි දිනුම් වාරවල ශුද්ධ වැඩිවීම 33 ක් පමණක් විය.

(ඇ) විධිමත් පරිදි වෙළෙඳපොල අධ්‍යනයකින් තොරව 2014 වර්ෂයේදී වෙළෙඳපොලට හඳුන්වා දී තිබූ පවර් ලොටෝ ලොතරැයියෙන් 2016 වර්ෂය වන විට මණ්ඩලය විසින් දරා ඇති අතිරේක පිරිවැය රු.55,259,129 ක් විය. කෙසේ වුවද, දිගින් දිගටම අලාභ ලැබීම මත එම ලොතරැයිය 2016 වර්ෂයේදී නවතා දමා තිබුණි.

(ඈ) 2016 ජුනි මාසයේදී වෙළෙඳපොලට හඳුන්වා දී තිබූ වාසනා සම්පත සුපර් ෆිෆ්ටි ලොතරැයියද දිනුම් වාර 12 ක් පමණක් පවත්වා 2016 වර්ෂය තුළදීම නවතා දමා තිබූ

අතර වෙළෙඳපොල තුළ පැවති ඉල්ලුම දුර්වල මට්ටමක පැවතීම ඒ සඳහා හේතු වී තිබුණි.

(ඉ) ලොතරැයි මණ්ඩලයට අවශ්‍ය නියෝජිත සංඛ්‍යාව පිළිබඳ පූර්ව සැලසුමක් පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය වූ අතර 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා බඳවාගෙන තිබූ නියෝජිත සංඛ්‍යාව 52 ක් විය. අලෙවි නියෝජිතයන් පත් කිරීමේදී දුෂ්කර ප්‍රදේශ කෙරෙහි අවධානය යොමු වී නොතිබුණු අතර කලාප 13 ක් සඳහා මෙම කාලය තුළ කිසිදු අලෙවි නියෝජිතයකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී හඳුන්වාදී තිබුණු මනුසත් මෙහෙවර නැමැති ලොතරැයිය මගින් එක් ටිකට් පතකට රු.100 බැගින් ලොතරැයිපත් 1,004,000 ක් අලෙවි කිරීමට සැලසුම් කර තිබුණද තත්‍ය වශයෙන් අලෙවි කර තිබුණේ ලොතරැයිපත් 297,564 ක් පමණක් විය. තවද, මෙම ලොතරැයිපත්වල ආදායමෙන් සියයට 39.63 ක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට තීරණය කර තිබුණද එසේ කිරීමකින් තොරව සම්පූර්ණ ආදායම මණ්ඩලයේ ආදායමක් ලෙස සලකා ක්‍රියාකාර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ දිනුම් වාරයකට අදාළ යතුරු පැදියක් හා රු.1,000,000 ක ත්‍යාග නියෝජිතයකුගේ ඉල්ලීම මත ලබා දී නොතිබුණි. මෙසේ ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග ලබා නොදීම හේතුවෙන් පැන නගින මහජන අප්‍රසාදය මණ්ඩලයේ කීර්තිනාමයට අහිතකර ලෙස බලපෑමට ඉඩකඩ ඇති බැව් නිරීක්ෂණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ රු.මිලියන 691 ක් වෙන් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(i) නව විකුණුම් කුටි 25 ක් අළුතින් හඳුන්වා දීම.
(ii) මෝටර් සයිකල් 50 ක් හා යතුරු පැදි 40 ක් මණ්ඩලයේ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීම.
(iii) කොළඹ නගර සීමාව තුළ වෙන්ඩින් යන්ත්‍රයක් (vending machine) සවි කිරීම.

**4.2 ආර්ථික නොවූ ගනුදෙනු**

ආයතනයේ අභ්‍යන්තරයෙන් නෛතික සේවා ලබා ගැනීමේ හැකියාව තිබියදී පිටස්තර ආයතනයකින් එම සේවාව ලබා ගැනීමට කටයුතු කර තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර එවැනි එක් අවස්ථාවක් සඳහා දරා තිබූ වියදම රු.119,000 ක් විය.

**4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යවරයාගේ අනුමැතියකින් හා ගැසට් නිවේදනයකින් තොරව හඳුන්වා දී ඇති නිරෝගා ලොතරැයියේ මුද්‍රිත ජය අංක සහ ලග්න අනුව අවම වශයෙන් එක් දිනුම් වාරයදී ලොතරැයිපත් 1,300,000 ඉක්මවා අලෙවියක් පැවතිය යුතු විය. එහෙත් එක් දිනුම් වාරයක සාමාන්‍ය අලෙවිය වී තිබුණේ 447,198 ක් පමණි. ලොතරැයිපත් අලෙවිය තුළින් උපයන ආදායම ත්‍යාග ලබාදීම සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මණ්ඩලය සතු ත්‍යාග සංචිත අරමුදලින් අතිරේක මුදල් ලබා ගනිමින් තිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී එසේ ලබාගෙන ඇති මුදල රු.4,416,796 ක් විය.

(ආ) ලොතරැයිපත් මුද්‍රණය කිරීමේදී මණ්ඩලය විසින් මුද්‍රණකරුවන්ට ලබාදී ඇති උපදෙස් පිළිපැදීමකින් තොරව කඩදාසිවල පිරිවැය අවම කර ගැනීමට හැකිවන පරිදි මුද්‍රණකරුවන් විසින් කඩදාසි යොදාගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. නියැදි විගණන පරීක්ෂණයට අනුව එක් අවස්ථාවකදී එක් මුද්‍රණකරුවකු විසින් පමණක් ලොතරැයිපත් 39,970,000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් උපයා ඇති අතිරේක ලාභය රු.354,097 ක් බව තහවුරු විය.

(ඇ) මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති අලෙවි නියෝජිතයන්ට ණය පදනම මත ලොතරැයිපත් නිකුත් කිරීමේ දී ඇතිවන අවදානම අවම කර ගැනීම සඳහා එම නියෝජිතයින්ගෙන් ඇප බැඳුම්කර ලබා ගැනීමේ අවශ්‍යතාවය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවධාරණය කර තිබුණි. එහෙත් මණ්ඩලය විසින් අධ්‍යක්ෂක මණ්ඩල තීරණය නොසලකා ඒ සඳහා ණයවර රක්ෂණාවරණයක් හඳුන්වාදී සමාලෝචිත වර්ෂය තුළ ඒ වෙනුවෙන් රු.8,290,055 ක අමතර පිරිවැයක් දරා තිබුණි. එහෙත් මණ්ඩලය යටතේ ලියාපදිංචි වී සිටි නියෝජිතයන් 118 දෙනාගෙන් 27 දෙනෙකු මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් කරගෙන නොතිබුණු අතර ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. විගණනයට ලැබී ඇති තොරතුරු අනුව නියෝජිතයින් 12 දෙනෙකු විසින් මාස 06 ඉක්මවා නොගෙවා ඇති ණය ශේෂය රු.1,819,750 ක් වුවද එම ණය ශේෂ අතුරින් අවදානම් සහිත ණය ශේෂ

හඳුනාගෙන රක්ෂණාවරන මගින් පියවා ගැනීමට කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඇ) 2013 මැයි මාසයේදී ආරම්භ කර තිබු මෙගා පවර් ලොතරැයිය සඳහා තෝරාගත් ලංසුකරු වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමෙන් තොරව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවට මුද්‍රණ කටයුතු පවරා තිබීම නිසා මාසිකව විශාල අලාභයක් මණ්ඩලයට සිදුවන බව නිරීක්ෂණය විය. 2016 සැප්තැම්බර් සිට 2017 පෙබරවාරි මාසය දක්වා එසේ සිදු වී ඇති අලාභය දළ වශයෙන් රු.1,489,289 ක් විය.

(ඉ) 2012 වර්ෂයේදී ආරම්භ කර තිබු සම්පත් රේඛා ලොතරැයිය සඳහා අවස්ථා කිහිපයකදී ආරම්භ කර තිබු ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් පරිදි නිම කිරීමට 2017 ජුනි 30 වන විටද කටයුතු කර නොතිබුණි. මෙම ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2012 වර්ෂයේ සිටම එකම මුද්‍රණකරුවෙකුට පවරා තිබු අතර 2016 ජනවාරි 01 දින සිට 2017 පෙබරවාරි 07 දින දක්වා පමණක් මෙම ලොතරැයිපත් මුද්‍රණයෙන් දළ වශයෙන් මණ්ඩලයට රු.9,089,149 ක පමණ අලාභයක් සිදුවී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඊ) මණ්ඩලය විසින් වෙළෙඳපොළට ඉදිරිපත් කර ඇති ක්ෂණික ලොතරැයි වර්ග දෙකක මුද්‍රණ කටයුතු සඳහා වූ ගිවිසුම්ගත කාලය 2015 මැයි 31 න් අවසන් වී තිබුණද 2017 ජුනි දක්වා නව මුද්‍රණකරුවෙකු තෝරා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ඉටුකර නොතිබුණි.

(උ) මණ්ඩලය විසින් මුද්‍රණය කරවා ගනු ලබන ලොතරැයිපත්වල අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය කිරීමකින් තොරව මුද්‍රණ ඇණවුම් ලබාදීම හේතුවෙන් සෑම දිනුම් වාරයකම මුද්‍රිත ලොතරැයිපත්වලින් සියයට 10 ක පමණ ප්‍රමාණයක් නොවිකිණී ඉතිරිය පැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉතිරිව පැවති ලොතරැයිපත්වල මුද්‍රණ පිරිවැය රු.48,082,180 ක් විය.

(ඌ) මණ්ඩලයේ අරමුදල්වලින් ලබාදී තිබු දේපල ණය වලට අදාළ ඔප්පු 97 ක් වෙනුවෙන් අවලංගු කළ නොහැකි අටෝර්නි බලය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති අලෙවි නියෝජිතයින් 118 දෙනාගෙන් 31 දෙනෙකු පමණක් ඇප බැඳුම්කර තබා තිබුණු අතර ඇප තබා ඇති අලෙවි නියෝජිතයින් වෙත ඇප සීමාව ඉක්මවා රු.85,248,254 ක ලොතරැයිපත් ලබා දී තිබුණි. ඇප බැඳුම්කර තබා නොතිබුණු අලෙවි නියෝජිතයින්ට රු.424,619,373 ක් වටිනා ලොතරැයිපත් නිකුත් කර තිබුණි.

(ආ) නියෝජිතයන් අතර ලොතරැයිපත් බෙදාහැරීම, අලෙවියෙන් පසු ඉතිරි ලොතරැයිපත් පිළිබඳ දැනුම් දීම යනාදි තොරතුරු විද්‍යුත් තැපැල් මගින් (e mail) සන්නිවේදනය කිරීම සඳහා මණ්ඩලය විසින් මාසිකව රු.572,000 ක් වැයකර සන්නිවේදන ජාලයක් හඳුන්වා දී තිබුණි. එහෙත් ඇතැම් අලෙවි නියෝජිතයන් විසින් එම සන්නිවේදන ජාලය පරිහරණය කිරීමකින් තොරව විවිධ ආකාරයෙන් අදාළ තොරතුරු සන්නිවේදනය කිරීම නිසා තොරතුරුවල විශ්වාසනීයත්වය සහ ප්‍රමාදය මණ්ඩලයේ කටයුතුවලට බාධාවක්ව පැවති බව නිරීක්ෂණය විය. තත්ත්වය නිවැරදි කිරීම සඳහා මණ්ඩලය විසින්ද විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවත් නිරීක්ෂණය නොවිය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ අලෙවි ඉලක්කය රු.බිලියන 20 ක් වූ අතර එම ඉලක්කය සංඛ්‍යාත්මකව සපුරාගෙන තිබුණද විගණනයේදී සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව, ඒ තුළ ඇතුළත් රු.මිලියන 358.43 ක් වටිනා ක්ෂණික ලොතරැයිපත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ණය පදනම මත අලෙවි නියෝජිතයන්ට නිකුත් කර තිබුණි. 2017 මැයි වන විටත් අදාළ ණය මුදල් අලෙවි නියෝජිතයන් විසින් මණ්ඩලයට පියවා නොතිබියදී හා එයින් රු.19,673,300 ක ටිකට්පත් 2017 ජූනි මාසයේදී ආපසු ගබඩාවට භාරදී තිබියදී ණය පදනම මත අලෙවි කර ඇති එම ලොතරැයි ආදායම මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට විශේෂ දිරිදීමනාද ගෙවා තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන ලොතරැයි අතුරින් වැඩිම අලෙවියක් ඇති මහජන සම්පත ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2008 වර්ෂයේ සිට මේ දක්වාම රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව විසින් ඉටු කර තිබුණද ඒ සඳහා ලිඛිත ගිවිසුමක් නොවිය. මණ්ඩලයේ ලොතරැයිපත් මුද්‍රණ කටයුතු සඳහා 2016 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් එක් ටිකට්පතක් මුද්‍රණය කිරීම සඳහා ලැබී ඇති අවම මිල රු.0.3570 ක් වුවද රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත එක් ලොතරැයිපතක් මුද්‍රණය කිරීම වෙනුවෙන්

රු.0.5021 ක් ගෙවමින් පැවතුණි. තරඟකාරී මිල ගණන් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් 2016 වර්ෂය වෙනුවෙන් පමණක් මහජන සම්පත ලොතරැයිපත් මුද්‍රණයෙන් සිදුවිය හැකි ඇස්තමේන්තුගත අලාභය දළ වශයෙන් රු.41,703,626 ක් පමණ විය.

(ඉ) 2015 වර්ෂයේදී හඳුන්වාදී තිබූ නිරෝගා ලොතරැයියේ මුද්‍රණ කටයුතුද රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවට පවරා දී තිබුණු අතර විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් මුද්‍රණකරුවෙකු තෝරා ගැනීම සඳහා මේ දක්වා මණ්ඩලය විසින් ක්‍රියාකර නොතිබුණි. ලොතරැයිපතක වර්තමාන මුද්‍රණ පිරිවැය රු.0.6637 ක් වූ අතර එම පිරිවැය සංයුතිය පිළිබඳ මණ්ඩලයට කිසිදු අදහසක් නොවීය. ලොතරැයිපත් මුද්‍රණය සඳහා 2016 වර්ෂයේදී සිදුකර ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව මෙවැනි එක් ලොතරැයිපතක් මුද්‍රණය කිරීම සඳහා ලැබී තිබුණු අවම ලංසුව රු.0.3570 ක් විය. 2016 වර්ෂය වෙනුවෙන් පමණක් නිරෝගා ලොතරැයිපත් මුද්‍රණයෙන් සිදුවිය හැකි ඇස්තමේන්තුගත අලාභය දල වශයෙන් රු.23,011,087 ක් පමණ විය.

(ඊ) මණ්ඩලය විසින් එහි ගිණුම් කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් 2003 වර්ෂයේදී හඳුන්වා දී තිබූ මධ්‍යගත Sage ACCPAC නැමැති පරිගණක මෘදුකාංගය සමාලෝචිත වර්ෂයේදී රු.224,000 ක් වැයකර විමධ්‍යගත කර තිබීම හේතුවෙන් එම මෘදුකාංගයෙන් ලබාගත හැකි සේවාවන් සීමිත වී තිබුණි. කලින් පැවති මධ්‍යගත ක්‍රමය මගින් ආයතනයේ ගනුදෙනු පිළිබඳව පැවති විශ්වාසනීයත්වයද මෙම විමධ්‍යගත ක්‍රමය යටතේ ප්‍රශ්නගත වී තිබුණු අතර, අදාළ වෙනස් කිරීම් නිසා ඇතිවන අවදානම්වල වගකීම භාර ගැනීම මෙම මෘදුකාංගය හඳුන්වාදුන් සමාගමද ප්‍රතික්ෂේප කර තිබුණි.

## 4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 මැයි මාසයේදී ගොවිසෙත 1293 ලොතරැයි දිනුම් වාරයට අදාළ ලොතරැයිපත් මුද්‍රණයේදී එකම අංක සහිත ලොතරැයිපත් දෙවරක් මුද්‍රණය වීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර අදාළ මුද්‍රණකරුට එරෙහිව ක්‍රියාකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහජන සම්පත 3328 වැනි දිනුම් වාරය සඳහා ත්‍යාග ලෙස නවතම මෝටර් රථයක් (Brand New) ප්‍රදානය කිරීමට මණ්ඩලය විසින් තීරණය කර තිබුණද ත්‍යාග ලාභියා වෙත ප්‍රදානය කර තිබුණේ පාවිච්චි කළ (Re Condition) වාහනයකි. මෙම වාහනය අදාළ නියෝජිත ආයතනයෙන්ම මිළදී ගෙන ඇතත් එය ආනයනය කර ඇත්තේ නියෝජිත ආයතනය මගින් නොව වෙනත් පෞද්ගලික පාර්ශවයන් විසින් බව ලිපි ලේඛන අනුව

නිරීක්ෂණය විය. එසේ වෙනත් පාර්ශවයක් විසින් ආනයනය කළ වාහනයක් දේශීය නියෝජිත ආයතනය මාර්ගයෙන් මිළදී ගැනීම හේතුවෙන් ත්‍යාගලාභියා වෙත පාවිච්චි කළ වාහනයක් ප්‍රදානය කිරීම සිදුවීම විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය. එසේම මණ්ඩලය විසින් මෙම වාහනය සඳහා රු.6,800,000 ක පිරිවැයක් දරා තිබුණද රේගු ලියකියවිලි අනුව එම වටිනාකම රු.5,891,268 ක් වී තිබුණි.

(ඇ) ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව සම්පූර්ණයෙන්ම පැවරී නොතිබියදී මණ්ඩලය විසින් එහි නිලධාරියෙකුට රු.774,480 ක නිවාස ණය මුදලක් ලබාදී තිබු අතර නිවස ඉදිකිරීමට යෝජිත ඉඩම එම ඉඩමේ හිමිකරු විසින් ජීවිත භුක්තිය තබාගෙන නිලධාරියාට පවරා දී තිබුණි. ඉඩමේ හිමිකරු විසින් විසින් එම ඉඩමේ භුක්තිය ඉවත් කරගෙන ඉඩමේ අයිතිය නිලධාරියාට පවරනු බවට වූ ලිඛිත ප්‍රකාශයක් පෞද්ගලික නීතිඥ සමාගමක් මාර්ගයෙන් ඉදිරිපත් කර තිබුණි. එහෙත් පසුව අදාළ දේපලේ භුක්තිය නැවත ඉල්ලා එම පාර්ශවය විසින් උසාවියේ නඩුවක් පවරා තිබු අතර එහි පාර්ශවකරුවෙකු ලෙස මණ්ඩලය නම්කර තිබුණි. මණ්ඩලය තුල වෘත්තිය සුදුසුකම් ලත් නීතිඥයෙකු සිටියදී මෙම නඩුවේ නඩුවාර 09 ක් සඳහා මණ්ඩලය විසින් රු.184,475 ක් නීතිඥ ගාස්තු ලෙස බාහිර නීතිඥයන්ට ගෙවා තිබුණි.

4.6 **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළඳ සන්නාමකරණය සඳහා මණ්ඩලය විසින් 2015 දෙසැම්බර් 31 දින රු.7,650,000 ක් වැයකර මිලදීගත් ට්‍රක් රථ 02 ක් එම කාර්යය සඳහා යොදා නොගෙන 2017 මැයි 26 දින වන විටද ආයතන භූමියේ ගාල්කර තිබු අතර මණ්ඩලය සතු අංක BMW (A1) 5860 මෝටර් රථය වර්ෂය පුරාම නිෂ්කාර්යව පැවතුණි.

(ආ) මණ්ඩලයේ ගබඩා තොග පාලනය සහ වාහන පාලනය සඳහා 2012 වර්ෂයේදී මිලදීගෙන තිබුණු පිළිවෙලින් රු.668,460 ක් හා රු.740,000 ක් වටිනා පරිගණක මෘදුකාංග 02 ක් භාවිතයට ගෙන නොතිබුණි.

4.7 **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති මණ්ඩලයේ සම්පත්**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාර මණ්ඩලය සතු සම්පත් රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබා නොදිය යුතු වුවද ඊට පටහැනිව මණ්ඩලය සතු රු.5,660,000 ක් වටිනා මෝටර් රථ 2 ක් හා මෝටර්

බයිසිකලයක්ද, මණ්ඩලයේ නිලධාරීන් 6 දෙනෙකු ද මුදල් අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට මුදා හැර තිබුණි. තවද, එම නිලධාරීන් වෙත මණ්ඩලයෙන් ගෙවා තිබූ සේවක පාරිශ්‍රමික හා දිරි දීමනා රු.1,621,952 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.8 **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ප්‍රකාරව මානව සම්පත් කලමනාකරණය සඳහා වූ අත්පොතක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 384 ක් වූ අතර තත්‍ය වශයෙන් ස්ථිර කාර්ය මණ්ඩලය 311 ක් වූයෙන් අනුමත ස්ථිර තනතුරු 71 ක පුරප්පාඩු පැවතුණි. එසේම, අනුමත කොන්ත්‍රාත් තනතුරු සංඛ්‍යාව 20 ක් වුවද තත්‍ය වශයෙන් 76 දෙනෙකු බඳවාගෙන තිබීම හේතුවෙන් අනුමත සීමාව ඉක්මවා 56 දෙනෙකු සේවයට බඳවාගෙන තිබුණද ඒ සඳහා ලබාගත් නිශ්චිත අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) මණ්ඩලයට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය අනුව වයස අවුරුදු 45 ඉක්මවූ අය රියදුරු තනතුරු සඳහා බඳවා නොගත යුතු වුවද වයස අවුරුදු 52 ඉක්මවූ අයකු රියදුරු තනතුරක් සඳහා බඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය. එසේම, එම තනතුරු සඳහා නියමිත අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට වූ සාක්ෂිද අදාළ ගොනු තුළ නොවිය.

(ඇ) ආයතනයේ පුරප්පාඩුව පැවති ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීම් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී නිලධාරියෙකු බඳවාගෙන තිබූ අතර ඔහු වෙත තනතුරට හිමි මූලික වැටුපට අමතරව අතිරේක වැටුප් වර්ධක 14 ක්ද ලබාදී තිබුණි.

4.9 **හඳුනාගන්නා ලද පාඩු**

ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මුද්‍රණ කරනු ලබන ලොතරැයිපත්වල පැවතිය යුතු ප්‍රමිත විශාලත්වය පිළිබඳ (Size) පූර්ව නිගමනයන්ට නොපැමිණීම හේතුවෙන් ඇතැම් ලොතරැයිපත් මුද්‍රණයේදී විශාල වශයෙන් අලාභයන් සිදුවන බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී හඳුන්වා දී ඇති ලොතරැයි 02 ක් සඳහා එසේ අතිරේකව දරා ඇති ඇස්තමේන්තුගත පිරිවැය රු.30,379,949 ක් පමණ විය.

4.10 වෙළෙඳපොළ කොටස

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන දෙකක් වූ ජාතික ලොතරැයි මණ්ඩලය හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් ලොතරැයි අලෙවි කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොල කොටස සියයට 56.84 ක් වී තිබූ අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොල කොටස සමග සැසඳීමේදී එය 2015 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 2 කින් පහළ ගොස් තිබුණි. තවද 2011 වර්ෂයේ සිට එය වාර්ෂිකව උච්චාවචනය වී තිබූ බව නිරීක්ෂණය වූ අතර විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලොතරැයි විකුණුම් ආදායම | | ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොල කොටස |
|---|---|---|---|
| | ජාතික ලොතරැයි මණ්ඩලය | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | |
| | රු.මිලියන | රු.මිලියන | % |
| 2016 | 20,170 | 15,314 | 56.84 |
| 2015 | 17,394 | 12,265 | 58.65 |
| 2014 | 15,153 | 12,592 | 54.62 |
| 2013 | 14,537 | 10,611 | 57.80 |
| 2012 | 12,024 | 10,668 | 52.98 |
| 2011 | 10,092 | 8,335 | 54.76 |

**4.11** අරමුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතු බැංකු ජංගම ගිණුම් 05 ක මාස 06 ක කාලයක සිට රු.මිලියන 2 ක සාමාන්‍ය මුදල් ශේෂයක් පවත්වාගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ජංගම ගිණුම්වල පැවති මුදල් ශේෂ එකතුව රු.8,926,894 ක් විය. ඒ අනුව බැංකු ජංගම ගිණුම්වල නිෂ්කාර්යව පවතින මුදල් ඵලදායි ආයෝජනයක යෙදවීමේ හැකියාව පිළිබඳ මණ්ඩලයේ අවධානය යොමුවී ඇති බවත් නිරීක්ෂණය නොවිය.

(ආ) මණ්ඩලය විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රැස්කිරීමේ ගිණුමට අලෙවි නියෝජිතයින් විසින් මුදල් තැන්පත් කිරීමේදී බැංකුව විසින් සියයට 0.05 ක සේවා ගාස්තු වශයෙන් එකතුව රු.40,212,740 ක් අයකර තිබුණද ඒ පිළිබඳ මණ්ඩලය විසින් කිසිදු අවධානයක් යොමුකර නොතිබුණි.

**4.12 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම දුර්වලතා**

මණ්ඩලය සතු පරිගණක පද්ධතියේ පවතින පහත දෝෂ මගහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(අ) එක් එක් දිනය අවසානයේදී නොවිකුණු ටිකට් සම්බන්ධයෙන් අලෙවි නියෝජිතයන් විසින් මණ්ඩලය වෙත එවනු ලබන විද්‍යුත් තැපැල් පණිවිඩය පරිගණක පද්ධතිය මගින් දෙවරක් බිල්පත්‍ර ලෙස මුද්‍රණය වීම.

(ආ) පරිගණක පද්ධතියට දත්ත ඇතුල් කරන සහ දත්ත වෙනස් කරන පුද්ගලයින්ගේ අනන්‍යතාවය තහවුරු කරගත හැකිවන පරිදි විධිමත් රහස් අංක ක්‍රමයක් භාවිතා නොකිරීම.

(ඇ) මුද්‍රණය කර ගබඩාවට ලැබී ඇති ලොතරැයිපත් ප්‍රමාණය ඉක්මවා විකුණුම් ඉන්වොයිසි නිකුත් කිරීමේ හැකියාව මණ්ඩලය සතු වර්තමාන පරිගණක පද්ධතියට පැවතීම නිවැරදි කිරීමට කටයුතු නොකිරීම.

(ඈ) අලෙවි නියෝජිතයින් අතර අන්තර් හුවමාරු ටිකට්පත් පිළිබඳ දත්ත පද්ධතියට ඇතුලත් කළ හැකි වන පරිදි පරිගණක පද්ධතිය වැඩිදියුණු කර නොතිබීම. මේ හේතුවෙන් මණ්ඩලය විසින් නිකුත් කළ ටිකට්පත් සම්බන්ධයෙන් අවසාන වගකීම දැරිය යුතු පාර්ශවයන් නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වූ අවස්ථා නිරීක්ෂණය වීම.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධන ඇගයීම් සඳහා කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

**5.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම**

මණ්ඩලය විසින් ලොතරැයිපත් මුද්‍රණය සඳහා වාර්ෂිකව කඩදාසි මෙ.ටොන් 700 කට වැඩි ප්‍රමාණයක් පරිහරණය කරනු ලැබුවද එම ලොතරැයිපත් වෙළෙඳපොලට මුදාහැරීමෙන් පසු පරිසරයට සිදුවන හානිය අවම කිරීම සඳහා කිසිදු විකල්ප ක්‍රියාමාර්ගයක් ගැන අවධානය යොමුකර නොතිබුණි. එසේම මුද්‍රණය කර ඇති ලොතරැයිපත්වලින් නොවිකිණී වාර්ෂිකව ඉතිරිවන තොගය දළ වශයෙන් කඩදාසි මෙ.ටො.70 ක් පමණ වුවද එම තොගය සම්බන්ධයෙන්ද සුදුසු ක්‍රියාමාර්ග නොගෙන මණ්ඩලය සතු ගබඩාවල රඳවා තිබුණි.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී වැඩිපුර ගෙවනලද රු.7,392,287 ක සේවක පාරිතෝෂික මුදල මණ්ඩලයට ආපසු අයකරගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2013 මාර්තු 21 දින නියෝග කර තිබුණද එම මුදල අය කර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ කටයුතු කර නොතිබුණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාළ විශ්‍රාමික නිලධාරීන්ට ලිඛිතව දැන්වීම පමණක් මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 04 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී ලබාදී තිබූ නියෝගය අනුව, මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ පිහිටි පර්චස් 112 ක ඉඩමේ නව ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු විය. එහෙත් 2016 වර්ෂය අවසන වන විටද ගොඩනැගිල්ලේ සැලසුම් කටයුතු සඳහා ගෘහ නිර්මාණ ශිල්පියෙකු තෝරා ගැනීම පමණක් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම මේ දක්වා ආරම්භ කර නොතිබූ අතර 2016 වර්ෂයේදී මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යන ගොඩනැගිලි වෙනුවෙන් ගෙවා ඇති කුලිය රු.25,224,472 ක් විය.

### 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) භාවිතයේ පවතින විමධ්‍යගතකළ පරිගණක තොරතුරු පද්ධතිය මගින් යාවත්කාලීන තොරතුරු ලබා ගැනීම, ගනුදෙනුවේ ඉතිහාසය පරීක්ෂා කිරීම හා එම ගනුදෙනුව ගලායාම පද්ධතිය හරහා සිදුවීම යනාදී පහසුකම් ලබාගත හැකි සේ වැඩිදියුණු කර නොතිබීම. |
| | (ii) අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී අනෙකුත් අංශ හා ගිණුම් තොරතුරු නිවැරදිව සමායෝජනය |

නොවීම, තොරතුරු ද්විකරණය වීම වැලැක්වීමේ ක්‍රමයන් නොවීම හා ජ'නල් සටහන් මගින් පසුව සිදුකරන ගැලපීම් නිවැරදිව යාවත්කාලීන නොවීම. එකම අංකය යටතේ පොදු ජර්නල් වවුචර් 02 බැගින් නිකුත් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) මෙහෙයුම් පාලනය

(i) මණ්ඩලය විසින් අතිරේක මුද්‍රණ ඇනවුම් වාචිකව ලබාදීම, ඇනවුම් කළ ප්‍රමාණ ඉක්මවා සපයන ලද ලොතරැයිපත් ලේඛනගත නොවීම හා මණ්ඩලයේ අනුදැනුමකින් තොරව වැඩිපුර සපයන ලද ලොතරැයිපත් නැවත රැගෙන යාම වැනි අවස්ථා වෙනුවෙන් ලොග් සටහන් පවත්වා නොතිබීම.

(ii) අලෙවි නොකළ ලොතරැයිපත් නියෝජිතයින් විසින් ආපසු මණ්ඩලය වෙත භාර දී නොමැති විට ඔවුන්ගෙන් අයකළ යුතු අධිභාර ගිණුම්ගත කර නොතිබීම.

(iii) ලොතරැයිපත් කාණ්ඩ අංක සාවද්‍ය ලෙස වෙනත් ලොතරැයි බිල්පත්‍රයක මුද්‍රණය කර නිකුත් කිරීමේ හැකියාව අවහිර කිරීමේ ආරක්ෂිත ක්‍රම හඳුන්වා නොදීම.

(ඇ) මානව සම්පත් කළමනාකරණය

උසස්කිරීම් හා බඳවාගැනීම් අදාළ පරිපාටිවලට අනුකූලව සිදු නොකිරීම හා පුරප්පාඩු පවතින තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම සඳහා සැලසුම් සකස්කර නොතිබීම.

(ඉ) ණයගැති පාලනය

විමධ්‍යගත කළ පරිගණක පද්ධතිය මගින් ණයගැති කාල විශ්ලේෂණයන් ලබා ගැනීමට නොහැකි වීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| **පිරිවැටුම** | 3 | 20,170,417,750 | 17,394,463,681 |
| අඩුකළා වක්‍ර බදු | | | |
| එකතු කළ වටිනාකම් මත බදු | | 706,868,280 | 573,252,862 |
| ජාතිය ගොඩනැගීමේ බදු | | 285,776,997 | 253,267,754 |
| **එ. ව. බදු හා ජා. ගො. බදු වලට පසු ශුද්ධ පිරිවැටුම** | | **19,177,772,473** | **16,567,943,065** |
| | | | |
| අඩුකළා : විකුණුම් පිරිවැය | 4 | 16,550,598,052 | 14,238,007,279 |
| **දළ ලාභය** | | **2,627,174,421** | **2,329,935,786** |
| | | | |
| එකතු කළා : වෙනත් ආදායම් | 5 | 249,546,105 | 92,197,950 |
| | | **2,876,720,526** | **2,422,133,736** |
| අඩුකළා : වියදම් | | | |
| විකුණුම් අලෙවි හා බෙදාහැරීමේ පිරිවැය | 6 | 1,246,168,647 | 872,391,364 |
| පරිපාලන වියදම් | 7 | 693,449,471 | 602,377,490 |
| මූල්‍ය පිරිවැය | 8 | 40,212,740 | 36,563,614 |
| **බදු පෙර ලාභ** | | **896,889,668** | **910,801,268** |
| | | | |
| අඩුකළා : ආදායම් බදු වියදම් | 9 | 482,128,237 | 669,785,229 |
| **වර්ෂය සඳහා ලාභ (පාඩු)** | | **414,761,431** | **241,016,039** |
| | | | |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි සටහන් අංක 1 සහ 2 යටතේ ගිණුම්කරන ප්‍රතිපත්ති දක්වා ඇත.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| **වර්ෂය සඳහා ලාභ (පාඩු)** | 414,761,431 | 241,016,039 |
| **බදුවලින් අනතුරුව වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම/(පාඩු)** | | |
| එකතු කළා : ප්‍රත්‍යාගණනය කරන ලද දේපල යන්ත්‍ර උපකරණ මත ලාභ | - | 48,452,076 |
| අඩු කළා : දේපල යන්ත්‍ර උපකරණ විකුණුම් මත ප්‍රත්‍යාගණන ලාභ ගැලපුම් | 5,900,810 | (863,700) |
| අඩු කළා : නිකුත් කරන ලද රන් කාසි මත ප්‍රත්‍යාගණන ලාභ ගැලපුම් | - | (747,503) |
| අඩු කළා : රන් කාසි ප්‍රත්‍යාගණයේ ප්‍රතිවර්තනය | - | (687,833) |
| එකතු කළා : විනිමය විචලනයේ ලාභ / පාඩු | (1,522,862) | 12,568,730 |
| **බදු වලින් අනතුරුව වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **419,139,379** | **299,737,809** |
| | | |

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල යන්ත්‍ර හා උපකරණ | 10 | 796,103,728 | 864,123,447 |
| ගොඩනැගිලි - ක්‍රියාත්මක තත්ත්වයේ පවතින වැඩ - ප්‍රධාන ගොඩනැගිල්ල | | 4,284,000 | - |
| ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු ආදායම් බදු | | - | 566,693,690 |
| ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව - ආයෝජන | | 5,336,575 | 5,336,575 |
| ආයෝජන දේපල | 11 | 30,931,033 | 37,464,022 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | 12,087,719 | 19,832,484 |
| නිවාස ණය | | 63,066,026 | 63,338,989 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **911,809,081** | **1,556,789,207** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 13 | 86,834,181 | 57,446,564 |
| වෙළඳ ලැබිය යුතු | 14 | 523,965,797 | 104,784,716 |
| වෙනත් ජංගම වත්කම් | 15 | 672,007,752 | 724,547,926 |
| මුදල් හා මුදලට සමාන දෑ | 16 | 2,768,310,564 | 3,233,839,295 |
| **මුළු ජංගම වත්කම්** | | **4,051,118,293** | **4,120,618,502** |
| **මුළු වත්කම්** | | **4,962,927,375** | **5,677,407,709** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත** | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | | |
| රඳවාගත් ඉපයීම් | 17 | 522,548,543 | 438,642,364 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ අනිකුත් සංරචක | 18 | 1,351,444,612 | 1,342,203,514 |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | **1,873,993,154** | **1,780,845,876** |
| | | | |
| ජංගම නොවන වගකීම් | | | |
| විලම්භිත බදු | 19 | 54,252,450 | 47,425,591 |
| දිගුකාලීන ප්‍රතිපාදන | 20 | 29,270,262 | 596,032,858 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 83,522,712 | 643,458,449 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 21 | 2,211,328,910 | 2,144,585,386 |
| ගෙවිය යුතු වර්තමාන බදු | 22 | 794,082,602 | 1,100,362,623 |
| බැංකු අයිරා මණ්ඩලීය ගිණුම මහජන බැංකුව | 23 | - | 8,155,373 |
| මුළු ජංගම වගකීම් | | **3,005,411,511** | **3,253,103,382** |
| **මුළු වගකීම්** | | **3,088,934,223** | **3,896,561,831** |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | **4,962,927,375** | **5,677,407,709** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ කටයුතු පිළිබඳ හා 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසරේ ලාභය /(පාඩු) පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදේ.

හර්ෂ බණ්ඩාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම පැවරේ. අත්සන් කළේ මණ්ඩලය වෙනුවෙන්

ශ්‍යාමිලා පෙරේරා
සභාපතිනි
කොළඹ.
2017.02.27

එම් කේ හසන්,
ක්‍රියාකාරී අධ්‍යක්ෂ,

# අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ අරමුදල් ගලායාම** | | |
| බදු පෙර ලාභ | 896,889,668 | 910,801,268 |
| | | |
| **ගැලපීම්** | | |
| ක්ෂයකිරීම් | 142,688,825 | 129,203,466 |
| පාරිතෝෂික | 5,081,980 | 1,081,991 |
| දේපල යන්ත්‍ර හා උපකරණ විකිණිමෙන් ලාභ/(පාඩු) | 1,353,449 | 705,073 |
| පොළී ආදායම් | (244,970,670) | (88,713,366) |
| | **801,043,252** | **953,078,432** |
| ලියා හරින ලද කුලී නැවත ගැනීම්- කලම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ 2008-2015 | 16,000,000 | - |
| ලියා හරින ලද 50 වන සංවත්සර වියදම් නැවත ගැනීම් | 48,766,800 | - |
| විනිමය විචලනයේ ප්‍රතිලාභ | (1,522,862) | 12,568,730 |
| අකර්මන්‍ය තොගවලට මාරු කිරීම | 81,000 | 601,492 |
| ත්‍යාග සංචිතයේ වැඩිවීම් /(අඩුවීම්) | 99,346,909 | 247,406,503 |
| නිවාස ණය (වැඩිවීම්) /අඩුවීම් | 272,963 | 7,682,072 |
| | 963,988,062 | 1,221,337,229 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| තොග (වැඩිවීම්) /අඩුවීම් | (29,387,616) | 92,861,682 |
| වෙළඳ ලැබිය යුතු (වැඩිවීම් )/අඩුවීම් | (419,181,080) | 265,475,828 |
| වෙනත් ජංගම වත්කම් (වැඩිවීම්) /අඩුවීම් | 61,961,789 | (49,922,949) |
| එ. ව. බදු හා ජා. ගො. බදු ගෙවීම් වැඩිවීම් /(අඩුවීම්) | 18,330,961 | 36,766,527 |
| ත්‍යාග ගෙවීම් වැඩිවීම් /(අඩුවීම්) | 255,514,223 | 245,625,834 |
| ඒකාබද්ධ අරමුදලට කරන ලද ගෙවීම් වැඩිවීම් /(අඩුවීම්) | 38,769,176 | 96,203,004 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම් /(අඩුවීම්) | (167,539,876) | 33,597,153 |
| | 722,455,639 | 1,941,944,307 |
| පාරිතෝෂික ගෙවීම් | (5,150,886) | (283,315) |
| ආදායම් බදු හා විලම්භිත බදු ගෙවීම් | (799,912,360) | 9,914,820 |
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **(805,063,246)** | **9,631,505** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරීත්වයේ අරමුදල් ගලායාම** | | |
| දේපල යන්ත්‍ර උපකරණ, ආයෝජන දේපල හා අස්පෘෂ්‍ය වත්කම්වල වැඩිවීම | (63,025,246) | (163,574,915) |
| දේපල යන්ත්‍ර උපකරණවල විකුණුම් ප්‍රතිලාභ | 2,710,443 | 205,000 |
| ලැබුණු පොළී ආදායම් | 235,549,045 | 84,699,911 |
| **ආයෝජන ක්‍රියාකාරීත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **175,234,251** | **(78,670,005)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරීත්වයේ අරමුදල් ගලායාම** | | |
| මහාභාණ්ඩාගාරයට කරන ලද විශේෂ දායකත්වය | (550,000,000) | (50,000,000) |
| මූල්‍ය ක්‍රියාකාරීත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම | **(550,000,000)** | **(50,000,000)** |
| | | |
| වර්ෂය තුල මුදල් හා මුදලට සමාන දෑවල ශුද්ධ වෙනස්වීම | (457,373,356) | 1,822,905,807 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ | 3,225,683,922 | 1,402,778,114 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ** | **2,768,310,564** | **3,225,683,922** |
| **අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්** | | |
| **මුදල් හා මුදලට සමාන දෑ** | | |
| | 2016 | 2015 |
| කෙටිකාලීන ආයෝජන | 2,527,118,556 | 2,832,657,866 |
| අතැති හා බැංකු මුදල් | 241,192,008 | 393,026,056 |
| **වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් හා මුදලට සමාන දෑ** | **2,768,310,564** | **3,225,683,922** |

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | සමුච්චිත භාණ්ඩාගාර අරමුදල | ප්‍රත්‍යාගණන සංචිත රු. | භාණ්ඩාගාර ප්‍රදානය මෝටර්රථ | ගොඩනැගිලි සංචිත රු. | තෑග සංචිත රු. | රඳවාගත් ඉපයීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | **21,263,101** | **287,151,501** | **-** | **-** | **335,229,369** | **433,446,392** | **1,077,090,363** |
| තෑග සංචිතයේ ශුද්ධ වෙනස්වීම් | - | - | - | - | 247,406,503 | - | 247,406,503 |
| දේපල යන්ත්‍ර හා උපකරණවල ප්‍රත්‍යාගණන ලාභ | - | 48,452,076 | - | - | - | - | 48,452,076 |
| දේපල යන්ත්‍ර හා උපකරණ විකුණුම්වල ප්‍රත්‍යාගණන ලාභ සඳහා ගැලපුම්- | - | (863,700) | - | - | - | 863,700 | - |
| නිකුත් කරන ලද රන්කාසි ප්‍රත්‍යාගණන ලාභ ලියාහැරීම | - | (747,503) | - | - | - | 747,503 | - |
| තොග සමග රන්කාසි ප්‍රත්‍යාගණනයේ ප්‍රතිවර්තනය | - | (687,833) | - | - | - | - | (687,833) |
| තෑග සංචිත අරමුදලට ණය පියවීම් | - | - | - | - | 205,000,000 | - | 205,000,000 |
| මහාභාණ්ඩාගාරයට කරන ලද විශේෂ දායකත්වය | - | - | - | - | - | (50,000,000) | (50,000,000) |
| රඳවාගත් ඉපයීම්වලින් මාරු කිරීම් /ගොඩනැගිලි සංචිත | - | - | - | 200,000,000 | - | (200,000,000) | - |
| විනිමය විචලනයේ ලාභ /(පාඩු) | - | - | - | - | - | 12,568,730 | 12,568,730 |
| 2015 වර්ෂය සඳහා ලාභ /(පාඩු) | - | - | - | - | - | 241,016,039 | 241,016,039 |
| 2015.12.31 දිනට ශේෂය | **21,263,101** | **333,304,541** | | **200,000,000** | **787,635,872** | **438,642,364** | **1,780,845,877** |
| තෑග සංචිතයේ ශුද්ධ වෙනස්වීම් | | - | - | - | 99,346,909 | - | 99,346,909 |
| රඳවාගත් ඉපයීම්වලින් මාරු කිරීම් /ගොඩනැගිලි සංචිත | - | - | - | 400,000,000 | - | (400,000,000) | - |
| ලියා හරින ලද කුලී නැවත ගැනීම් - කලම්බු එයාර්පෝට් සුපර්ඩෝ | - | - | - | - | - | 16,000,000 | 16,000,000 |
| 2008 - 2015 | | | | | | | |
| ලියා හරින ලද 50 වන සංවත්සර වියදම් නැවත ගැනීම් | - | - | - | - | - | 48,766,800 | 48,766,800 |
| දේපල යන්ත්‍ර හා උපකරණ විකුණුම්වල ප්‍රත්‍යාගණන ලාභ සඳහා ගැලපුම් | - | (5,900,810) | - | - | - | 5,900,810 | - |
| තෑග සංචිත අරමුදලට ණය පියවීම් | - | - | - | - | 60,000,000 | | 60,000,000 |
| මහාභාණ්ඩාගාරයට කරන ලද දායකත්වය | - | - | - | (550,000,000) | - | - | (550,000,000) |
| මහාභාණ්ඩාගාරයට ප්‍රදාන - මෝටර්රථ - නිසාන් සනී N 17 | - | - | 5,795,000 | | - | - | 5,795,000 |
| විනිමය විචලනයේ ප්‍රතිලාභ | | - | - | - | - | (1,522,862) | (1,522,862) |
| 2016 වර්ෂය සඳහා ලාභ/ (පාඩු) | - | - | - | - | - | 414,761,431 | 414,761,431 |
| 2016.12.31 දිනට ශේෂය | **21,263,101** | **327,403,731** | **5,795,000** | **50,000,000** | **946,982,781** | **522,548,543** | **1,873,993,156** |

**ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**සටහන් අංක 01**

## 1. සංස්ථාමය තොරතුරු

### 1.1 සාමාන්‍ය තොරතුරු

ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී. ඉහත පනතේ සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සහ 1998 අංක 22 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

මෙය මුදල් අමාත්‍යාංශය යටතේ පවතින අර්ධ රාජ්‍ය ආයතනයකි.

ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ කොල්ලුපිටිය ගාලුපාරේ අංක 234/2 දරණ ස්ථානයේය.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන අභිලාශය රජයට ආදායම් උත්පාදනය සඳහා ජාතික ලොතරැයි පැවැත්වීමයි.

### 1.3 මුදල් කාල පරිච්ඡේදය

මණ්ඩලයේ මූල්‍ය කාලපරිච්ඡේදය වන්නේ 2016 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස දොළහක කාලපරිච්ඡේදයයි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද නව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත(SLFRS/ LKAS) අනුකූලව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැදේ. ක්‍රියාකාරි අධ්‍යක්ෂ වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ සටහනෙහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම දක්වා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනවල පහත සංරචක අඩංගු වේ.

- විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඇතුලත් වේ.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය වර්ෂය අවසානයේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරයි.
- ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්කම් ප්‍රකාශය සමාලෝචිත වර්ෂයෙහි මණ්ඩලයේ අරමුදල්වල වෙනස්වීම් විස්තර කරයි.
- අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් හා මුදලට සමාන දෑ උත්පාදනය සඳහා මණ්ඩලයට ඇති හැකියාව හා මෙම අරමුදල් උපයෝජනයේ අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු සපයයි.
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනිකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් වේ.

## 2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 2.1 සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

#### 2.1.1 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS) අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම හා සත්‍ය වටිනාකම් පදනම යටතේ උපචිත පදනමට ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 පෙබරවාරි 27 දින අධිකාරි බලය පවරන ලදි.

#### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2016 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ පිලියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS & SLFRS) සහ 1963 අංක 11 දරණ මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලවය.

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 01 වන දා සිට බලාත්මක වන පරිදි වහාම ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මණ්ඩලය පිළියෙල කරනු ලැබූ පළමු මූල්‍ය ප්‍රකාශ වන්නේය. මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කොට ඇති ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සමග ප්‍රමාණාත්මකව අභිසාරී වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මුල් වරට සම්මත කර ගැනීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 අදාළ කර ගෙන ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වෙත සංක්‍රාන්තිය මීට පෙර වාර්තා කරන ලද මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහ වෙත බලපෑමක් ඇති කර ඇති නමුදු එම මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර ඇති පරිදි ඒ සඳහා නිසි පරිදි ගැලපීම් කර ඇත.

#### 2.1.3 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් තක්සේරුවක් කර ඇති අතර අස්තිත්වය ඈවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට ඔවුන් අපේක්ෂා නොකරයි. පූර්වේක්ෂිත අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු දිගටම පවත්වාගෙන යාමට සම්පත් තමන් සතු බවට කළමනාකාරීත්වය සෑහීමකට පත් වෙයි. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව මත සැලකිය යුතු සැකයන් පහළ කරන්නා වූ කිසියම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳ කළමනාකාරීත්වය නොදනී. එබැවින් අඛණ්ඩ පැවැත්ම පදනමක් මත මූල්‍ය ප්‍රකාශ නොකඩවා පිළියෙල කරනු ලැබේ.

#### 2.1.4 සන්සන්දනාත්මක තොරතුරු

මණ්ඩලය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව යොදාගෙන ඇති අතර ඒවා පෙර වසරේ ප්‍රතිපත්ති සමග සංගත වේ. ප්‍රවර්තන වසරේ ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය තන්හිදී පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ නැවත සකස් කර හා ප්‍රතිවර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 – මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.ප්‍රකාරව පෙර වසරේ ගිණුම්කරණ ප්‍රමිති සමග මණ්ඩලය විසින් මෙම ප්‍රමිති සංගතව ආදේශ කොට ඇත.

### 2.1.5 විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු

සියලු විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු "ගනුදෙනුව සිදුකළ අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට (එතැන් විනිමය අනුපාතය) වාර්තාකරණ ව්‍යවහාර මුදල් ඒකකය මත ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ සහ මූල්‍ය අයිතම වසර අවසාන විනිමය අනුපාතයන්ට ප්‍රති මැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන් " ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබේ.
විදේශ ව්‍යවහාර මුදලින් සඳහන් කර ඇති මූල්‍ය වත්කම් හෝ බැරකම් "වසර අවසාන එතැන් විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලින් සමාන අගයට පරිවර්තනය කරනු ලබන අතර" එයින් ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කරනු ලැබේ.

### 2.1.6 මැනීමේ පදනම

- මූල්‍ය තත්ත්වය පිලිබඳ වාර්තාවේ පහත දැක්වෙන ද්‍රව්‍යමය අයිතම හැරුණු විට, මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය ප්‍රකාරවය.
- ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.
- නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා බැරකම්, නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ සහ හඳුනා නොගත් ආයු ගණන වැනි එකතුව,අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණක අලාභයෙන් අඩු කොට වත්මන් වටිනාකමට හඳුනාගනු ලැබේ.
- විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.
- මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නාවූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

### 2.1.7 ව්‍යවහාර සහ වාර්තාකරණ මුදල් ඒකක

මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර ඇති අයිතමයන් මනිනු ලබන්නේ මණ්ඩලය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් ඒකකය භාවිතා කරමිනි. (ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල් ඒකකය) මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ මණ්ඩලයේ ක්‍රියාකාරී ව්‍යවහාරික හා වාර්තාකරණ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ ක්‍රියාකාරී ව්‍යවහාරික හෝ වාර්තාකරණ මුදල් ඒකකයේ වෙනසක් සිදුව නොමැත.

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇති විටෙක හැර, රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්නම රුපියලට වටයා ඇත.

### 2.1.8 ප්‍රමාණාත්මක බව සහ සමාහරණය

සමාන අයිතමයන්ගේ එක් එක් ද්‍රව්‍යමය පංතිය මූල්‍ය ප්‍රකාශනයන්හි සමුච්චිතව ඉදිරිපත් කර තිබේ. මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම් පිලිබඳව වූ ශ්‍රී.ලං.ගි.ප්‍ර.1 මගින් අවසර දී ඇති පරිදි වැදගත් නොවන්නේ නම් පමණක් ස්වභාවයෙන් හෝ කර්තව්‍යයෙන් වෙනස් අයිතම වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම සඳහා බලාත්මක කළ හැකි නෛතික හිමිකමක් පවතින විට සහ ශුද්ධ පදනම මත පියවීම සඳහා චේතනාවක් ඇති විට හෝ වගකීම් පියවීම හා වත්කම් උපලබ්ධිය එක විටම සිදුවීමේදී මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කිරීම හා ශුද්ධ අගයන් මූල්‍ය ප්‍රකාශ තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කිරීම සිදු කරයි. මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත අනාවරණයකදි හා අවශ්‍යතාවයකට හැර ආදායම් ප්‍රකාශනයේ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු නොකරයි.

### 2.1.9. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන

#### (අ) විනිශ්චයන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම වැදගත් බලපෑම සහිත, ඇස්තමේන්තු පිළිබඳ විනිශ්චයන් හැරුණු විට,කළමනාකාරිත්වය පහත සඳහන් විනිශ්චයන් කර තිබේ.

#### (ආ) ඇස්තමේන්තු හා උපකල්පන

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තා කර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන්ට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවන සැලකිය යුතු අවදානමක් සහිත අනාගතයට අදාල වැදගත් උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවේ අනෙකුත් වැදගත් මූලාශ්‍ර සැලකිල්ලට ලක් කර තිබේ.

## 2.2 වත්කම් සහ ඒවායේ තක්සේරු කිරීම් පදනම්

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සියලු කාල සීමාවන්ට සංගතව ආදේශ කර ඇත.

### 2.2.1 දේපල, පිරියත සහ උපකරණ

#### හඳුනාගැනීමේ පදනම

අනාගත ආර්ථික ප්‍රතිලාභයක් වත්කම් තුලින් ගලා ඒම පිළිබඳව භව්‍යතාවයක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි විටකදී, දේපල, පිරියත හා උපකරණ වත්කම් සේ හඳුනාගනු ලැබේ.

#### මැනීමේ පදනම

#### (අ) පිරිවැය

සියලු දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩු කර පිරිවැයටය. වත්කම් අත් කර ගැනීම සඳහා ඍජුව ආරෝපණීය වියදම් පිරිවැයට ඇතුලත් වේ. මණ්ඩලය විසින් ඉදිකළ වත්කම්වලට අමුද්‍රව්‍ය පිරිවැය සහ ඍජු ශ්‍රම පිරිවැය සහ අදාළ වත්කම අපේක්ෂිත පරිහරණ තත්ත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය සහ එම ඉදිකිරීමට කරන ලද වැඩ බිමෙහි යම් ඉවත් කිරීම් සහ බැහැර කිරීම් සඳහා දරන ලද පිරිවැය සහ හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලනු ලබන්නේ නම් දිගුකාලීන ඉදිකිරීම් සඳහා ප්‍රාග්ධනගත කළ ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ.

අනෙකුත් සියළු අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය දරනු ලබන අවස්ථාවේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිලිගනු ලැබේ.වත්කම භාවිතයෙන් පසුව එය භාවිතයෙන් ඉවත් කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනයක හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් අදාළ වත්කමේ පිරිවැයෙහි අන්තර්ගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටස් කාලාන්තරව ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන විටදී,ප්‍රතිස්ථාපනය කළ කොටස මණ්ඩලය ඉවත් කර නව කොටස හා ඒ හා ආශ්‍රිත ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීම පිළිගනු ලැබේ. එපරිද්දෙන්ම, ප්‍රධාන පරීක්ෂාවක් සිදු කරනු ලැබීමේදී, හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම්, එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස පිරියතේ සහ උපකරණයේ ධාරණ වටිනාකමේ හඳුනාගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරනු ලැබූ විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

වත්කම භාවිතයෙන් පසු එය භාවිතයෙන් ඉවත්කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනය සඳහා හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් ඒ ඒ වත්කමේ පිරිවැයෙහි ඇතුලත් කරනු ලැබේ.

## (ආ) ප්‍රත්‍යාගණනය

වත්කම් මනිනු ලබන්නේ වත්කම මත සමුච්චිත ක්ෂයවීම සහ ප්‍රත්‍යාගණන දිනයෙන් පසු හඳුනාගනු ලබන හානි අලාභ අඩු කොට සාධාරණ වටිනාකමටයි. ප්‍රත්‍යාගණනය කළ වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම සඳහා ගණනය කිරීම් සැලකිය යුතු වාර ගණනකින් සිදු කරනු ලැබේ.

ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක්, අනෙකුත් විස්තීර්ණ ආදායමේ කලින් හඳුනා ගනු ලැබූ එම වත්කමේම ප්‍රත්‍යාග ණන අඩුවීමක් එය ප්‍රතිවර්තකරණ ප්‍රමාණයට හැර අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලබන අතර, එවන් අවස්ථාවකදී වැඩිවීම අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ. ප්‍රත්‍යාගණන හිඟයක්, වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ හඳුනාගනු ලබන එම වත්කම් මතම පවත්නා අතිරික්තයන් එය හිලව් කරන
ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ.

වත්කමක ප්‍රත්‍යාගණනය කළ ධාරණ වටිනාකම මත පදනම් ක්ෂයවීම සහ වත්කමේ මුල් පිරිවැය පදනම් ක්ෂයවිම අතර වෙනස සඳහා වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට වාර්ෂික පැවරුමක් සිදු කරනු ලැබේ. ඊට අතිරේකව, ප්‍රත්‍යාගණන දිනයට සමුච්චිත ක්ෂයවීම වත්කමක දළ ධාරණ වටිනාකමේ ප්‍රමාණයට ඉවත් කරන අතර ශුද්ධ වටිනාකම වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකමට නැවත ප්‍රකාශ කරනු ලැබේ. බැහැර කිරීමේදී, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාල කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

සියලු දේපල, පිරියත හා උපකරණ ආරම්භයේදී පිරිවැයට වාර්තාකරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ තදනන්තරව ප්‍රත්‍යාගණනය කිරීමේදී, කළ හැකි සෑම විටකදීම එවැනි වත්කම්වල සමස්ත පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

ජාතික ලොතරැයි මණ්ඩලයේ වාහන, පරිගණක හා උපාංග, කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් තදනන්තරව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ රජයේ තක්සේරුකරු වාරිකව සිදුකරන තක්සේරු පාදකව සාධාරණ වටිනාකමට දරනු ලැබේ. 2015 වසරේ දී තක්සේරුව අවසන් කරන ලදී. මීළඟ ප්‍රත්‍යාගණනය 2020 වර්ෂයේ දී සිදුකරනු ලැබේ.

## (ඇ) ක්ෂයවිම

ක්ෂයවීම පදනම්ව ඇත්තේ වත්කමක පිරිවැයෙන් එහි අවශේෂ වටිනාකම අඩු කිරීමෙනි.එක් එක් වත්කම්වල සැලකිය යුතු සංරචක තක්සේරු කරනු ලබන අතර යම් සංරචකයකට එම වත්කමේ ඉතිරි ඒවායින් වෙනස් ප්‍රයෝජ්‍ය ආයු කාලයක් තිබේ නම්, එම සංරචකය වෙනම ක්ෂය කරනු ලැබේ.

ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය ගණනය කරනු ලබන්නේ, සින්නක්කර ඉඩම් හැර සියලු දේපල, පිරියත හා උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමය භාවිතා කිරීමෙන් වන අතර එසේ කරනුයේ එම වටිනාකම් ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ලියා හැරීමටය.

කල්බදු වාරය අවසානයේදී මණ්ඩලය විසින් හිමිකාරීත්වය ලබාගන්නා බවට සාධාරණ ලෙස නිශ්චිත වන්නේ නම් මිස මූල්‍ය කල්බදු යටතේ දරනු ලබන වත්කම් කල්බදු වාරයේ වඩා කෙටි වාරය සහ ඒවායේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්ෂය කරනු ලැබේ.

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය ප්‍රයෝජනය සඳහා ගත හැකි අවස්ථාවේ සිටවන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත කරන දිනය යන දිනවලින් කලින් පැමිණෙන දිනයේය. වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයුකාල සහ ක්ෂය කිරීමේ ක්‍රමවේද සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේම සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය නම් පමණක් වෙනස් කරනු ලැබේ.

පෙර වසරවල අනුපාත හා සංගත මෙම කාර්යය සඳහා යොදා ගනු ලැබූ මූලික වාර්ෂික අනුපාත පහත පරිදි වේ.

| | වාර්ෂිකව % |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 5 |
| දිනුම්ඇදීම සඳහා ගන්නා බැරල, ලොතරැයි උපකරණ | 20 |
| මෝටර් රථ | 25 |
| ගෘහභාණ්ඩ හා උපාංග | 10 |
| පරිගණක | 25 |
| වායු සමීකරණ, සාමාන්‍ය සහ කාර්යාල උපකරණ | 20 |

### (ඇ) පසුකාලීන පිරිවැය

දේපල, පිරියත හා උපකරණයක කොටස් ප්‍රතිෂ්ඨාපනය සඳහා දරන ලද පිරිවැය වත්කමේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එම කොටස හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය තුලට ලැබීමේ හව්‍යතාවයක් ඇත්නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් පමණි. පහත දී ඇති ඉවත් කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රකාරව, ප්‍රතිස්ථාපනය කරනු ලැබූ කොටස්වල ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ එදිනෙදා සේවා කිරීමේ පිරිවැය ඒවා දරනු ලබන විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

### (ඈ) ඉවත් කිරීම

මුලින් හඳුනාගත් දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් සහ ඒවායේ යම් වැදගත් කොටසක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විටදී ඉවත් කරනු ලැබේ. විකිණීමේදී හෝ වත්කම ඉවත් කිරීම මත මතුවන කිසියම් ප්‍රතිලාභයක් හෝ අලාභයන් (බැහැර කිරීමෙන් ලත් ශුද්ධ මුදල් සහ වත්කම් ධාරණ වටිනාකම අතර වෙනස) වත්කම ඉවත් කරනු ලැබූ විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයු කාල, ක්ෂය කිරීමේ ක්‍රම වේද සමාලෝචනය කරනු ලබන අතර, යෝග්‍ය නම් ප්‍රතිපත්ති, සම්පාදකයන් සඳහා මූල්‍ය ප්‍රකාශවල සපයා ඇති තොරතුරුවල අදාලත්වය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීම පිණිස ඉදිරිකාලීනව ගලපනු ලැබේ.

### (ඉ) පුනස්ථාපන පිරිවැය

ආරම්භයේදී තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ නඩත්තු කිරීම පිණිස දේපල, පිරියත සහ උපකරණවල අළුත්වැඩියා හෝ නඩත්තුව සඳහා දරන ලද වියදම්, දරනු ලැබූ අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

### 2.2.2 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ, වත්කම පළමු උපයෝජන අවස්ථාවේදී අදාල වත්කම් ගිණුමට පවරනු ලැබේ. නොනිමි ප්‍රාග්ධන පිරිවැය යනු මිලදීගැනීමේ හෝ ඉදිකිරීමේ හා ඒ ආශ්‍රිත වෙනත් ඕනෑම වියදමක් සහිත පිරිවැය වේ.

ස්ථිර ස්වභාවයේ නොනිමි ප්‍රාග්ධන වැඩ මත හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාවය ඉහළ නැංවීම පිණිස දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් සේ සලකා තිබේ.

නොනිමි ප්‍රාග්ධන වැඩ පළමු උපයෝජන අවස්ථාවේදී හෝ වත්කම සක්‍රිය සේවය සඳහා යෙදවූ අවස්ථාවේදී අදාළ වත්කමේ ගිණුමට පවරනු ලැබේ.

### 2.2.3 අස්පෘශ්‍ය වත්කම්

#### පරිගණක මෘදුකාංග

වෙන් වෙන්ව අත්කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට මූලික හඳුනාගැනීම මත මනිනු ලැබේ. මූලික පිළිගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් කිසියම් සමුච්චිත ක්‍රමක්ෂයක් සහ සමුච්චිත හානි අලාභයක් අඩු කර පිරිවැයට ගණනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් යනු කුලිය සඳහා හෝ පරිපාලන කාර්යය සඳහා භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනයේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා දරනු ලැබූ භෞතික ද්‍රව්‍යය නොමැති හඳුනාගත හැකි මූල්‍ය නොවන වත්කමකි.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනයට ආයු කාලය පරිමිත හෝ අපරිමිත සේ තක්සේරු කරනු ලැබේ. පරිමිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය මත ක්‍රමක්ෂය කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම හානි වී ඇත්තේ යැයි පෙන්නුම් කිරීමක් තිබෙන කවර හෝ අවස්ථාවක හානිය අගයනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂ කාලසීමාව සහ ක්‍රමක්ෂ ක්‍රමවේදය යටත්පිරිසෙයින් එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් වාර්ෂිකව 25% අනුපාතයට ක්‍රම ක්ෂය කරනු ලැබේ. අපේක්ෂිත ආයු කාලයේ හෝ වත්කමේ අන්තර්ගත කර ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පරිභෝජන රටාවේ වෙනස්කම් උචිත පරිදි, ක්‍රමක්ෂ කාලසීමාව හෝ ක්‍රම වේදය වෙනස් කිරීම මගින් ගිණුම්කරන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සේ සලකනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් මත ක්‍රමක්ෂ වියදම, අස්පෘශ්‍ය වත්කම්වල කර්තව්‍ය සමග සංගත වියදම් කාණ්ඩයේ ආදායම් ප්‍රකාශනයේ හඳුනාග නු ලැබේ.

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික, ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්ත්වයන් තිබේ නම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 – 'අස්පෘශ්‍ය වත්කම්' ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිලිගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනිම නිසා ඇතිවන ලාභ හෝ අලාභ ශුද්ධ බැහැර කිරීමේ උත්පාදන සහ වත්කමේ ධාරණ මුදල අතර වෙනස ලෙස මනිනු ලබන අතර වත්කම පිළිනොගන්නා විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 2.2.4 කල්බදු වත්කම්

#### මූල්‍ය කල්බදු - මණ්ඩලය බදුකරු වන විට

කල්බදුවල නියමයන් අනුව මණ්ඩල සැලකිය යුතු පරිදි හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ භාරගන්නා විටදී ඒවා මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූල්‍ය කල්බදු මගින් අත්කර ගන්නා වත්කම් මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත හානි අලාභ අඩු කොට, ඒවායේ සාධාරණ වටිනාකමට හෝ ආරම්භයේදී අවම කල්බදු ගෙවීමේ වත්මන් වටිනාකම යන ඒවායින් වඩා අඩු දේට සමාන වටිනාකමටය.

බදුහිමියාට ගෙවිය යුතු අනුරූපී මුල් මුදල බැරකමක් සේ පෙන්නුම් කරනු ලැබේ. අනාගත කාලසීමා සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය ගාස්තු සටහන්වල වෙනම හෙළිදරව් කොට ඇත.

එක් එක් වර්ෂය සඳහා අදාළ කුලී බැඳීමේ පොලී මූලිකාංගය, එක් එක් කාලසීමාව සඳහා බැරකමේ ඉතිරි ශේෂය මත නියත ආවර්තිත පොලී අනුපාතයක් නිපැයීම පිණිස බදු කාලසීමාව පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

කල්බදු දේපලට හෝ ඒ මත වැඩි දියුණු කිරීම් සඳහා පිරිවැය, කල් බද්දේ ඉතිරිව ඇති කාලසීමාව හෝ වැඩි දියුණු කිරීම්වල ප්‍රයෝජනවත් ආයු කාලය හෝ යන දෙකින් වඩා කෙටිකාලයක පුරා ප්‍රාග්ධනගත කිරීම සහ ක්ෂය කිරීම කරනු ලැබේ.

මූල්‍ය කල්බද්දක් ප්‍රතිඵලය වන්නා වූ විකිණීමත් සහ බදු ගැනීමේ ගනුදෙනුවකට අදාල වත්කම්වල ධාරණ වටිනාකම මත කවර හෝ විකුනුම් ආදායම් අතිරික්තයක් බදු වාරය පුරා විලම්බිත කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.2.5 ආයෝජන දේපල

#### (අ) හඳුනාගැනීමේ පදනම

ආයෝජන දේපල යනු බදු කුලී ඉපැයීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා හෝ ඒ අරමුණු දෙකම සඳහා රඳවා ගන්නා එනමුත් ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලදී විකිණීම, භාණ්ඩ හෝ සේවා නිපදවීමේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා හෝ පරිපාලනමය කාර්යය සඳහා නොවන දේපල වේ.

#### (ආ) මැනීමේ පදනම

අයිතමය හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ සහ ආයෝජන දේපලේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිවීමේ හව්‍යතාවක් තිබේ නම් පමණක්ම ආයෝජන දේපල හඳුනාගනු ලැබේ. නිදහස් අයිතිය ඇති ඉඩම් සහ ගොඩනැගිලිවලින් සමන්විත, ආයෝජන දේපල යනු දිගුකාලීන කුලී සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ ඒ දෙකම සඳහා රඳවාගනු ලබන දේපල වන අතර භාණ්ඩ හෝ සේවා සැපයුම සඳහා හෝ පරිපාලනය සඳහා සාරානුකූලව යොදාගනු නොලබන අතර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීමට අදහස් කරනු නොලබයි.

ආයෝජන දේපල ආරම්භයේදී සහ පසුකාලීනව ආශ්‍රිත ගනුදෙනු පිරිවැය ඇතුළුව, පිරිවැයට මනිනු ලබන අතර එබැවින් සමුච්චිත ක්ෂයවීම සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකොට පවත්වා යනු ලැබේ.

වෙළඳපොල වටිනාකම විවෘත කිරීම සඳහා මණ්ඩලයේ ආයෝජන දේපල වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකමේ වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

#### (ඇ) ඉවත් කිරීම

අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන නිසාවෙන් බැහැර කළ විටදී හෝ භාවිතයෙන් ස්ථිරවම අයින් කළ විටදී ආයෝජන දේපල ඉවත් කරනු ලැබේ.

#### (ඈ) ආයෝජන දේපලවලට / දේපලවලින් පසුකාලීන පැවරුම්

අයිතිකරුගේ අධිවාසය අවසන්වීම, වෙනත් පාර්ශ්වයකට මෙහෙයුම් බදු දීමක් ආරම්භ කිරීම හෝ විකිණීමේ අරමුණ ඇතිව ඉදිකිරීම හෝ සංවර්ධනය සම්පූර්ණ කිරීම මගින් තහවුරු වන, භාවිතයේ වෙනසක් සිදුවූ විට පමණක්ම ආයෝජන දේපලවලට පැවරුම් සිදු කරනු ලැබේ.

### 2.2.6 මූල්‍ය නොවන වත්කම් හානිය

සෑම වාර්තාකරණ දිනයකටම වත්කමක් හානි වී ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරයි. එවැනි හානිකරණ ලක්ෂණ පවතින විට හෝ වත්කම් සඳහා හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය විට බැංකු වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. විකිණීමේදී දරන පිරිවැය අඩු කළ වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ සාධාරණ අගය සහ භාවිතා කිරීමේ වටිනාකමට වඩා වත්කමක ආපසු අය කර ගත හැකි අගය ඉහළ වේ.

වත්කමක ධාරණ අගය හෝ මුදල් ජනන ඒකකය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම හානිකරණය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්මනෙහි විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ. මිලයුම් ගුණාකාර, ප්‍රකාශිත කොටස් මිල හෝ පවතින අනෙකුත් සාධාරණ වටිනාකම් දර්ශක මගින් මෙම ගණනය කිරීම් තහවුරු කළ යුතුය.

ප්‍රත්‍යාගණනය ස්කන්ධ කරා රැගෙන යනු ලැබූ පූර්වයෙන් ප්‍රත්‍යාගණනය කරනු ලැබූ වත්කම් හැරුණු විට, හානි වූ වත්කමේ කර්තව්‍ය හා සංගත වියදම් කාණ්ඩවල අඛණ්ඩ මෙහෙයුම්වල හානි අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එවන් අවස්ථාවකදී, පූර්වයෙන් සිදුකරන ලද කවර හෝ ප්‍රත්‍යාගණනයක වටිනාකම දක්වා හානිය ස්කන්ධයේ හඳුනාගනු ලැබේ.

කීර්තිනාමය හැර, වත්කම් සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනයකටම ඇගයීමක් සිදු කරන අතර ඒ තුලින් පෙර හඳුනාගත් හානිකරණ අලාභ තවදුරටත් නොපවතින බවට හා ඒවා අඩුවී ඇති බවට යම් නිරීක්ෂණ කර ඇත්දැයි විමසා බලයි. එවැනි නිරීක්ෂණයක් ඇත්නම්, මණ්ඩලය විසින් වත්කමේ ආපසු අය කරගත හැකි අගය ඇස්තමේන්තු කරයි. කලින් හඳුනාගත් හානිකරණ අලාභ ප්‍රතිවර්ත කරනුයේ, අවසන් වරට හානිකරණ අලාභ හඳුනාගත් අවස්ථාවේ සිට වත්කමේ ආපසු අයකරගත හැකි අගය තීරණය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තු වෙනස් වේ නම් පමණි. එය එසේ වන්නේ නම්, වත්කමේ ධාරණ අගය එහි ආපසු අය කරගත හැකි වටිනාකමට ඉහළ නංවනු ලැබේ.

පෙර වසරවලදී වත්කම සඳහා හානි අලාභයක් හඳුනාගෙන නොමැති නම්, එම වැඩිකල වටිනාකමට ක්ෂයවීම නොමැතිව නිශ්චය කිරීමට ඉඩ තිබූ ධාරණ වටිනාකම ඉක්මවා යාමට නොහැක. වත්කම ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට පවත්වා නොගන්නේ නම් මිස, එබඳු ප්‍රතිවර්තනයක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා අතර එබඳු අවස්ථාවකදී ප්‍රතිවර්තනය, ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකනු ලැබේ.

### 2.2.7 විකිණීම සඳහා රඳවා ගත් ජංගම නොවන වත්කම්

විකිණීම සඳහා ඇති වත්කම්වල ධාරණ වටිනාකම මූලිකවම විකුණුම් ගනුදෙනුවක් හරහා අය කර ගැනීමට නියමිත විටදී හා විකුණුම සිදුවීම සඳහා ඉහළ භව්‍යතාවක් ඇතැයි සලකනු ලබන විටදී ජංගම නොවන වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගිකරණය කරනු ලැබේ. විකිණීම සඳහා පිරිවැය අඩුකොට ධාරණ වටිනාකම සහ සාධාරණ අගය යන දෙකින් වඩා අඩු දෙයට එය සඳහන් කරනු ලැබේ.

ජංගම නොවන වත්කම් සහ බැහැර කරන කාණ්ඩ විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ විකිණීම සිදුවීම සඳහා ඉහළ භව්‍යතාවයක් ඇති විටදී සහ වත්කම හෝ බැහැර කරන කාණ්ඩය එහි වත්මන් තත්ත්වයෙන් වහාම විකිණීම සඳහා පවතින විටදී පමණි.

දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කිරීමෙන් පසුව ක්ෂය කිරීම හෝ ක්‍රමක්ෂණ කිරීම කරනු නොලැබේ.

### 2.2.8 මූල්‍ය වත්කම්

වත්කම අත්පත් කරගත් කාර්යය මත පරායත්ත වූ මණ්ඩලය සිය මූල්‍ය වත්කම් පහත සාකච්ඡා කර ඇති කාණ්ඩ අතුරින් එකකට වර්ගීකරණය කරනු ලැබේ. එක් එක් කාණ්ඩ සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිපත්ති පහත පරිදි වේ.

#### (අ.) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රිය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හා සේවා සැපයීම හරහා ඒවා මූලිකවම මතුවන නමුත් (උදා : වෙළඳ ලැබිය යුතු දෑ) අනෙකුත් ආකාරයේ ගිවිසුමකර මූල්‍ය වත්කම් ද එයට අන්තර්ගත වේ. සාධාරණ වටිනාකමට සහ ඒවා අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණීය ගනුදෙනු පිරිවැයට ඒවා පළමුව හඳුනාගනු ලැබේ.

කාර්ය මණ්ඩලය සේවයේ නියුක්තව සිටින බැවින් සහ වෙළෙන්දන් කාර්යසාධන බැඳුම්කරයක් ලබා දී ඇති බැවින් ආපසු අය කරගැනීම නිශ්චිත නිසාවෙන් ණය සහ වෙළඳ ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය නොකළ අතර සාධාරණ වටිනාකමට පෙන්නුම් කෙරේ.

නිවාස ණය - අවුරුදු 07ක මූලික වැටුප (උපරිමය රු. 2,500,000/= දක්වා). පොළී අනුපාතය 4% වයස අවුරුදු 55 දක්වා අය කර ගැනීම.

ආපදා ණය - මාස 10 මූලික වැටුප (උපරිමය රු. 250,000/= දක්වා ). පොළී අනුපාතය 4.2% මාසික වාරික 60 කින් අය කර ගැනීම.

2016.09.12 දින වන විට රු. මිලියන 600ක් ව තිබූ ගොඩනැගිලි අරමුදලින් රු. මිලියන 550ක මුදලක් නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය වූ විට නැවත ගෙවීමට මහා භාණ්ඩාගාරය අතර එකඟතාවය මත 2016.12.02 දින රජයේ ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදි.

### (ආ). වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මුලින්ම මනිනු ලබන්නේ සාධාරණ වටිනාකම් පිරිවැයටය.

(ඇ). 2016.12.31 දිනට ක්ෂණික සහ දිනුම් ඇදීමේ ලොතරැයි සඳහා ණය ගැතියන් වෙනුවෙන් රු. 18,125,170/= මුදලක් බොල් ණය ප්‍රතිපාදන වශයෙන් වෙන් කරන ලදි. (රක්ෂණ යෝජනා හා බැංකු ඇපකර යටතේ ආවරණය වූ මුදල් අඩු කිරීමෙන් පසු අනාරක්ෂිත ණය ගැති ශේෂයෙන් 5% ක් සඳහා වෙන් කරන ලදි.)

### 2.2.9 වට්ටෝරු භාණ්ඩ (තොග)

නිෂ්පාදනයේ කෙටි ජීවන චක්‍රය හේතු කොටගෙන ශුද්ධ උපලබ්ධි අගයක් නොමැතිවීම නිසා යල්පිනූ සහ සෙමින් විකිණෙන අයිතම සඳහා නිසි වාසි ලබාදීමෙන් අනතුරුව, වට්ටෝරු භාණ්ඩ පිරිවැයට පමණක් මනිනු ලැබේ. ලොතරැයිපත් වේගයෙන් අලෙවි වන බැවින් ශුද්ධ උපලබ්ධි අගය හඳුනාගැනීමේ අවශ්‍යතාවයක් නොමැති ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කොට වට්ටෝරු භාණ්ඩ විකිණිය හැකි මිලය.

රන් භාණ්ඩ, මෝටර් රථ සහ අනෙකුත් ත්‍යාග ඇතුළත් ත්‍යාග තොග ඒවාට විකුණුම් වටිනාකමක් නොමැති බැවින් සහ දරන ලද වියදම පමණක් ඇති බැවින් පිරිවැයට තක්සේරු කරනු ලැබේ. එවැනි සියලු තොග අනාගතයේ ඕනෑම වේලාවක ත්‍යාග ලෙස පිරිනමනු ලබන මුත් අතේ දුරින් ගනුදෙනුවක් මගින් විකුණනු නොලැබේ.

වට්ටෝරු භාණ්ඩ ඒවා වත්මනෙහි තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය වට්ටෝරු භාණ්ඩ පිරිවැය ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

### 2.2.10 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් සහ ඉල්ලුම් තැන්පතු ලෙස නිර්වචනය කෙරේ. අතැති මුදල්, ඉල්ලූ විට ලබාගැනීම සඳහා බැංකුවේ රඳවා ඇති තැන්පතු, මාස තුනක් හෝ ඊට අඩු මුල් කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඊට ඇතුලත් වේ. වක්‍ර ක්‍රමය මත පාදකව මුදල් ප්‍රවාහ ප්‍රකාශ වාර්තා කරනු ලැබේ.

## 2.3 බැරකම් සහ ප්‍රතිපාදන

### 2.3.1 බැරකම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ශේෂපත්‍ර දිනයේ සිට වසරක් තුළ ගෙවීමට සිදු වේ යැයි අපේක්ෂා කරන බැරකම් වේ. මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී දන්නා සියලුම බැරකම් ගිණුම්ගත කොට ඇත. 2014 වසරේ ත්‍යාග සංචිත අරමුදලින් රු. මිලියන 325 ක් පොළී රහිත ණය පදනම මත ලබාගත් අතර 2015 වසරේදී එයින් රු. මිලියන 205 ක් නැවත පියවන ලදී ගෙවිය යුතු ඉතිරි මුදල වන රු. මිලියන 120 ක් ජංගම වගකීම්වල පෙන්වා ඇත.

### වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළඳ ණයහිමියන් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායේ පොත් වටිනාකමට සඳහන් කර ඇත.

### 2.3.2 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය බැරකම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් බැඳීමක් (නෛතික සහ සම්මුතික) මණ්ඩලය සතුවීමදී, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

සම්පත් ගලායාම අසම්භාවය නොකළහොත් මිස, සියලු අසම්භාව්‍ය බැරකම් සටහන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ.

### ඒකාබද්ධ අරමුදල වෙත දායකත්වය මත ආදායම් බදු

2010/2011 සිට 2012/2013 බදු කාලසීමාව සඳහා ඒකාබද්ධ අරමුදලට දක්වන ලද දායකත්වය මත රු.1,644,103,198 ක අතිරේක ආදායම් බදු පැනවීමක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදි,

මහා භාණ්ඩාගාරයේ මඟ පෙන්වීම පරිදි, ඉහත අදාළ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු මුළු ආදායම් බදු 2015 අප්‍රේල් මාසයෙන් ආරම්භ කොට මාසික වාරික 30කින් ගෙවීම් සිදු කිරීමට කටයුතු යොදා ඇත.ඒ අනුව එම ගෙවීම් සිදු කරනු ලැබේ.

### සේවයේ යළි පිහිටුවීම හෝ වන්දි ගෙවීම

කොළඹ කම්කරු විනිශ්චය සභාවේ නඩු පැවරූ හිටපු සේවකයෙකුට වන්දි ලෙස රු.3,000,000 ගෙවීමට මණ්ඩලයට සිදුවිය හැක.

### අපහාස කිරීම

කොළඹ දිසා අධිකරණයේ මණ්ඩලයට එරෙහිව අපහාස නඩුවක් පැවරූ පුද්ගලයෙකුට රු.50,000,000 ගෙවීමට මණ්ඩලයට සිදුවිය හැක.

### ණය අයකර ගැනීම්

පුද්ගලයෙකු විසින් ඉහළ උසාවියේ මණ්ඩලයට එරෙහිව පවරන ලද නඩුවක් සඳහා මණ්ඩලයට රු. 22,191,120 මුදලක් ණය අයකර ගැනීම් වශයෙන් ගෙවීමට සිදුවිය හැක.

### 2.3.3 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**නිර්වචිත දායක සැලසුම් - සේ.අ.අ. සහ සේ.භා.අ.**

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා හිමිකම් ලබා ඇති සියලුම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිර්වචිත දායක සැලසුම් සඳහා දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

**නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය**

1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධානවලට අනුව මණ්ඩලය සමග අඛණ්ඩ ව අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් නිර්දේශ කර ඇති පරිදි අංක 19 දරණ සේවක ප්‍රතිලාභ සඳහා ආයුගණක ප්‍රක්ෂේපිත ණයවර ක්‍රමවේදය (PUC) යටතේ මණ්ඩලයේ සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන කර ඇත. 2016.12.31 දිනට මෙම ආයුගණක තක්සේරුව වෘත්තියමය සුදුසුකම් ලත් ආයුගණක ආයතනයක් වන Actuaries Messer's Actuarial and Management Consultant (Pvt) Ltd. මගින් සිදුකර ඇත. ආයුගණක තක්සේරුව සෑම වසරක ම ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය බලාපොරොත්තු වේ. ආයුගණක විසින් භාවිතා කළ මූලික උපකල්පනයන් පහත පරිදි වේ.

| | 2016 |
|---|---|
| ආයුගණක තක්සේරු ක්‍රමය | - ආයුගණක ප්‍රක්ෂේපිත ණයවර ක්‍රමය (PUC) |
| වට්ටම් ප්‍රතිශතය | - 10% |
| අනාගත වැටුප් වර්ධකය | - සේවයට බැඳුණු දින සිට වර්ෂයකට 1%ක වැටුප් වර්ධකය හා ඊට පසු වාර්ෂිකව |
| අනාගත දීමනා වර්ධකය | - 2017.01.01 දිනට 10% වර්ධකයක් |
| විශ්‍රමික වයස | - අවුරුදු 60 |
| මරණ සංඛ්‍යා වගුව | - ඒ 1967/70 මරණ සංඛ්‍යා වගුව |

වගකීම් සඳහා බාහිරව අරමුදල් ලබාගනු නොලැබේ.

2011 වසරේදී එක් මාසයක වැටුප පදනම්ව ප්‍රක්ෂේපිත ඒකක ණයවර ක්‍රමවේදය යටතේ ගිණුම්ගත කර පාරිතෝෂිකය ලබාදුන් අතර එම මුදල රු. 3,620,091 ක් විය. කෙසේ වෙතත්, 2012 අගෝස්තු සිට මෙය සේවයේ සම්පූර්ණ කරන ලද එක් එක් වසර සඳහා අර්ධ මාසික වැටුප ලෙස ප්‍රතිවර්තනය කරන ලදී.

## 2.3.4 බදුකරණය

### ජංගම බදු

මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ එහි සංශෝධන ප්‍රකාරව ගණනය කර ඇත.

### විලම්බිත බදුකරණය

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රම වේදය භාවිතා කරමින් විලම්භිත බදු පිළිගනු ලැබේ.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් හඳුනාගනු ලැබේ. සියලු අඩුකළ හැම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන ගිය ප්‍රයෝජනයට නොගත් බදු බැර සහ ප්‍රයෝජනයට නොගත් බදු අලාභ සඳහා බදු අයකළ හැකි ලාභය පැවතීමට ඉඩ ඇති ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ වටිනාකම එක් එක් ශේෂපත්‍ර දිනයට සමාලෝචනය කරනු ලබන අතර විලම්බිත බදු සියල්ල හෝ ඉන් කොටසක් ප්‍රයෝජනයට ගනු ලැබීමට ඉඩදීම පිණිස ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයක් පැවතීමට තවදුරටත් භව්‍යතාවයක් නොමැති ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එක් එක් දිනට ප්‍රති තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම් නැවත අය කර ගැනීමට ඉඩදීමට හැකි වන ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්භිත බදු වත්කම් හෝ බැරකම් මනිනු ලබන්නේ පනවනු ලැබ ඇති හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් දිනට සාරානුකූලව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි කළ හෝ බැරකම පියවනු ලැබූ අවස්ථාවේ එම වසරට අදාළ කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයන්ටය.

## 2.4 ආදායම් ප්‍රකාශනය

### 2.4.1 ආදායම හඳුනාගැනීම

#### (අ) භාණ්ඩ විකිණීම

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති ප්‍රමාණයට සහ දරන ලද ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා ඇති විටදි, ප්‍රතිෂ්ඨාව නැවත අය කර ගැනීම විය හැකි විටදී සහ භාණ්ඩ ආශ්‍රිත පිරිවැය සහ ඇතිවිය හැකි ලාභ විශ්වාසනීය ලෙස මැනිය හැකි විටදී ආදායම හඳුනාගනු ලැබේ.

#### (ආ) පොළිය

කාල පදනමක් මත උපචිත වන සඵල පොලී ක්‍රම වේදය යොදා ගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

#### (ඇ) වෙනත්

අනෙකුත් ආදායම උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ.

### 2.4.2 වියදම හඳුනාගැනීම

(අ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම හඳුනාගනු ලබන්නේ දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම්වල ඉපැයුම් අතර ඍජු සම්බන්ධය පදනම් කරගෙනය. ඵලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ පවත්වාගෙන යාමට දැරීමට සිදුවූ සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට අය කර තිබේ.

## 2.5 අවදානම් කළමනාකරණය

අනෙකුත් සියලු ව්‍යාපාරයන්ට පොදු පරිදි, මණ්ඩලය අවදානම්වලට නිරාවරණය වී තිබේ. එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා මණ්ඩලයේ අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාදාම සහ ඒවා මැනීම සඳහා යොදාගත් ක්‍රමවේද මෙම සටහන විස්තර කරයි. මෙම අවදානම් පිලිබඳ තවත් ප්‍රමාණාත්මක තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශ පුරාම ඉදිරිපත් කර තිබේ. තම මෙහෙයුම් හරහා මණ්ඩලය පහත දැක්වෙන අවදානම්වලට නිරාවරණය වේ.

### (අ) දේශපාලන අවදානම

දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම් මණ්ඩලයේ කටයුතුවලට බලපෑම් ඇති කරයි. කෙසේ වෙතත් එවැනි අවදානම් අවම කිරීම පිණිස කළමනාකාරිත්වය සහ පද්ධති මැනවින් ස්ථානගත කර ඇත.

### (ආ) නෛතික අවදානම

නෛතික අවදානම අදාල වනුයේ නව ලොතරැයි ක්‍රියාත්මක කිරීමේදී රට තුළ ඒවායේ අලෙවිය සීමා කරන රෙගුලාසි සම්බන්ධයෙනි.

### (ඇ) කීර්තිනාම අවදානම

ව්‍යාජ ලෙස මුද්‍රණය කරන ලද ලොතරැයි පත් වෙළඳපොලට පිවිසීම සඳහා ඇති හැකියාව හේතු කොටගෙන කීර්තිනාමය පිලිබඳ අවදානමක් ඇති විය හැක. නමුත් එවැනි අවදානම් අවම කිරීම සඳහා ජා.ලො.ම. දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

### (ඈ) මෙහෙයුම් අවදානම

ජාතික ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් සඳහා ඇති තර්ජන වනුයේ කාර්ය මණ්ඩලයේ නොසැලකිලිමත්බව, ස්වාභාවික ආපදා, තාක්ෂණික උපකරණ ක්‍රියා විරහිත වීම ආදියයි.

### (ඉ) ද්‍රවශීලතා අවදානම

සියලු පූර්ව මුද්‍රිත අංක සහිත ලොතරැයිවල සුපිරි ත්‍යාග අඛණ්ඩව දිනාගැනීමේ අවදානම මණ්ඩලයේ ද්‍රවශීලතාවට තර්ජනයක් එල්ල කරයි. කෙසේ වෙතත්, ත්‍යාග සංචිතයේ ශක්තිය මෙම අවදානමට මුහුණදීමට මණ්ඩලයට රුකුලක් වනු ඇත.

### (ඊ) ආර්ථික අවදානම

උපයෝජ්‍ය ආදායම පිලිබඳ රජයේ රෙගුලාසි, මහජනයා විසින් ලොතරැයි මිලදී ගැනීමේ රටාවන් කෙරෙහි බලපානු ඇත.

මණ්ඩලයේ අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති නිර්ණය කිරීම සඳහා සමස්ත වගකීම මණ්ඩලය සතු අතර ඒ සඳහා අත්‍යන්ත වගකීම රඳවා ගනිමින් අරමුණු සහ ප්‍රතිපත්ති සඵලව ක්‍රියාත්මක කිරීම සහතික කරන්නා වූ ක්‍රියාදාම සැලසුම් කිරීම සහ මෙහෙයවීම සඳහා බලය එය අදාල අංශයන්ට පවරා තිබේ. මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරියාගෙන් මණ්ඩලයට මාසික වාර්තා ලැබෙන අතර හඳුන්වා දී ඇති ක්‍රියාදාමයන්හි සඵලතාව සහ පනවනු ලබන අරමුණු සහ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව එමගින් සමාලෝචනය කරනු ලැබේ. මණ්ඩලයේ අභ්‍යන්තර විගණකවරුන්ද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාදාම සමාලෝචනය කරන අතර ඔවුන් අනාවරණය කරගන්නා කරුණු විගණන කමිටුව වාර්තා කරයි. මණ්ඩලයේ සමස්ත අරමුණ වනුයේ, මණ්ඩලයේ තරඟකාරිත්වයට සහ නම්‍යශිලීත්වයට අයෝග්‍ය බලපෑම් නොකරමින්, හැකිතාක් දුරට අවදානම් අඩු කිරීමට උපකාරී වන ප්‍රතිපත්ති හඳුන්වා දීමයි.

## 2.6 සාමාන්‍ය කරුණු

### 2.6.1 ශේෂ පත්‍ර දිනට පසු සිදු වූ සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු සිදු වූ පැන නැගුණු සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලන ලද අතර අවශ්‍ය අවස්ථාවන්හිදී ගැලපීම් හෝ හෙලිදරව් කිරීම් කර මූල්‍ය ප්‍රකාශනවල අදාල සටහන්වල දක්වා ඇත.

### රේගු බදු පැනවීම

1989 අංක 13 දරණ රේගු බදු සඳහා වූ රේගු පනතේ (විශේෂ ප්‍රතිපාදන) 3 වන වගන්තිය යටතේ ලොතරැයි පනතින් 15% හෝ රු. 5 ක් යන දෙකින් වැඩි අගය රේගු බද්දක් ලෙස 2017.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පනවන ලදි. මුදල් අමාත්‍යාංශයේ නියමය පරිදි රේගු බද්දක් ගෙවීම සඳහා මණ්ඩලය විසින් ලොතරැයි පතක මිල රු. 20 සිට රු. 30 දක්වා වැඩි කරන ලදි. 2017 ජනවාරි මාසයේ අලෙවි පිරිවැටුම දැඩි ලෙස පහත වැටුණ බැවින් 2017.02.01 දින සිට බල පැවැත්වෙන පරිදි මිල වැඩි වීම නැවත පැවති මිලට ම එනම් රු. 20 දක්වා පහත හෙලන ලදි.

### අවිනිශ්චිත හා තහවුරු නොකළ ගිවිසුම්ගත වගකීම්

මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බට ගිය අතීත සිදුවීම්වලින් පැන නගින ලද දේ සහ අවිනිශ්චිත අනාගත සිද්ධින්වලට අදාල සිදුවීම් හෝ සිදුවීම් නොවන ලෙස සනාථ කරගත් භව්‍ය වත්කම් හෝ අවනතභාවයන් අවිනිශ්චිතයන් යටතට වැටේ.

### 2.6.2 සන්සන්දනාත්මක දත්ත

පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය තැන්වලදී සන්සන්දනාත්මක දත්ත නැවත වර්ගීකරණය කර දක්වා ඇත.

### 2.6.3 ආදායම් බදු ප්‍රකාශයෙහි ඒකාබද්ධ අරමුදල දැක්වීම

2011 වසර දක්වා ඒකාබද්ධ අරමුදල දක්වන ලද්දේ ආදායම් ප්‍රකාශය යටතේ සෘජු වියදමක් ලෙසය.කෙසේ වෙතත් 2012 වසරේදී ඒකාබද්ධ අරමුදලට ආදායම් බදු ගණනයේදී අනුදත් නොවූ වියදමක් ලෙස සැලකූ බැවින් 2012 වසරේ දී එය ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය යටතේ දක්වන ලදිග 2013 ජනවාරි සිට මෙය නැවතත් 2012 වසරට පෙර වර්ෂවල කළ පරිදි ආදායම් ප්‍රකාශයෙහි සෘජු වියදමක් ලෙස පෙන්වා දී ඇත.

### 2.6.4 අහිමි කළ ත්‍යාග.

2016 වසරේ අහිමි කළ ත්‍යාගවල වටිනාකම රු. 365.393.530/= ක් විය. මෙය 2016.01.01 දින සිට 2016.06.30 දින දක්වා (2015.07.01 දින සිට 2015.12.31 දක්වා පැවැත්වූ දිනුම් වාර වෙනුවෙන්) අදාළ කාලයට රු.188.327.090 ක් වූඅතර එය 2016.07.01 දින සිට 2016.09.30 දක්වා අදාළ කාලයට රු. 94,578,240/= කින් (2016.01.01 දින සිට 2016.03.31 දක්වා පැවැත්වූ දිනුම් වාර වෙනුවෙන්) සහ 2016.10.01 දින සිට 2016.12.31 දක්වා අදාල කාලයට රු. 82,494,200/= කින් ද (2016.04.01 දින සිට 2016.06.30 දක්වා පැවැත්වූ දිනුම් වාර වෙනුවෙන්) සමන්විත විය. අහිමි කළ ත්‍යාග සෑම විටම මූල්‍ය වසර 02 ක් නියෝජනය කරන අතර ගෙවීම් ඒ අනුව සිදු කරයි.

### 2.6.5 අරමුදල් බෙදාහැරීම

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ මණ්ඩලය විසින් 2008 සැප්තැම්බර් 02 දින සිට බලපැවැත්වෙන පරිදි ටිකට්පතක මිල රු.10.00 සිට රු.20.00 දක්වා වැඩිකරන ලදී. ඒ අනුව නියෝජිත කොමිස් ද 15% සිට 17.5% දක්වා වැඩිවිය.

**(අ) දිනුම් අදින ලොතරැයිවලට අදාල අරමුදල් බෙදා හැරීම**

| | මහජන සම්පත | වාසනා සම්පත | ගොවිසෙත | සුපිරි වාසනා | ජාතික සම්පත | සම්පත් රේඛා | ඩබල් බෝනස් | පවර් ලොටෝ | නිරෝගා |
|---|---|---|---|---|---|---|---|---|---|
| ත්‍යාග | 49% | 47% | 47% | 47% | 47% | 47% | 58% | 48% | 47% |
| නියෝජිත කොමිස් | 17.50% | 17.50% | 17.50% | 17.50% | 17.50% | 17.50% | 17.50% | 17.50% | 17.50% |
| ඒකාබද්ධ අරමුදල | 16.50% | 16.50% | 10% | 10% | 10% | 10% | 10% | 10% | 10% |
| මණ්ඩලීය වියදම් | 17% | 19% | 25.50% | 25.50% | 25.50% | 25.50% | 14.50% | 24.50% | 25.50% |

| | මෙගා පවර් | සුපිරි දෙලක්ෂපති | වාසනා සම්පත සුපර් 50 | මනුසත් මෙහෙවර | රජ දිනුම |
|---|---|---|---|---|---|
| ත්‍යාග | 48% | 52% | 47% | 26% | 58% |
| නියෝජිත කොමිස් | 17.50% | 17.50% | 17.50% | 17.50% | 17.50% |
| ඒකාබද්ධ අරමුදල | 10% | 10% | 16.50% | - | 10% |
| මණ්ඩලීය වියදම් | 24.50% | 20.50% | 19% | 56.50% | 14.50% |

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා සමාගම වෙනුවෙන් ජාතික ලොතරැයි  මණ්ඩලය විසින් එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය සහ ඩොලර් ෆෝචූන් ලොතරැයිය පවත්වයි. ශුද්ධ ආදායම ඒකාබද්ධ අරමුදල හරහා  ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා සමාගම වෙත කරනු ලැබේ.

**(ආ) ක්ෂණික ලොතරැයිවලට අදාල අරමුදල් බෙදා හැරීම**

| | සමෘද්ධි රු.10/= | සමෘද්ධි රු.20/= | සෙවණ රු.10/= | සෙවණ රු.20/= |
|---|---|---|---|---|
| ත්‍යාග | 49% | 53% | 49% | 53% |
| නියෝජිත කොමිස් | 15% | 17.50% | 15% | 17.50% |
| ඒකාබද්ධ අරමුදල | 10% | 10% | 10% | 10% |
| මණ්ඩලීය වියදම් | 26% | 19.50% | 26% | 19.50% |

(ඈ) ඒකාබද්ධ අරමුදලට දායකත්වය හා ඒකාබද්ධ අරමුදල හරහා අමාත්‍යාංශවලට දක්වන දායකත්වය පහත දක්වා ඇත.

**දිනුම් ඇදින ලොතරැයි**

| | | | | | |
|---|---|---|---|---|---|
| මහජන සම්පත | - | ඉරිදා, අඟහරුවාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා | - | 16.5% | ඒකාබද්ධ අරමුදල |
| වාසනා සම්පත | - | සඳුදා, බ්‍රහස්පතින්දා | - | 16.5% | ඒකාබද්ධ අරමුදල |
| ගොවිසෙත | - | සඳුදා, බ්‍රහස්පතින්දා, බදාදා, සෙනසුරාදා | - | 10% | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| සුපිරි වාසනා | - | බදාදා<br>සෙනසුරාදා | - | 10%<br>10% | රණවිරු සේවා අධිකාරිය<br>ක්‍රීඩා හා සමාජ සේවා අමාත්‍යාංශ (5% බැගින්) |
| ජාතික සම්පත | - | බදාදා<br>සෙනසුරාදා | -<br>- | 10%<br>10% | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>කම්කරු අමාත්‍යාංශය |
| සම්පත් රේඛා | - | ඉරිදා, අඟහරුවාදා, සිකුරාදා | - | 10% | ඒකාබද්ධ අරමුදල |
| නීරෝගා | - | අඟහරුවාදා, සිකුරාදා, ඉරිදා | - | 10% | ජාතික වකුගඩු අරමුදල |
| මෙගා පවර් | - | සඳුදා, බදාදා | - | 10% | ඒකාබද්ධ අරමුදල |
| සුපිරි දෙලක්ෂපති | - | සිකුරාදා | - | 10% | ඒකාබද්ධ අරමුදල |

**ක්ෂණික ලොතරැයි**

| | | | |
|---|---|---|---|
| සමෘද්ධි | - | 10% | සමෘද්ධි හා යෞවන කටයුතු අමාත්‍යාංශය |
| සෙවණ | - | 10% | නිවාස අමාත්‍යාංශය |

**මෙම වසර තුළ අවලංගු කරන ලද දිනුම් ඇදින ලොතරැයි පහත දැක්වේ.**

| | | | | |
|---|---|---|---|---|
| පවර් ලොටෝ | - | 30.03.2016 | - | 10% ඒකාබද්ධ අරමුදලට |
| වාසනා 50 | - | 10.10.2016 | - | 16.50% ඒකාබද්ධ අරමුදලට |
| මනුසත් මෙහෙවර | - | 04.08.2016 | - | ශුද්ධ අලාභය මත ඒකාබද්ධ අරමුදලට දායකත්වයක් නොදෙන ලදි. |
| රජ දිනුම | - | 30.12.2016 | - | 10% ඒකාබද්ධ අරමුදලට |

සටහන්

| සටහන් අංක 03<br>ආදායම | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| මහජන සම්පත | 5,342,079,200 | 4,734,072,600 |
| වාසනා සම්පත | 1,142,713,800 | 1,350,011,000 |
| වාසනා සම්පත සුපර් 50 | 154,105,600 | - |
| ගොවිසෙත | 4,011,269,600 | 4,510,796,200 |
| සුපිරි වාසනා | 1,682,786,600 | 1,747,288,400 |
| ජාතික සම්පත | 1,354,628,800 | 1,319,314,600 |
| සම්පත් රේඛා | 1,631,768,800 | 1,629,783,800 |
| ඩබල් බෝනස් /මෙගා 50 | - | 176,692,800 |
| පවර් ලොටෝ | 71,646,750 | 305,303,300 |
| මෙගා පවර් | 1,134,625,400 | - |
| නීරෝගා | 1,307,799,800 | 431,746,120 |
| මනුසත් මෙහෙවර | 29,756,400 | - |
| සුපිරි දෙලක්ෂපති | 516,648,400 | - |
| රජ දිනුම | 139,795,200 | - |
| කලම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ | - | 39,578,321 |
| සමෘද්ධි | 176,094,900 | 206,312,000 |
| සෙවණ | 1,474,698,500 | 943,564,540 |
| **එකතුව** | **20,170,417,750** | **17,394,463,681** |

| සටහන් අංක 04<br>විකුණුම් පිරිවැය | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ටිකට්පත් මුද්‍රණ ගාස්තු | 609,845,633 | 494,409,498 |
| අලෙවි නියෝජිත කොමිස් | 3,525,166,606 | 3,034,113,221 |
| දිස්ත්‍රික් අලෙවි නියෝජිත කොමිස් | 246,569,983 | 210,545,870 |
| ත්‍යාග වෙන් කිරීම් | 9,723,421,286 | 8,367,984,720 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 2,445,594,544 | 2,130,953,970 |
| **එකතුව** | **16,550,598,052** | **14,238,007,279** |

| සටහන් අංක 04-1<br>ටිකට්පත් මුද්‍රණ ගාස්තු | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ආරම්භක ශේෂය - ජනවාරි 01 දිනට | | |
| දිනුම් අදින ලොතරැයි | 2,755,034 | 2,697,275 |
| සෙවණ ලොතරැයිය | 15,618,255 | 12,183,469 |
| සමෘද්ධි ලොතරැයිය | 2,871,880 | 3,347,602 |
| | 21,245,169 | 18,228,347 |
| එකතු කළා :වර්ෂය තුළ ටිකට්පත මිලදී ගැනීම් | 592,158,195 | 497,426,320 |
| | 613,403,364 | 515,654,666 |
| **අඩු කළා: දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | | |
| දිනුම් අදින ලොතරැයි | 3,205,874 | 2,755,034 |
| සෙවණ ලොතරැයිය | 351,857 | 15,618,255 |
| සමෘද්ධි ලොතරැයිය | - | 2,871,880 |
| | 3,557,731 | 21,245,169 |
| **එකතුව** | **609,845,633** | **494,409,498** |

| සටහන් අංක 04-02<br>නියෝජිත කොමිස් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---:|---:|
| මහජන සම්පත | 934,863,860 | 828,462,705 |
| වාසනා සම්පත | 199,974,915 | 236,251,925 |
| වාසනා සම්පත සුපර් 50 | 26,968,480 | - |
| ගොවිසෙත | 701,972,180 | 789,389,335 |
| සුපිරි වාසනා | 294,487,655 | 305,775,470 |
| ජාතික සම්පත | 237,060,040 | 230,880,055 |
| සම්පත් රේඛා | 285,559,540 | 285,212,165 |
| ඩබල් බෝනස් /මෙගා 50 | - | 30,921,240 |
| පවර් ලොටෝ | 12,538,181 | 53,428,078 |
| මෙගා පවර් | 198,559,445 | - |
| නීරෝගා | 228,864,965 | 75,555,571 |
| මනුසත් මෙහෙවර | 5,207,370 | - |
| සුපිරි දෙලක්ෂපති | 90,413,470 | - |
| රජ දිනුම | 24,464,160 | - |
| කලම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ | - | 351,783 |
| සමෘද්ධි | 26,410,108 | 32,761,100 |
| සෙවණ | 257,822,238 | 165,123,795 |
| **එකතුව** | **3,525,166,606** | **3,034,113,221** |

| සටහන් අංක 04-03<br>දිස්ත්‍රික් නියෝජිත කොමිස් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---:|---:|
| මහජන සම්පත | 66,386,355 | 58,685,412 |
| වාසනා සම්පත | 14,194,058 | 16,761,345 |
| වාසනා සම්පත සුපර් 50 | 1,919,138 | - |
| ගොවිසෙත | 49,822,585 | 56,147,991 |
| සුපිරි වාසනා | 20,922,041 | 21,758,016 |
| ජාතික සම්පත | 16,839,997 | 16,432,623 |
| සම්පත් රේඛා | 20,274,919 | 20,240,352 |
| ඩබල් බෝනස් /මෙගා 50 | - | 2,215,460 |
| පවර් ලොටෝ | 1,142,743 | 3,739,449 |
| මෙගා පවර් | 14,118,980 | - |
| නීරෝගා | 16,265,591 | 5,366,212 |
| මනුසත් මෙහෙවර | 421,719 | - |
| සුපිරි දෙලක්ෂපති | 6,415,761 | - |
| රජ දිනුම | 1,740,056 | - |
| සමෘද්ධි | 1,713,237 | 1,650,496 |
| සෙවණ | 14,392,804 | 7,548,516 |
| **එකතුව** | **246,569,983** | **210,545,870** |

| සටහන් අංක 04-04<br>ත්‍යාග වෙන් කිරීම් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---:|---:|
| මහජන සම්පත | 2,617,611,719 | 2,319,695,574 |
| වාසනා සම්පත | 537,075,486 | 634,505,170 |
| වාසනා සම්පත සුපර් 50 | 72,429,632 | - |
| ගොවිසෙත | 1,885,296,712 | 2,120,074,214 |
| සුපිරි වාසනා | 791,009,702 | 821,203,368 |
| ජාතික සම්පත | 636,675,536 | 620,077,862 |
| සම්පත් රේඛා | 766,931,336 | 765,998,386 |
| ඩබල් බෝනස් /මෙගා 50 | - | 102,481,824 |
| පවර් ලොටෝ | 34,390,440 | 146,545,584 |
| මෙගා පවර් | 544,620,192 | - |
| නීරෝගා | 614,665,906 | 202,920,676 |
| මනුසත් මෙහෙවර | 7,736,664 | - |
| සුපිරි දෙලක්ෂපති | 268,657,168 | - |
| රජ දිනුම | 81,081,216 | 30,397,096 |
| සමෘද්ධි | 86,235,632 | 103,995,760 |
| සෙවණ | 779,003,945 | 500,089,206 |
| **එකතුව** | **9,723,421,286** | **8,367,984,720** |

| සටහන් අංක 04-05<br>ඒකාබද්ධ අරමුදලට ගෙවීම් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---:|---:|
| මහජන සම්පත | 881,443,068 | 781,121,979 |
| වාසනා සම්පත | 188,547,777 | 222,751,815 |
| වාසනා සම්පත සුපර් 50 | 25,427,424 | - |
| ගොවිසෙත | 401,126,960 | 451,079,620 |
| සුපිරි වාසනා | 168,278,660 | 174,728,840 |
| ජාතික සම්පත | 135,462,880 | 131,931,460 |
| සම්පත් රේඛා | 163,176,880 | 162,978,380 |
| ඩබල් බෝනස් /මෙගා 50 | - | 17,669,280 |
| පවර් ලොටෝ | 7,164,675 | 30,530,330 |
| මෙගා පවර් | 113,462,540 | - |
| නීරෝගා | 130,779,980 | 43,174,612 |
| සුපිරි දෙලක්ෂපති | 51,664,840 | - |
| රජ දිනුම | 13,979,520 | - |
| සමෘද්ධි | 17,609,490 | 20,631,200 |
| සෙවණ | 147,469,850 | 94,356,454 |
| **එකතුව** | **2,445,594,544** | **2,130,953,970** |

| සටහන් අංක 05<br>වෙනත් ආදායම් | 2016<br>රු. | 2015<br>රු. |
| --- | --- | --- |
| පොලී ආදායම | 244,970,670 | 88,713,366 |
| වෙනත් ආදායම් | 4,575,434 | 3,484,585 |
| **එකතුව** | **249,546,104** | **92,197,951** |

| සටහන් අංක 06<br>විකුණුම් අලෙවි හා බෙදාහැරීම් පිරිවැය | 2016<br>රු. | 2015<br>රු. |
| --- | --- | --- |
| බෙදාහැරීම් පිරිවැය | 203,723,859 | 95,644,763 |
| විකුණුම් අලෙවි හා බෙදාහැරීම් වියදම් | 1,013,545,562 | 753,535,738 |
| සන්නිවේදන වියදම් | 28,899,226 | 23,210,863 |
| **එකතුව** | **1,246,168,647** | **872,391,364** |

| සටහන් අංක 06-01<br>බෙදාහැරීම් පිරිවැය | 2016<br>රු. | 2015<br>රු. |
| --- | --- | --- |
| මෝටර් වාහන - ඉන්ධන | 8,316,930 | 7,041,580 |
| මෝටර් වාහන - අලුත්වැඩියාව හා නඩත්තුව | 7,460,333 | 6,493,924 |
| මෝටර් වාහන - රක්ෂණ | 3,076,452 | 1,489,179 |
| මෝටර් වාහන - ආදායම් බලපත්‍ර | 285,965 | 386,189 |
| මෝටර් වාහන - ටයර් හා ටියුබ් | 1,005,224 | 796,774 |
| මෝටර් වාහන - වෙනත් වියදම් | 189,194 | 229,712 |
| මෝටර් වාහන - ක්ෂය කිරීම් | 27,489,766 | 24,363,858 |
| ටිකට්පත් ප්‍රවාහන වියදම් | 9,600,368 | 7,224,702 |
| නියෝජිත සහන හා ආපසු භාරදෙන ටිකට්පත්වල වටිනාකම | 90,729 | 284,316 |
| නියෝජිත සහ අලෙවි සහායක සුභසාධන කටයුතු | 4,350 | 17,480 |
| දි නියෝජිත හා අලෙවි නියෝජිත පුහුණු වියදම් | 13,525,647 | 3,351,989 |
| නියෝජිතයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය | 1,638,500 | 2,332,500 |
| දි නියෝජිත හා අලෙවි නියෝජිතයින් සඳහා අලෙවි ප්‍රවර්ධන දීමනා | 639,108 | 1,514,382 |
| ණය සඳහා රක්ෂණාවරණ වියදම් | 3,734,621 | - |
| නියෝජිත වෛද්‍ය වියදම් | 4,842,676 | 9,330,547 |
| නියෝජිත අතිරේක අලෙවි ප්‍රවර්ධන වියදම් | 56,845,059 | 28,794,132 |
| නියෝජිත ඇගයීම | 2,828,500 | 1,993,500 |
| බිලියන 20 අලෙවි ඉලක්කය සපුරාලීමේ දිරිදීමනාව නියෝජිත සහ වෙනත් | 57,709,945 | - |
| අසරණ සරණ අරමුදල සඳහා (නීරෝගා දිරිදීමනාව) | 4,440,492 | - |
| **එකතුව** | **203,723,859** | **95,644,763** |

| සටහන් අංක 06 -02<br>අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන වියදම් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---:|---:|
| නිෂ්පාදන හා විකාශන ගාස්තු | 333,083,385 | 260,852,864 |
| ප්‍රතිඵල ප්‍රචාරණය | 73,540,558 | 45,895,044 |
| ප්‍රවර්ධන ප්‍රචාරණය | 468,895,374 | 298,749,100 |
| ප්‍රතිරූප ප්‍රවර්ධන ප්‍රචාරණය | 83,577,467 | 102,682,084 |
| ආයතනික සමාජීය වගකීම | 34,469,002 | - |
| පිටපළාත්වල කෙරෙන දිනුම් ඇදීම් වියදම් | 6,790 | 33,139,335 |
| බාහිර අලෙවි ප්‍රවර්ධන වැය ශේෂය | 6,636,026 | - |
| නියෝජිතයින්ට අලෙවි කුටි හා වෙනත් නඩත්තු වියදම් | 6,562,100 | 9,382,829 |
| ලියාහරින ලද අයකරගත නොහැකි වූ කුටි හා වෙනත් දෑ | 3,754,488 | - |
| විශේෂ වැඩසටහන් හා විශේෂ ලොතරැයි දිනුම් ඇදීම් ත්‍යාග | - | 1,247,980 |
| මහජන සම්බන්ධතා වියදම් | 3,020,371 | 1,586,502 |
| **එකතුව** | **1,013,545,562** | **753,535,738** |

| සටහන් අංක 06-03<br>සන්නිවේදන වියදම් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---:|---:|
| තැපැල් හා විදුලි | 188,043 | 151,092 |
| දුරකථන ෆැක්ස් හා අන්තර්ජාල | 16,635,496 | 14,735,216 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 11,122,526 | 7,619,957 |
| පුවත්පත් දැන්වීම් | 953,161 | 704,598 |
| **එකතුව** | **28,899,226** | **23,210,863** |

| සටහන් අංක 07<br>පරිපාලන වියදම් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---:|---:|
| සේවක වියදම් | 380,279,707 | 320,462,652 |
| ආයතනික වියදම් | 141,013,324 | 142,489,474 |
| වෙනත් පරිපාලන වියදම් | 172,156,440 | 139,425,365 |
| **එකතුව** | **693,449,471** | **602,377,490** |

| සටහන් අංක 08<br>මූල්‍ය පිරිවැය | 2016<br>රු. | 2015<br>රු. |
|---|---:|---:|
| බැංකු ගාස්තු | 40,212,740 | 36,563,614 |
| **එකතුව** | **40,212,740** | **36,563,614** |

| සටහන් අංක 09 | 2016<br>රු. | 2015<br>රු. |
|---|---:|---:|
| වර්තමාන ආදායම් බදු | 334,771,948 | 588,706,122 |
| ලාභාංශ මත බදු | 140,529,430 | 80,523,786 |
| **වර්තමාන වර්ෂය සදහා ආදායම් බදු** | **475,301,378** | **669,229,908** |
| විලම්භිත බදු | 6,826,859 | 555,321 |
| **එකතුව** | **482,128,237** | **669,785,229** |

සටහන් අංක - 10 - දේපල යන්ත්‍ර හා උපකරණ - සින්නක්කර දේපල

| | ඉඩම් රු. | ගොඩනැගිලි රු. | මෝටර් රථ රු. | පරිගණක හා උපාංග රු. | පරිගණක මෘදුකාංග රු. | කාර්යාල උපකරණ රු. | දිනුම් ඇදීම් යන්ත්‍ර රු. | ලී බඩු හා සවිකිරීම් රු. | 2016 එකතුව රු. | 2015 එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 500,000,000 | 22,140,000 | 196,577,529 | 102,387,999 | 20,927,615 | 43,103,139 | 152,979,391 | 24,139,158 | 1,062,254,833 | 919,627,149 |
| වර්ෂය තුල එකතුකිරීම් | - | - | 33,320,180 | 10,780,918 | 1,026,600 | 4,686,377 | 6,185,000 | 3,602,805 | 59,601,880 | 163,574,915 |
| වර්ෂය තුල විකුණුම් | - | - | (3,860,000) | (1,267,758) | - | (1,082,240) | - | (271,307) | (6,481,305) | (4,558,438) |
| වර්ෂය තුල මාරු කිරීම් | - | - | - | (900,800) | - | (497,240) | - | (367,373) | (1,765,413) | (815,317) |
| | 500,000,000 | 22,140,000 | 226,037,709 | 111,000,358 | 21,954,215 | 46,210,036 | 159,164,391 | 27,103,283 | 1,113,609,994 | 1,077,828,309 |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | - | - | - | - | - | - | - | - | (64,025,552) |
| ප්‍රත්‍යාගණන ලාභ | - | - | - | - | - | - | - | - | - | 48,452,076 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 500,000,000 | 22,140,000 | 226,037,709 | 111,000,358 | 21,954,215 | 46,210,036 | 159,164,391 | 27,103,283 | 1,113,609,994 | 1,062,254,833 |
| **ක්ෂය සඳහා ප්‍රතිපාදන** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | - | 1,755,000 | 80,682,646 | 44,884,118 | 17,966,357 | 20,304,039 | 27,908,059 | 4,631,168 | 198,131,387 | 157,229,422 |
| වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන | - | 1,107,000 | 54,979,531 | 24,460,579 | 1,741,781 | 7,351,363 | 31,338,854 | 2,497,597 | 123,476,705 | 108,789,706 |
| විකුණුම් සඳහා ක්ෂය ප්‍රතිපාදන | - | - | (1,673,334) | (799,364) | - | (484,755) | - | (108,683) | (3,066,136) | (3,695,595) |
| වර්ෂය තුල මාරු කිරීම් | - | - | - | (518,879) | - | (344,195) | - | (172,616) | (1,035,690) | (166,595) |
| | - | 2,862,000 | 133,988,843 | 68,026,454 | 19,708,138 | 26,826,452 | 59,246,913 | 6,847,466 | 317,506,266 | 262,156,938 |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | - | | | - | - | - | | | (64,025,552) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | - | 2,862,000 | 133,988,843 | 68,026,454 | 19,708,138 | 26,826,452 | 59,246,913 | 6,847,466 | 317,506,266 | 198,131,386 |
| **2016.12.31 දිනට ලියා හැරී අගය** | 500,000,000 | 19,278,000 | 92,048,866 | 42,973,905 | 2,246,077 | 19,383,584 | 99,917,478 | 20,255,817 | 796,103,728 | - |
| **2015.12.31 දිනට ලියා හැරී අගය** | 500,000,000 | 20,385,000 | 71,852,293 | 41,446,008 | 2,961,258 | 19,458,486 | 125,071,332 | 18,923,517 | - | 864,123,447 |
| ක්ෂය අනුපාත | - | 05% | 25% | 25% | 25% | 20% | 20% | 10% | | |

ඉඩම - වොක්ෂෝල් වීදිය

ගොඩනැගිල්ල- නාරාහේන්පිට සභාපතිගේ බංගලාව සහ වොක්ෂෝල් ගොඩනැගිල්ල

සටහන් අංක 11 - ආයෝජන දේපල

සංචාරක බංගලා - අනුරාධපුර සහ මන්නාරම

| **කුලි සින්නක්කර ගොඩනැගිලි පිරිවැය** | **2016** රු. | **2015** රු. |
|---|---:|---:|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 50,530,000 | 50,530,000 |
| වර්ෂය තුල එකතුකිරීම් | - | - |
| දේපල යන්ත්‍ර හා උපකරණවලින් මාරු කිරීම් | - | - |
| | 50,530,000 | 50,530,000 |
| සමච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | - |
| නැවත ප්‍රත්‍යාගණනයේ පාඩු - මන්නාරම සංචාරක බංගලාව | - | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **50,530,000** | **50,530,000** |
| | | |
| **ක්ෂය සදහා ප්‍රතිපාදන** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 13,065,978 | 6,532,989 |
| වර්ෂය සදහා ක්‍රම ක්ෂය | 6,532,989 | 6,532,989 |
| දේපල යන්ත්‍ර හා උපකරණවලින් මාරු කිරීම් | - | - |
| | 19,598,967 | 13,065,978 |
| සමච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 19,598,967 | 13,065,978 |
| | | |
| **2016.12.31 දිනට ලියා හැරී අගය** | **30,931,033** | - |
| | | |
| **2015.12.31 දිනට ලියා හැරී අගය** | - | **37,464,022** |

සටහන් අංක 12 - අස්පෘෂ්‍ය වත්කම්

| **පරිගණක මෘදුකාංග පිරිවැය** | **2016** රු. | **2015** රු. |
|---|---:|---:|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 62,124,550 | 62,124,550 |
| වර්ෂය තුල එකතුකිරීම් | 4,934,366 | - |
| දේපල යන්ත්‍ර හා උපකරණවලින් මාරු කිරීම් | - | - |
| | 67,058,916 | 62,124,550 |
| සමච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | - |
| ප්‍රත්‍යාගණන ලාභ | - | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **67,058,916** | **62,124,550** |
| **ක්ෂය සදහා ප්‍රතිපාදන** | | |
| **වර්ෂය ආරම්භයේ ශේෂය** | 42,292,066 | 28,411,295 |
| වර්ෂය සදහා ක්‍රම ක්ෂය | 12,679,131 | 13,880,771 |
| දේපල යන්ත්‍ර හා උපකරණවලින් මාරු කිරීම් | - | - |
| | 54,971,197 | 42,292,066 |
| **සමච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය** | - | - |
| | | |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **54,971,197** | **42,292,066** |
| **2016.12.31 දිනට ලියා හැරී අගය** | **12,087,719** | |
| **2015.12.31 දිනට ලියා හැරී අගය** | | **19,832,484** |

| සටහන් අංක 13<br>තොග | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| මුද්‍රිත ටිකට්පත් තොග | 5,564,705 | 21,245,169 |
| ත්‍යාග තොග | 74,906,099 | 29,751,855 |
| පාරිභෝජිත තොග | 5,633,655 | 5,800,818 |
| අකර්මණ්‍ය තොග - ජංගම නොවන වත්කම් | 729,722 | 648,722 |
| **එකතුව** | **86,834,181** | **57,446,564** |

| සටහන් අංක 14<br>වෙළඳ ලැබිය යුතු | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ටිකට්පත් /වෙළඳ ණයගැතියෝ | 541,277,567 | 114,901,546 |
| අගරු චෙක්පත් - සෙවණ, සමෘද්ධි | 813,399 | 697,199 |
| | 542,090,966 | 115,598,745 |
| අඩුකළා ;අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන | (18,125,170) | (10,814,029) |
| **එකතුව** | **523,965,796** | **104,784,716** |

| සටහන් අංක 15<br>වෙනත් ජංගම වත්කම් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| වෙනත් ණයගැතියෝ | 14,267,107 | 17,331,048 |
| ලැබිය යුතු ගිණුම් | 19,296,091 | 9,837,192 |
| සේවක ණය | 35,294,329 | 28,056,145 |
| තැන්පතු හා පෙර ගෙවුම් | 21,443,974 | 20,696,334 |
| විලම්බිත ආදායම් හා වියදම් - කලම්බු එයාර්පෝර්ට් සුපර්ඩ්‍රෝ | 15,012,560 | - |
| ඒකාබද්ධ අරමුදලින් අයවිය යුතු ආදායම් බදු | 566,693,693 | 648,627,206 |
| **එකතුව** | **672,007,752** | **724,547,926** |

| සටහන් අංක 16<br>මුදල් හා මුදලට සමාන දෑ | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| අතැති මුදල් හා බැංකු | 241,192,008 | 401,181,429 |
| කෙකාලීන තැන්පතු | 2,527,118,556 | 2,832,657,866 |
| **එකතුව** | **2,768,310,564** | **3,233,839,295** |

| සටහන් අංක 17<br>රඳවාගත් ලාභ | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 438,642,364 | 433,446,392 |
| වර්ෂයට අදාල ලාභ | 414,761,431 | 241,016,039 |
| | 853,403,795 | 674,462,431 |
| අඩුකළා: ගොඩනැගිලි සංචිතයට මාරු කිරීම් | (400,000,000) | (200,000,000) |
| අඩුකළා: ලියා හරින ලද කුලී නැවත ගැනීම්- කලම්බු එයාර්පෝර්ට් සුපර්ඩ්‍රෝ 2008-2015 | 16,000,000 | - |
| අඩුකළා: ලියා හරින ලද 50 වන සංවත්සර වියදම් නැවත ගැනීම් | 48,766,800 | - |
| අඩුකළා: මහාභාණ්ඩාගාරයට කරන ලද විශේෂ ප්‍රතිපාදන | | (50,000,000) |
| එකතු කළා : විනිමය විචලනයේ ප්‍රතිලාභ | (1,522,862) | 12,568,730 |
| එකතු කළා :දේපල යන්ත්‍ර හා උපකරණ විකිණුම් ප්‍රත්‍යාගණන ලාභ මත ගැලපුම් | 5,900,810 | 863,700 |
| එකතු කළා :නිකුත් කරන ලද රන් කාසි ප්‍රත්‍යාගණන ලාභ මත ගැලපුම් | - | 747,503 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **522,548,543** | **438,642,364** |

| සටහන් අංක 18<br>ස්කන්ධ ප්‍රාග්ධනයේ අනිකුත් සංරචක | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| සමුච්චිත භාරකාර අරමුදල | 21,263,101 | 21,263,101 |
| මහා භාණ්ඩාගාර ප්‍රදාන - මෝටර් රථ- නිසාන් සනී එන් 17 | 5,795,000 | - |
| ප්‍රත්‍යාගණන සංචිත | 327,403,731 | 333,304,541 |
| ගොඩනැගිලි සංචිත | 50,000,000 | 200,000,000 |
| ත්‍යාග සංචිත | 946,982,781 | 787,635,872 |
| **එකතුව** | **1,351,444,612** | **1,342,203,514** |

| සටහන් අංක 19<br>විලම්බිත බදු වගකීම් | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 47,425,591 | 46,870,270 |
| සමාලෝචිත වසරේ විලම්බිත බදු ප්‍රතිපාදන | 6,826,859 | 555,321 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **54,252,450** | **47,425,591** |

| සටහන් අංක 20<br>දිගුකාලීන ප්‍රතිපාදන | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 29,270,262 | 29,339,168 |
| ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ආදායම් බදු | - | 566,693,690 |
| **එකතුව** | **29,270,262** | **596,032,858** |

| සටහන් අංක 21<br>වෙළඳ හා වෙනත් ගෙවිය යුතු | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු මුදල් | 306,209,736 | 267,440,560 |
| ලොතරැයි මුදල් අත්තිකාරම් | 88,591,352 | 171,265,310 |
| ත්‍යාග සංචිතයට ගෙවිය යුතු ණය | 60,000,000 | 120,000,000 |
| ත්‍යාග සඳහා ගෙවීම් | 1,260,516,130 | 1,005,001,907 |
| වෙළඳ හා වෙනත් ණය හිමියෝ | 104,285,076 | 186,945,963 |
| උපචිත වියදම් | 391,726,616 | 393,931,647 |
| **එකතුව** | **2,211,328,910** | **2,144,585,387** |

| සටහන් අංක 22<br>සමාලෝචිත වසරේ ගෙවිය යුතු බදු | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ගෙවිය යුතු එ. ව. බදු හා ජා. ගො. බදු | 101,127,564 | 82,796,603 |
| ගෙවිය යුතු ආදායම් බදු | 692,955,038 | 1,017,566,020 |
| **එකතුව** | **794,082,602** | **1,100,362,623** |

# 04 මෙහෙයුම් හා මූල්‍ය විශ්ලේෂණය






දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා

| විස්තරය | 2016 රු.මිලි | 2015 රු.මිලි | වෙනස 2015 වසර සමග සන්සන්දනය % |
|---|---|---|---|
| පිරිවැටුම | 20,170.4 | 17,394.4 | 15.9 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 2,445.5 | 2,130.9 | 14.7 |
| නියෝජිත කොමිස් | 3,771.6 | 3,244.6 | 16.2 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 9,723.4 | 8,367.9 | 16.1 |
| එකතු කළ වටිනාකම් මත බදු | 706.8 | 573.2 | 23.3 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 285.7 | 253.2 | 12.8 |
| වෙනත් ආදායම් | 249.5 | 92.1 | 170.9 |
| වියදම් | 1,979.8 | 1,511.2 | 31.0 |
| බදු පෙර ලාභ | 896.8 | 910.8 | (1.5) |
| වර්ෂය සඳහා ලාභ | 414.7 | 241.0 | 72.0 |
| ආදායම් බදු / | 482.1 | 669.8 | (28.0) |
| මුළු වත්කම් | 4,962.9 | 5,677.4 | (12.5) |
| මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධ ප්‍රාග්ධනය | 1,873.9 | 1,780.8 | 5.2 |
| බදු පෙර ලාභ පිරිවැටුමේ % ලෙස | 4.44% | 5.23% | - |
| බදු පෙර ලාභ මුළු වත්කම්වල %ලෙස | 18.7% | 16.0% | - |
| ද්‍රවශීලතා අනුපාතය | 1.3:1 | 1.2:1 | - |


රජයට කරන ලද දායකත්වය

| මුළු ප්‍රතිපාදන | 2016 රු.මිලි | 2015 රු.මිලි |
|---|---|---|
| සෘජු ප්‍රතිපාදන | | |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 2,445.5 | 2,130.9 |
| මහා භාණ්ඩාගාරයට කරන ලද විශේෂ දායකත්වය | 550.0 | 50.0 |
| | **2,995.5** | **2,180.9** |
| වක්‍ර ප්‍රතිපාදන | | |
| එකතු කළ වටිනාකම් මත බදු | 706.8 | 573.2 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 285.7 | 253.2 |
| ආදායම් බදු / | 482.1 | 669.8 |
| අභිමිකළ ත්‍යාග | 365.3 | 257.7 |
| | 1,839.9 | 1,753.9 |
| **රජයට කරන ලද මුළු ප්‍රතිපාදන** | **4,835.4** | **3,934.9** |
| | | |


## පිරිවැටුම (රු. මිලි)





## ත්‍යාග සඳහා වෙන් කිරීම් (රු. මිලි)




## නියෝජිත කොමිස් (රු. මිලි)





## ඒකාබද්ධ අරමුදලට දායකත්වය (රු .මිලි)





# නිෂ්පාදන කාර්යසාධනය


## මහජන සම්පත

| විස්තරය | 2016 රු. මිලි | 2015 රු. මිලි | 2014 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 5,342.0 | 4,734.0 | 4,330.5 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 2,617.6 | 2,319.6 | 2,121.9 |
| නියෝජිත කොමිස් | 1,001.1 | 887.0 | 809.0 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 881.4 | 781.1 | 714.5 |

















## වාසනා සම්පත

| විස්තරය | 2016 රු. මිලි | 2015 රු. මිලි | 2014 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 1,142.7 | 1,350.0 | 1,410.0 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 537.0 | 634.5 | 663.7 |
| නියෝජිත කොමිස් | 214.0 | 252.9 | 263.4 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 188.5 | 222.7 | 232.6 |
















## ගොවිසෙත

| විස්තරය | 2016 රු. මිලි | 2015 රු. මිලි | 2014 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 4,011.2 | 4,510.7 | 2,552.1 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 1,885.2 | 2,120.0 | 1,199.5 |
| නියෝජිත කොමිස් | 751.7 | 845.4 | 476.9 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 401.1 | 451.0 | 255.2 |

















## සුපිරි වාසනා

| විස්තරය | 2016 රු. මිලි | 2015 රු. මිලි | 2014 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 1,682.7 | 1,747.2 | 1,834.8 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 791.0 | 821.2 | 862.3 |
| නියෝජිත කොමිස් | 315.3 | 327.4 | 342.7 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 168.2 | 174.7 | 183.4 |
















## ජාතික සම්පත

| විස්තරය | 2016 රු. මිලි | 2015 රු. මිලි | 2014 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 1,354.6 | 1,319.3 | 1,248.2 |
| තයාග සඳහා වෙන් කිරීම් | 636.6 | 620.0 | 586.5 |
| නියෝජිත කොමිස් | 253.8 | 247.2 | 233.1 |
| ඒකතාබද්ධ අරමුදලට දායකත්වය | 135.4 | 131.9 | 124.10 |

















## සෙවණ

| විස්තරය | 2016 රු. මිලි | 2015 රු. මිලි | 2014 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 1,474.6 | 943.5 | 1,489.5 |
| තයාග සඳහා වෙන් කිරීම් | 779.0 | 500.0 | 781.8 |
| නියෝජිත කොමිස් | 272.1 | 172.1 | 267.7 |
| ඒකතාබද්ධ අරමුදලට දායකත්වය | 147.4 | 94.3 | 148.9 |



සංඛ්‍යා රුපියල් වලින්

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම** | **6,079,850,149** | **6,832,519,239** | **8,580,538,712** | **8,862,869,826** | **10,092,330,623** | **12,004,268,616** | **14,537,362,545** | **15,153,133,820** | **17,394,463,681** | **20,170,417,750** |
| | | | | | | | | | | |
| අඩුකළා වක්‍ර බදු | | | | | | | | | | |
| එකතු කළ වටිනාකම් මත බදු | 280,749,153 | 298,114,596 | 317,545,635 | 315,515,516 | 365,159,981 | 428,810,159 | 507,792,059 | 540,502,194 | 573,252,862 | 706,868,280 |
| ජාතිය ගොඩනැගීමේ බදු | - | - | 139,681,053 | 186,375,756 | 141,767,911 | 168,895,230 | 203,546,556 | 211,761,787 | 253,267,754 | 285,776,997 |
| එ .ව. මත බදු හා ජා. ගො. බදු පසු ශුද්ධ ලාභය | 5,799,100,996 | 6,534,404,643 | 8,123,312,024 | 8,360,978,554 | 9,585,402,731 | 11,406,563,227 | 13,826,023,930 | 14,400,869,839 | 16,567,943,065 | 19,177,772,473 |
| | | | | | | | | | | |
| අඩුකළා විකුණුම් පිරිවැය | | | | | | | | | | |
| ටිකට්පත් මුද්‍රණ ගාස්තු | 315,362,150 | 289,619,018 | 271,803,581 | 293,504,383 | 376,528,826 | 393,049,086 | 459,877,814 | 474,762,687 | 494,409,498 | 609,845,633 |
| නියෝජිත කොමිස් | 971,932,383 | 1,163,307,511 | 1,585,329,388 | 1,638,501,705 | 1,874,354,373 | 2,232,580,487 | 2,701,581,629 | 2,818,333,219 | 3,244,659,091 | 3,771,736,589 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 2,944,926,273 | 3,373,592,920 | 4,246,564,845 | 4,295,786,207 | 4,857,951,333 | 5,787,269,625 | 7,083,652,537 | 7,311,136,590 | 8,367,984,720 | 9,723,421,286 |
| විකුණුම් මත ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 767,590,790 | 898,282,571 | 1,136,298,465 | 1,173,460,051 | 1,345,046,907 | 1,574,149,137 | 1,753,135,197 | 1,888,455,133 | 2,130,953,970 | 2,445,594,544 |
| | 4,999,811,596 | 5,724,802,020 | 7,239,996,279 | 7,401,252,346 | 8,453,881,439 | 9,987,048,335 | 11,998,247,177 | 12,492,687,629 | 14,238,007,279 | 16,550,598,052 |
| **දළ ලාභය** | **799,289,400** | **809,602,623** | **883,315,745** | **959,726,208** | **1,131,521,292** | **1,419,514,892** | **1,827,776,753** | **1,908,182,210** | **2,329,935,786** | **2,627,174,421** |
| | | | | | | | | | | |
| එකතුකළා : වෙනත් ආදායම් | 191,205,560 | 257,996,742 | 340,680,571 | 212,424,233 | 178,866,137 | 275,197,318 | 220,209,583 | 88,823,238 | 92,197,950 | 249,546,105 |
| | 990,494,960 | 1,067,599,365 | 1,223,996,316 | 1,172,150,441 | 1,310,387,429 | 1,694,712,210 | 2,047,986,336 | 1,997,005,448 | 2,422,133,736 | 2,876,720,526 |
| අඩු කළා වියදම් | | | | | | | | | | |
| අලෙවි විකුණුම් හා බෙදාහැරීම් වියදම් | 488,011,003 | 557,650,809 | 583,815,438 | 500,848,485 | 531,801,210 | 674,909,121 | 1,069,000,355 | 1,284,599,303 | 872,391,364 | 1,246,168,647 |
| පරිපාලන වියදම් | 269,993,917 | 311,203,508 | 365,193,951 | 362,334,768 | 356,796,344 | 411,913,602 | 465,114,112 | 573,472,839 | 602,377,490 | 693,449,471 |
| මූල්‍ය වියදම් | 21,746,255 | 25,717,200 | 30,483,249 | 29,936,142 | 25,807,844 | 26,094,291 | 37,190,847 | 29,743,395 | 36,563,614 | 40,212,740 |
| | 779,751,175 | 894,571,517 | 979,492,638 | 893,119,395 | 914,405,398 | 1,112,917,014 | 1,571,305,314 | 1,887,815,537 | 1,511,332,468 | 1,979,830,858 |
| **බදු පෙර ලාභ** | **210,743,785** | **173,027,848** | **244,503,678** | **279,031,046** | **395,982,031** | **581,795,197** | **476,681,023** | **109,189,911** | **910,801,268** | **896,889,668** |
| අඩුකළා : ආදායම් බදු වියදම් | 140,065,071 | 129,986,050 | 198,991,306 | 231,393,156 | 186,878,002 | 269,604,238 | 610,087,951 | 117,853,496 | 669,785,229 | 482,128,237 |
| **වර්ෂය සඳහා ලාභ / (පාඩු)** | **70,678,714** | **43,041,798** | **45,512,372** | **47,637,890** | **209,104,029** | **312,190,959** | **(133,406,928)** | **(8,663,585)** | **241,016,039** | **414,761,431** |
| | | | | | | | | | | |
| රජය සඳහා සෘජු හා වක්‍ර දායකත්වය | | | | | | | | | | |
| විකුණුම් මත ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 767,590,790 | 898,282,571 | 1,136,298,465 | 1,173,460,051 | 1,345,046,907 | 1,574,149,137 | 1,753,135,197 | 1,888,455,133 | 2,130,953,970 | 2,445,594,544 |
| මහාභාණ්ඩාගාරයට කරන ලද විශේෂ ප්‍රතිපාදන | - | - | - | 16,000,000 | - | 702,000,000 | 500,000,000 | - | 50,000,000 | 550,000,000 |
| අභිමිකළ ත්‍යාගවලින් ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 147,893,404 | 127,081,500 | 194,511,177 | 182,465,862 | 180,473,400 | 197,806,370 | 247,738,070 | 246,424,920 | 257,691,450 | 365,393,530 |
| වක්‍ර දායකත්වය - බදු | 420,814,224 | 428,100,646 | 656,217,994 | 733,284,427 | 693,805,894 | 867,309,627 | 1,321,426,566 | 870,117,477 | 1,496,305,845 | 1,474,773,514 |
| **එකතුව** | **1,336,298,418** | **1,453,464,717** | **1,987,027,636** | **2,105,210,340** | **2,219,326,201** | **3,341,265,134** | **3,822,299,833** | **3,004,997,530** | **3,934,951,265** | **4,835,761,588** |
| **කාර්යසාධන නිර්නායක** | | | | | | | | | | |
| දළ ලාභය අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 13.15% | 11.85% | 10.29% | 10.83% | 11.21% | 11.83% | 12.57% | 12.59% | 13.39% | 13.02% |
| බදු පෙර ලාභ අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 3.47% | 2.53% | 2.85% | 3.15% | 3.92% | 4.85% | 3.28% | 0.72% | 5.24% | 4.45% |
| වියදම් අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 12.83% | 13.09% | 11.42% | 10.08% | 9.06% | 9.27% | 10.81% | 12.46% | 8.69% | 9.82% |
| වර්ෂය සඳහා ලාභ (පාඩු) අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 1.16% | 0.63% | 0.53% | 0.54% | 2.07% | 2.60% | -0.9% | -0.1% | 1.4% | 2.1% |
| විකුණුම් මත ඒකාබද්ධ අරමුදලට දායකත්වය අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 12.63% | 13.15% | 13.24% | 13.24% | 13.33% | 13.11% | 12.06% | 12.46% | 12.25% | 12.12% |
| රජයට මුළු දායකත්වය අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 21.98% | 21.27% | 23.16% | 23.75% | 21.99% | 27.83% | 26.29% | 19.83% | 22.62% | 23.97% |
| අලෙවි පිරිවැටුමේ වර්ධන වේගය | ( 5.88)% | 12.37% | 25.58% | 3.29% | 13.87% | 18.94% | 21.10% | 4.24% | 14.79% | 15.96% |

2013 වසරට අනුව දස වසරක සාරාංශයේ සංඛ්‍යා ප්‍රතිගණනය කර ඇත. ආදායම් බදු ගණනයේදී අනුදත් නොවූ වියදමක් ලෙස සලකන ලද ඒකාබද්ධ අරමුදලට 2007 වසරේ සිට ගෙවන ලද මුදල සඳහා 40 ක අතිරේක ආදායම් බදු ගෙවීම් සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රු. 2,780,247,776 ක මුදලක් 2013 ජනවාරි සිට 2017 අගෝස්තු දක්වා ඒකාබද්ධ අරමුදලට අදාළ ගෙවීම්වලින් නැවත අයකර ගැනීමට නියමිතය. කෙසේවෙතත් 2013 වසරේ සිට ඒකාබද්ධ අරමුදලට ගෙවීම් නැවතත් ආදායම් බදු ගණනයේදී පෙර කී පරිදිම අනුදත් වියදමක් ලෙස සැලකීමට අවසර ලැබිණි.